වසර 2500 පසු
මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.

සත්‍ය ධර්මය අවදි විය

# උපක්ලේශ සූත්‍රය

සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.

## සූත්‍ර දේශනා

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com

zoom දේශනාව youtube ශ්‍රවණය කිරීමට
https://youtube.com/@Zoom-up2ik

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

රාත්‍රී සාකච්ඡා zoom ශ්‍රවණය කිරීමට
https://us06web.zoom.us/j/87341245000?pwd=dFFrSSt4SVBQWFpzeXppUy-tIZFZWUT09

youtube ශ්‍රවණය කිරීමට
https://youtube.com/@buddothpado

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothp?mibextid=ZbWKwL

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ
විමසීම් Email: thanujafernando1975@gmail.com
Tel 070 351 8747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ

පරිගණක මුද්‍රණ සැකසුම **වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය **රුවන් පහරුව**
14/10, පළමු පටුමග, අපේක්ෂා රෝහල පාර, මහරගම.
දුරකථන/ෆැක්ස් : 0112 2840738
Email: ruwanpaha@gmail.com

# නිවන් මඟ යායුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්විදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිලිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ) සත්‍යඤාණ අවබෝධය
2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)

    2.1 කෘත්‍යඤාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම

    2.2 කෘතක්ඤාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

1. **පූර්ව භාග ප්‍රතිපදාව (සත්‍යඤාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කල්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී**

    බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඤාණය = සත්‍යඤ්ඤාණය)

    - සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
    - සිත මායාවක් බව අවබෝධකරගැනීම සිත යනු අරමුණම බව දැනගැනීම
    - අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
    - ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම අරමුණම ආත්මය බව දැකීම
    - ශුන්‍යතා අවබෝධය
    - ත්‍රිවිද්‍යා දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඤාණය, චුතුපපාත ඤාණය, ආසවක්‍යාඤාණය)
      (සිත = අරමුණ = ආත්මය)

    1.1 කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසාදැන ගැනීම

    1.2 නැවත නැවත සද්ධර්මශ්‍රවනය

    1.3 යෝනිසෝමනසිකාරය

    1.4 ධම්මානුධම්ම ප්‍රතිපදාව

    **ශ්‍රාවකයා උට්ඨාන වීර්යෙන් කලයුතු දෙයින් වැඩි ප්‍ර තිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.**

**බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල් කැටයක පමණ දෙයකි.**

- සක්කාය දිට්ඨි ප්‍රහානය මෙතැනදී සිදුවේ.
- ශ්‍රාවකයා ආර්‍ය භූමියට පිවිසේ.

## 2. අපරභාග ප්‍රතිපදාව

2.1. **කෘත්‍යඥානය** - අසාදෑනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම - (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

2.1.1. **අරමුණෙහි සත්‍ය දැකීම**; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම(යථාභූත ඥානය = යෝනිසෝ මනසිකාරය)

2.1.2. **අරමුණෙහි සත්‍ය දැක මිදීම**

අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම

ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම

සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

2.1.3. **ත්‍රි විද්‍යා ප්‍රායෝගිකව අත්දැකීම** (පුබ්බේනිවාසානුස්සති ඥානය, චුතූපපාත ඥානය, ආසවක්‍ෂය ඤ්ඤානය)

2.2. **කෘතඤ්ඤානය (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොභාදහමේ අනාවරනයක් පමනි. ඥානයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැගලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති**

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශුන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිර්ජීවෝ ශුන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ත බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක් නැති තැන චෙතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශූන්‍යත, අප්ප්‍රනිත

චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිස්ජීවෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පහං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤාස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජන්ති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය**

## පුණ්‍යානුමෝදනාව

මේ උතුම් ධර්ම දානය වෙනුවෙන්
උදව් උපකාර කළ සියලු දෙනාටම,
ධර්මයට ලැදි ඔබ සැමට
මෙම උතුම් කුසලය
මේ ඝෝර කටුක භයංකර සසරින්
මිදීම පිණිස උපනිශ්‍රය වේවා !

# පිදුම



කතරක අතරමංවී සිටි සියලුම
සත්වයන්ට අමා පැන් බිඳක් ලැබුණි.
මේ අමා පැන් බිඳ නිවරදි ව පානය
කර අපමණ දුක්බිත වූ
මේ භයංකර ඝෝර කටුක සසර
නිමකර ගැනීමට භාග්‍ය උදාවී ඇත.
ඒ අමා පැන් බිඳුව බිම නොහෙළා
ඉතාම ප්‍රවේසමෙන් ප්‍රඥා ඇස දල්වා
ගෙන පානය කර, මේ ඇසෙන පරම
නිර්මල වු සත්‍යයට ඔබ දෙසවන්
යොමු කර, බුදුන් වහන්සේ පෙන්වූ
චතුරාර්ය සත්‍යය, පටිච්චිසමුප්පාදය,
සප්ත බොජ්ජංග නිවැරදිව
ගලපාගනිමින්, සද්ධර්ම
ශ්‍රවණය තුළින්ම ඔබට
නිවන උපනිශ්‍රය වේවා !
ප්‍රඥා ඇස පහළ වේවා !
නිවනින්ම නිවී සැනසෙත්වා !

# පටුන

උපක්ලේශ සූත්‍රය - 01 11

උපක්ලේශ සූත්‍රය - 02 38

උපක්ලේශ සූත්‍රය - 03 69

# උපක්ලේශ සූත්‍රය - 01

## "දස්සනංච රූපානං අලමරියඤාණ දර්ශනය"

මජ්ජිම නිකායේ තුන්වන කාණ්ඩයේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ දොළොස් වන ග්‍රන්ථය, උපක්ලේස සූත්‍රය. භාග්‍යවතුන් වහන්සේ කොසබෑනුවර ඝෝෂිතාරාමයේ වැඩ වසන භික්ෂුන් වහන්සේලා වෙත එළඹ සිටි සේක. එම භික්ෂුන්වහන්සේලා අතර පැවති වාද - විවාද, කළහ විග්‍රහ නොකරන ලෙස අවවාද කළහ. "**අලං භික්ඛවේ මා භණ්ඩනං, මා කලහං, මා විග්ගහං මා විවාදන්ති**" මෙසේ කළහා විවාද නොකරන ලෙස පැවසුහ. එහිදී ඒ භික්ෂුන් වහන්සේලා

"ආගමේතු භන්තේ, භගවා ධම්මස්සාමි අප්පෝ සුඛෝ භන්තේ භගවා දිට්ඨි ධම්ම සුඛ විහාරං අනුයුත්තෝ විහරතු" . බුදුරජානන් වහන්සේ දිට්ඨ ධම්ම සුඛවිහරණයෙන් වැඩ වසත්වායි පවසනවා, කළහ විග්‍රහ විවාදයෙන් අපේ ගැටලුව අපි විසඳ ගන්නම් යැයි භික්ෂුන් පවසනවා. එහිදී බුදුන්වහන්සේ තෙවරක්ම අවවාද කළත් ඒ භික්ෂුන් එම මතයේම සිටි නිසා එයින් නික්මී පිණ්ඩපාතයේ වඩිනව. පසුව බුදුන්වහන්සේ කොසබෑනුවර පිණ්ඩපාතයෙන් පසු අනුරුද්ධ, නන්දිය, කිම්බිල, භගු ස්වාමීන් වහන්සේලා වැඩ සිටින ආරාමයට වඩිනව.

භාග්‍යවතුන් වහන්සේ, අනුරුද්ධ තෙරුන් වහන්සේගෙන් විමසනව වැදගත් කාරණාවක් එතනදී කියවෙනවා සාධු සාධු " අනුරුද්ධෝ අත්ථිපනවෝ අනුරුද්ධෝ ඒවං අප්පමත්තානං ආතාපීනං පහිතත්තානං විහරත්තානං උත්තරී මනුස්ස ධම්මා අලමරියඤාණ දස්සන විසේසෝ අධිගතෝ ඵාසුවිහාරෝති මේ අලමරිය ඤාණදස්සනයෙන් අධිගතව ඵාසුවිහරණයෙන් වැඩ වසත්ද? මෙතනදී අනුරුද්ධ ස්වාමීන් වහන්සේගෙන් විමසනව කෙළෙස් තවන වෙර ඇතිව අප්‍රමාදීව උත්තරී මනුස්ස ධර්මයෙන් යුතුව ආර්යභාවයෙන් ඥාණදර්ශන විශේෂයෙන් අධිගතව ඵාසු විහරණයක් ඇත්ද?.

මෙතනදී මේ අළමරියඤාණ දර්ශණය කියන්නේ මොකක්ද? කෙළෙස් තවන වෙර ඇතිව අප්‍රමාදීව උත්තරීමනුස්ස ධම්මං විසේසෝ අධිගතෝ කියන එක පොත්පත් වලින් සොයන්න පුලුවන් එකක් නොවේ. ඔබ ධර්මය තුළ ප්‍රායෝගික වෙනකොට දකින්න ලැබෙන කාරණයක්. ඒ කියන්නේ සිතට එන අරමුණේ සත්‍ය දකින තැන, අපි මේ හිතන දෙයක් බාහිරේ නැති බව සිතෙත් එහෙම දෙයක් නෑ, බාහිරට පතිත වෙන්නෙත් නෑ, "**අප්පතිට්ඨිත**" අපි කියනව මේස, පොත්, ඇදන් ඒව බාහිර හමුවෙන්නෙ නෑ බාහිර එහෙම දෙයක් නැති බව දකිනවා. මෙතන මේ ඤාණ දර්ශනයයි දර්ශන විසුද්ධිය. ඒ අපි කථාකරන "**අළමරිය ඥාණ දස්සන විසේසෝ අධිගතෝ.**"

අධිගතව වාසය කරනව කියන එක මේ "**අලමරිය ඥාණ දර්ශනය**" කියන්නේ මොකක්ද? බොහෝ අයට අවබෝධයක් නෑ. නමුත් පොත පතේ මොකුත් තිබුණොත් ඔබ මේ ධර්මය තුළ ප්‍රායෝගික වෙන විට ඔබට දැනෙනවිට අධිගතව වාසය කරනව කියන්නේ අළමරිය ඥාන දර්ශනය කියල කියන්නේ

මේ අරමුණේ සත්‍ය දකින විට බාහිර හමුවෙන්නේ නෑ සිතෙත් හමුවෙන්නේ නෑ.

නමුත් වෙනද විදිහටම ඇසෙනව, වෙනද විදිහටම පේනව, පේන්නේ නැති වෙන්නේ නෑ, ඇසීම නැති වෙන්නේ නෑ, වෙනද විදිහටම දැනෙනව, දැනෙන් නැති වෙන්නේ නෑ අන්ධ වෙලා නෑ, බීරි වෙලා නෑ. නමුත් ඒ වෙනද විදිහටම ඇසෙනව පෙනෙනව වුණාට ඒ පේන දේට එහා ගිය අවධියක් ඇති වෙනව, ඒ දැනෙන දේට එහා ගිය අවධියක් මතු වෙනව, ඒ ඇත්තටම කොහොමද සිද්ධ වෙන්නේ මේ සත්‍ය දකිනව නම් බාහිර, ඒ දේ මේ මොහොතේ හමුවෙන්නේ නෑ. කණ්නාඩියේ දෙයක් නැති බවට ඇති වෙන අවබෝධය හා සමානයි. සත්‍ය දකිනව, දර්ශනයට පත්වෙනව, අති ගැඹුරුයි, අති සියුම්, අද සමාජයේ ගොඩක් ඉස්මතු වෙලා නෑ, වැහිල තියෙන්නේ බාහිරය ඇත්ත කරගෙන තමයි හැම දෙනෙක් ම මේ නිවන් මග හොයන්නේ. නමුත් "**විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්සානං**" **කායේ කායානු පස්සී විහරතී වේදනාසු වේදනානු පස්සී විහරතී චිත්තේ චිත්තානු පස්සී විහරතී ධම්මේසු ධම්මානු පස්සී විහරති විනෙය්‍ය ලෝකේ අභිජ්ඣා දෝමනස්නානං**" මේ ලෝකේ ඇත්තක් නොවන බව දකින්නත් සතර සතිපට්ඨානය වඩන්න. එහෙනම් මේ ලෝකය සත්‍යක් නොවන බව දකින විට එය අවබෝධයක් ඇති වෙනව මේ හිතන දේවල් කොහෙවත් නැති බව, ඒ අවබෝධය තුළ මිදීමකට ලක්වෙනව බැස ගන්නේ නෑ. "**විඤ්ඤාණං අනිදස්සනං**" කියන තැනට එනව මේ බැස ගන්නා අරමුණේ සත්‍ය දකිනවිට ඒ අරමුණ පතිත වෙන්නේ නෑ, කොහෙවත් බැස ගන්නේ නෑ "**අජ්කෙධෝසාය තිට්ඨති**" කියන කාරණය සිද්ධ වෙන්නේ නෑ එහෙම වුනොත් රූපයේ "**නන්දිය**" ඇති

වෙන්නේ නෑ, තණ්හාව ඇති වෙන්නේ නෑ, මිදීමක් සිද්ධ වෙනව, මෙන්න මේ එන එන අරමුණේ සත්‍ය දැකල මිදෙන එක. ඒ පුහුණුව මෙයයි අළමරිය ඥාණ දර්ශනය කියන්නේ අපි හිතමු බාහිර අරමුණේ පොත දුව මේස ඇදන් ඒවායේ වටිනාකමක් නැති අවධියක් ස්වභාවයක් එනව, එතකොට මිදීමක් ඇති වෙනව, පේන දේ පේනව නමුත් ඒකේ අගයක් නැති වෙනව වටිනාකමක් දැනෙන් නෑ. ඒක තුළ දෙයක් වගේ දැනෙන්නේ නෑ. අන්න මිදීම එයයි **"අලමරියඤාණ දස්සනය"** කියන්නේ මේක වචනයෙන් කියන්න බැරි තරම් බව ඔබ අත් දකින්නම ඕන. **එයයි ඇත්තටම දර්ශන සමාධිය, එය අනිමිත්ත සමාධිය දෙයක් හමුනොවන තැන එය ශූන්‍යතයි,අප්පනිහිතයි අනිමිත්තයි.** අනිමිත්තයි කියන්නේ දෙයක් නැතිව නෙමෙයි මේ ශූන්‍යතාවය තුළ දෙයක් නෑ නෙමේ සියල්ලම තියෙනවා හැබැයි ශූන්‍යයි. මේක ඉතාම ගැඹුරු කාරණයක්. බොළද මනසට මෙය හමුවෙන්නේ නෑ නමුත් මේ අවබෝධය තුළ , මිදීම තුළ මේ අවධිමත් ස්වභාවය දැනෙන්න ගන්නව ඒක ප්‍රායෝගිකව ඔබ අත්දකින්න ඕන කාරණයක් ඔබට සාන්දිට්ඨික වෙනව මේ දහම.

ඔබ මේ සත්‍ය දර්ශණයට පත්වෙනව නම් විතරයි ඔබගේ අභ්‍යන්තරයේ ඔබගේ කෙලෙස් සන්සිදෙනව ඔබට දැනෙන්න ගන්නේ ඒකත් සාන්දිට්ඨිකයි එහෙම වුනොත් රාග, ද්වේශ, මෝහ කෙලෙස් සන්සිදෙනව සියලු කෙලෙස් සන්සිදෙනව ඔව් කෙලෙස් සන්සිදෙනව හැබැයි ඒ දර්ශණ ඤාණය ඇති අයට පමණයි. දන්නහුටයි, දැනගත්තහුටයි මේ ධර්මය තියෙන්නේ, සත්‍ය ඥාණය ඇති අයටයි කෘත්‍ය ඥාණය තියෙන්නේ ඒ පෙර නොඇසුවිරූ දහම අතිවිශිෂ්ඨයි. **"හේතුං පටිච්ච සම්භූතා හේතු භංගා නිරුජ්ඣතී"** කියන්නේ හමුවෙන දෙයක් නෙමෙයි. හමුවන්න දෙයක් කියල දෙයක්

හමුවෙන්නේ නෑ. එයයි මිදිම **මජ්ජේ ඤාණං** කියන තැන ඇත-නැත අන්ත වලින් මිදුන දහමක් මේ දේශනා කරන්නේ ඉතාම වටිනා තැනක් ඒ දර්ශණයට පත්වෙනව කියන තැන මේ උපක්ලේස සූත්‍රය තුළ අනුරුද්ධ ස්වාමින්වහන්සේ කියන කාරණය ඉතාම වැදගත් කාරණයක් බුදුන්වහන්සේ මේ අළමරියඤාණ දර්ශණයෙන් අධිගතව වාසය කරනවද කියල කියන එක, අනුරුද්ධ ස්වාමීන් වහන්සේගේ පිළිතුර **"ඉධමයනං භන්තේ අප්පමත්තා අතාපිනෝ පහීයන්තා විහරත්තා ඕභාස නෙව සඤ්ජානාතා දස්සනංච රූපානං ඕභාස විහරත්තේය දස්සනංච රූපානං නපටිච්චාමි."**

එතකොට කියන්නේ වහන්ස, අපි නෙපමාව කෙලෙස් තවන වෙර ඇතිව කාය ජීවිත නිරපේෂව වසන්නෙමු. ඕභාසය හා රූප දර්ශණය හඳුනන්නෙමු. එතකොට මේ තෙරුන් වහන්සෙ ප්‍රකාශ කරනව කෙලෙස් තවන වෙර ඇතිව නිරපේක්ෂව වසනව කියල. **"ආතාපිනෝ පහීයන්තා විහරති" ඕභාස රතී විහරත්තා සංඤ්ජානං"** මේ ඉතාම වැදගත් ඕභාසය හා රූප දර්ශණය හඳුනම් කියලා පැහැදිලි කරන්නේ **"දස්සනංච රූපතං"** ඒ හොඳටම පැහැදිලියි **"ඕභාසානංච සඤ්ඤාණං"** දර්ශණය ඒ රූපයේ දර්ශණය දකින්නේ රූපානං කියපුවාම රසාරම්මණය දකින්නේ ශබ්ද රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්බ රූප සියල්ලම ආරම්මණ, සියල්ලම රූපමයි, රූපානං කීවේ ඒ රූපයේ **"දස්සනංච"**

ඒ දර්ශණය කීවේ කුමක්ද? මේ ඇහෙනව, පේනව, දැනෙනව කියන්නේ ඒ ආරම්මණය හැබැයි ඒ ආරම්මණයේ රූපයට එහා ගිය අවධියක් තියෙනවා. ඒ අවධිය තමයි ප්‍රඥාලෝකය. ඒ අවධිය තමයි ප්‍රඥාලෝකය, අවධිය, විද්‍යා උදපාදි, චක්ඛුං උදපාදී, ආලෝකෝ උදපාදී කියල

කියන්නේ අන්න ඒ ප්‍රඥා ලෝකය. අන්න ඒ ඥාණා ලෝකය. ඒ දර්ශණය දකින කෙනාටයි ඒ ඕභාසය ඇති වෙන්නේ, ඒ ඕභාසයේ ආලෝකය ප්‍රඥා ලෝකයයි. අවිද්‍යා ප්‍රහාණ වීමයි. බාහිර ඇත්ත කරගත්ත තැන නෙමේ මෙය හමුවෙන්නේ බාහිර දෙයක් හමුවෙන්නේ නැති බව දැන ගත්ත තැනයි. මුල මැද අග හොඳින් ගැලපෙන ඒ නිර්මල පාරිශුද්ධ ධර්මයයි මේ ඔබ අහන්නේ, මේ මොහොතේ, මේ දෙරණේ, මේ දිවයිනේ මේවා දේශනා කරන අය හරි දුර්ලභයි. බොහෝ අය දේශනා කරන්නේ ප්‍රසිද්ධ වෙන්න බොහෝ අය දේශනා කරන්නේ බාහිර ඇත්ත කරගත්ත ධර්මයක්, බුදුන්වහන්සේගේ දේශනා එවැනි ධර්මයක් නෙමෙයි. අපි හිතන දේවල් කොහෙවත් නෑ, **"දෙයක් කියලා"** දෙයක්වත් හමුවෙන්නේ නැති දහමක් මෙතන උපදින සමාධිය අනිමිත්ත සමාධියක් මේ ඥාන විශුද්ධිය කියන්නේ කුමක්ද?. ඒ අළමරිය ඥාන දර්ශනය කියන්නේ කුමක්ද?.

ඒ අනිමිත්ත සමාධියයි, ඒ නිමිත්ත ප්‍රකට වෙන්නේ නැති සමාධියයි හැබැයි වෙනද විදිහටම පේනව කියන කොට වෙනද විදිහටම ඇසෙනව, දැනෙනව කියන කොට ඔබ හිතන නිමිත්ත නෙමෙයි මේ කියන්නේ ඉතාම ගැඹුරු කාරණයක් ඇත්තටම මේ ධර්මය අවබෝධ තුළින් මිදිල ඉන්න. එතන බාහිරය ප්‍රකට වෙන්නැති තැනත් මිදීමක්, මේ අළමරිය ඥාන දර්ශනය කියල කියන්නේ අද මේ සමාජය තුළ **"බුද්ධෝත්පාද"** නාලිකාව තුළ මේ දර්ශනය දකින අය මේ අත්දැකීම් ලබනව. **"අළමරියඥාන දර්ශනය විසේසෝ අධිගතෝ"** අධිගතව වාසය කරනව, ඔවුන් ගිහියන් වෙන්න පුලුවන්, පැවිද්දන් වෙන්න පුලුවන් කුමන වතේද වැඩ ඉන්නේ කියන එක වැදගත් නෑ. පිරිසිදු ශ්‍රී සද්ධර්මය දැකල ඒ දර්ශණයට පත්වෙලා ඉන්න එකයි වැදගත් වෙන්නෙ. ඒ

දර්ශන ඥානය තුළ ඔවුන් එදිනෙදා සත්‍ය දැකල මිදෙන තැන ඒ "**අනිමිත්ත, ශූන්‍යත, අප්පණිහිත**", ඒ චේතෝ විමුක්තිය අත් දකිනව, එයයි ඥාන දර්ශනය. ඒ ඥාන දර්ශනය ඇති තැන බැස ගන්නේ නෑ, දෙයක් හමුවෙන්නේ නෑ, එතනමයි දෙයක් කරගත්තොත් දුක තියෙන්නේ, **දුක්ඛ සත්‍යය තියෙන්නේ දෙයක් කියල ගත්ත තැනයි දුක. දෙයක් කියල ගත්ත තැන තමයි දුක්ඛ සමුදය. දුකට හේතුව තණ්හාව, එතනම ජාති ජරා මරණ ශෝක පරිදේව සියල්ලම උපාදානය එතනමයි.** එකම අරමුණේ මේ සියල්ලම හමුවෙන්නනේ. එයයි සත්‍ය කථාව. එතකොට මේ සත්‍ය දකින කොට බාහිර ඇත්ත නොවන විට මේ අරමුණේ මිදීමයි, එහෙම කියන කොට පේන්නේ නැතිව නෙමේ, වෙනද විදිහට පේනව, වෙනද විදිහටම ඇහෙනව, දැනෙනව නමුත් ඒ සියල්ලටම අයිති නැති තැනක් ඇති වෙනව. එයයි "**ඕභාසය**" මේ ධර්මයේ අනිමිත්ත සමාධිය තුළ ලබන "**ඕභාසය**" ඊළඟ කාරණය, ඒ විහරණය "**අන්තර ඣායති**" ඒ ධ්‍යානයක් තියෙන ඒ "**දස්සනංච රූපානං න පටිච්ජ්ජාමීති**" එතන දර්ශනයත් බැස ගන්නේ නෑ, නිමිත්තත් අනිමිත්තයි "**න පටිච්ජ්ජාමීති**" එතකොට මේ පැහැදිලි කරන්නේ මේ අරමුණේ සත්‍ය දැකල මිදෙන තැනයි. ඒ විදර්ශනා ඥානයයි. ඒ විදර්ශනා ධූරයයි මේ අවධිවන්නේ මේ ප්‍රායෝගික අත්දැකීමයි ඔබට හෙලි කරන්නේ, එයයි සම්මා දිට්ඨියට පත්වෙනවා කියන්නේ, සම්මා දිට්ඨියක් නැතිව සම්මා සමාධියක් ඇති වෙන්නේ නෑ සම්මා දිට්ඨිය කියන්නේ දෙයක් නැති බවයි. දෙයක් කියල දෙයක් නැති බව දකිනව, දකින්නේ දර්ශන ඥානයයි මේ "පුබ්බේ නිවාසානුස්සති ඥානය නැතිව ත්‍රිවිද්‍යා නැතිව කිසි කෙනෙක් නිවන් දකින්නැති බව ඒ **පුබ්බේනිවාසානුස්සති** ඥානය අපි ඔබට පෙන්නුව, පුංචි දරුවා මේ ලෝකයට ඉපදෙන කොට,

ප්‍රභාස්වරය, ප්‍රභාස්වර සිතකින් උපදින්නේ "**ප්‍රභිස්වර මිදං භික්ඛවේ චිත්තං උපක්ඛිලේසේහි උපක්කිලිට්ඨං**" ඒ ප්‍රභාස්වර සිත කිලිටි වෙන ආකාරය.

ඒ ඇසේ උපතයි මහණෙනි උපත කියන තැන "**ඛන්ධානං භාතුභාවෝ ආයතනං පටිලාභෝ අයං වුච්ඡති ජාති**" ඇසින් බලල යමක් දැක්ක තැනයි, අන්න ශබ්දය වර්ණය එකතු වුණ තැනයි, ශබ්ද වර්ණ එකතුවෙලා හැදෙන තැනයි විඥාණය දැන ගැනීම. අපි කීව ඔබට, මේ දැන ගැනීම පිච්චමල කියපුහම ඔය පැත්තට පිච්ච මල මැවෙනවා, දුර කථනයෙන් කව්රු හරි කීවොත් එහා පැත්තේ ඉන්න කෙනාගේ රූපය මැවෙනවා, ඇහෙන්නේ ශබ්දයක්, මැවෙන්නේ රූපයක්, ශබ්දයකට රූප කොයින්ද? ශබ්ද වර්ණ ගන්ධ රස පහස එකතුවීමයි. එහෙනම් මේ සම්මපටිච්චන්න වීමයි පටිච්ච සමුප්පාදය කියන්නේ එය දකින්න, විදර්ශනා ධුරය අවධිකරගන්න, මේ පොතෙන් බල බලා ග්‍රන්ථ ධූරය තුළ කව්රුවත් නිවන් දකින්නේ නෑ. ප්‍රායෝගික වෙන්න. ඔබට ඔබ තුළින්ම ධර්මය හමුවෙයි. හැබැයි පොත බල බල පොතේ වාක්‍ය හොය හොයා ගියාට ඵලක් වෙන්නේ නෑ. ඔබ දකින යමක් තියෙනවා ඔබ ඒ දර්ශනය දකිනව අන්න ඒ දර්ශනය දැකල ඔබ මිදෙන්න. ඒ තුළ ඔබගේ රාග, ද්වේශ, මෝහ කෙළෙස් සංසිදෙනවා, ඔබ මේ සත්‍ය දැක්කට පස්සේ එන හැම අරමුණේම සත්‍ය ඔබට පේන්න ගන්නව. ඔබ දකින්න ගන්නව, ඒ ඉන්ද්‍රිය ධර්ම වැඩෙනව "සද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥා" වීරිය ගන්නවා, සතිය, අන්න අනිමිත්ත සමාධිය වැඩෙන්න ගන්නව. "සද්ධා, වීරිය, සති, සමාධි, ප්‍රඤ්ඤා" මේ අනිමිත්ත සමාධියයි ගිලිහිලා තියෙන්නේ සමාජයට අද, සති නිමිත්ත වඩනව, සති නිමිත්ත වඩල සමාධිය හොයනවා, සමාධිය හොයල ඔබ හිතනවද සමාධිය වඩන්න පුලුවන් කියල. පුලුවන් නම් හොදයි, කරල

බලන්න. ඇත්තටම ඔබට මේ ධර්මය හමුවෙලා නෑ, සමථ විපස්සනා යුගනන්ධන ගමනක් මේ යන්නේ මොකද සිත විසිරෙන කොට මේ අරමුණේ, මේ සත්‍ය පේන්නේ නෑ.

මේ ධර්මය සෑම තැනම ගැලපෙනවා. ඕනම සූත්‍රයක් අරන් බලන්න, ඕනම සූත්‍රයකට ගලපලා බලන්න. අපි මේ පැහැදිලි කරන ධර්මය මනාකොට ගැලපේවි. ඔබ එය ප්‍රායෝගිකව අත්දකින්න, එවිට ඔබගේ රාග, ද්වේශ, මෝහ, කෙලෙස් සංසිදෙනව ඔබටම අත්දකින්න ලැබේවි. දෙයක් නැති තැන ඒ මොහොතේම ඒ අසන මොහාතේම ඔබේ කෙලෙස් සංසිදෙනව, ඔබටම අත්දකින්න ලැබේවි. දෙයක් නැති තැන ඒ මෙහොතේම, ඒ අසන මොහොතේම ඔබේ කෙලෙස් සංසිදෙනව. සත්‍ය නම් සත්‍යමයි. අනුරුද්ධයෙනි, ඔබ විසින් මේ කරුණ පිළිපැදිය යුතුයි. මටත් සම්බෝධියට පෙරම බෝධිසත්ව අවධියේ, සම්බෝධියට පෙර කරුණක් කියනව බුදුන්වහන්සේ, මේ සම්බුද්ධත්වයට පෙර අනුරුද්ධයෙනි, මේ කරුණ මැනවින් පිළිපැදිය යුතුයි කියල "**තංබෝ පන අනුරුද්ධ නිමිත්තං පටිජ්ඡා තබ්බං**" ඒ නිමිත්ත පටිජ්ජාතබ්බං කියන්නේ බැස ගන්නේ නැති බව බුදුන්වහන්සේ පැහැදිලි කරනව "**නිමිත්ත න පටිච්ජක්ඛති**" මොකක්ද මේ නිමිත්ත? මේක බොහෝ අයට නොවැටහෙන කාරණයක් බොහෝ අය කථා කරන්නේ අර විසුද්ධි මාර්ගයේ තියෙන්නේ, සමථය වඩාගෙන යන එකක් ගැනයි. ඒ වේදය තුළ තියෙන එක පටලවල ලියුවට ඒ තුළ කාටවත් මේ විදර්ශනා ධුරය හමුවෙන්නේ නෑ. ඔබත් කරල බලන්න ඒ විශුද්ධි මාර්ගය තුළ තියෙන දේම නිවන් දකීද කියලා, එය සාන්දෘෂ්ටිකව ඔබට දැනෙන්න ගැනේවි. ප්‍රහීණ වෙන්නැති බව මේ දර්ශනය කියල කියන්නේ අතිවිශිෂ්ඨයි, පෙර නොඇසූවිරූ දහමක්මයි

ඒක පොත්වලට සීමා නොවී දකිනව නම් ඒ දැක්මක් තියෙන කෙනෙකුට, අනුරුද්ධයෙනි, මම සම්බෝධියට පෙර ඒ පරිකර්ම 'ඕභාසය" හා රූප දර්ශනය හැඳිනිමි. මේ සම්බෝධියට පෙර රූප දර්ශනය අත්දැක්ක කියල කියනව. "**දස්සනංච රූපානං**" කියන්නේ කුමක්ද? ඒ රූප දර්ශනය දකිනව, "**ඕභාසය**" කියල කියන්නේ අනුරුද්ධයෙනි මැනවින් පිළිපදින්න කියල කියන්නේ, නිමිත්තක් බැස ගත්ත නැති බව මෙතන හොඳින් පැහැදිලි වෙනව "**නිමිත්ත න පටිච්ච**" මොකද්ද මේ නිමිත්ත කියල කියන්නේ මේක බොහෝ අයට නොවැටහෙන කාරණයක් කථා කරන්නේ, විසුද්ධි මාර්ගයේ ලියල තියෙන්නේ සමථය වඩාගෙන යන එකක් ගැන. ඒ වේදය තුළ තියෙන එක, ඒක පටලැවිලා තියන්නේ ඒ දේ කලාට මේ විදර්ශනා ධුරය හමුවෙන්නේ නෑ. ඔබත් කරල බලන්න එහි තියෙන විදිහට බලන්න නිවන් දකීද කියල. ඔබගේ කෙලෙස් ඔබට සාන්දිට්ඨිකව දැනෙන්න ගනීවි. ප්‍රහීණ වෙන්නේ නැති බව මේ දර්ශනය, බුද්ධ දර්ශනය, අතිවිශිෂ්ඨයි. පෙර නොඇසූ විරූ දහමක්මයි. එය පොත්වලට සීමා නොවී දකින කෙනෙකුට, ඒ දැක්මක් තියෙන කෙනෙකුට දකින්න ගන්නව සත්‍ය කුමක්ද කියල.

අනුරුද්ධයෙනි, මටද සම්බෝධියට පෙර "**අනභිසම්බුද්ධ**" ඒ බෝධිසත්ව වියේම ඒ පරිකර්ම භාෂය හා රූප දර්ශනය හැඳිනිමි. ඒ කියන්නේ සම්බෝධියට පෙර, ඒ කියන්නේ බුද්ධත්වයට පෙර රූප දර්ශනය දැක්ක කියල කියනව, "**අහම්පි අනුරුද්ධා පුබ්බේව අනභිසම්බුද්ධා දස්සනංච රූපානං**" කියන්නේ මොකක්ද? ඒ රූප දර්ශනය දකිනව, රූප දර්ශනය, ඉන් මිදුනු දැක්මක් දකිනව ඒ දැක්මයි "**ඕභාසය**" කියල කියන්නේ. ඒ "**ඕභාස සඤ්ජානාමි**" එය දැනෙනව

කියල කියන්නේ බුදුරජානන් වහන්සේ මේ දර්ශනය දකින තැනයි, සිතට එන අරමුණේ සත්‍ය දකින තැනයි.

මේ "මාලුක්‍යපුත්ත" සූත්‍රයේ පෙන්වූයේ මේ කාරණයමයි. මේ දර්ශනය බොහෝ අයට අත් දැකීම් නැති නිසා දකින්න බැරි වෙලා තියෙනවා. මේ අපිම විතරද කොහෙදෝ මේ දේශනය කරන්නේ අපට විතරමද මේ අත් දැකීම් තියෙන්නේ එහෙමනම් දරා ගන්න නිහතමානීව, පවසනව ඒ අත්දැකීම්. අපට තියෙනව රූප දර්ශන විසුද්ධියට පත්වුන ඒ අත්දැකීම්, ඒ ධම්ම චක්කුෂයට හසුවෙනව, වෙනද විදිහටම පෙනෙනව, ඇසෙනව, දැනෙනව කීවේ අන්න ඒ නිසයි. නමුත් ඊට අදාළ ඉන් මිදුණු අවධිමත් ස්වභාවයක් ඔබ අත් දකිනව එය දර්ශනයෙනුයි මතු වෙන්නේ, අපි මොහොතට අවධිය කීවේ, අනිමිත්ත සමාධිය කීවේ, එය අත්දකින කාරණයක් මෙය පොතක තියෙන දෙයක් නොවේ. එය ඔබ අත්දැකිය යුතුයි එය අසුවෙන්නේ ඔබගේ ඥාණයටයි, සිහියටයි, යෝනිසෝමනසිකාරයටයි, යථාභූත ඥාණයටයි. ඒ මග යනව කීවේ අන්න ඒ මග දර්ශනය දකීනම් විතරයි. ඔබට සම්මා දිට්ඨිය හමුවන්නේ, එහෙම වුනොත් විතරයි ඔබට සම්මා ආජීවය හමුවෙන්නේ, එතන සිහියයි පවතින්නේ, ඒ විඥාණමායාවට ඔබ අයිති නෑ. ඔබ මිදිලයි ඉන්නේ, කෙනෙක් නෑ, පුද්ගලයෙක් නෑ, සත්ව පුද්ගල දෘෂ්ඨියෙන් මිදිල , ඒ ස්වභාවය පමණයි, ඒ බුද්ධ ස්වභාවය සම්බෝධියට පෙරත් අත් දැක්ක කියල බුදුන්වහන්සේ මෙතනදී විශේෂ කාරණයක් ඉස්මතු කරන්න හදන්නේ, මේ උපක්ලේශ ගැනයි කියන්න හදන්නේ, ඒ අවධිය, ඔබ දැන් අවධිය අත්දකිනව. අපි හිතනව මේ දහම තුළ ප්‍රායෝගිකයි ඔබ, මේ දහම තුළ, මේ බුද්ධොත්පාද නාලිකාව තුළ ඔබ සවන්

දෙනවා, ඔවුන්ට මෙය පෙන්වා දිය යුතුයි. පිරිසිදුකර දිය යුතුයි. ඒ වෙනුවෙන් තමයි අපි මේ උපක්ලේශ සූත්‍රය තුළ තියෙන මේ දර්ශනය ගැන උපක්ලේෂය පෙන්වන්නේ ඒ සියුම් සැඟව ගිය ක්ලේශය නිසා මේ දර්ශනය ඇතිවෙනව නැතිවෙනව අත් දකින්න ලැබෙයි. අන්න ඒ සියුම් ක්ලේශය බුදුන්වහන්සේ ඉස්මතුකරනව, අනුරුද්ධ තෙරුන් වහන්සේ මේ දර්ශනය දකින්න ඇති අනුරුද්ධ තෙරුන් වහන්සේට මේ දර්ශනය ඇති නොවීමේ හේතුව බුදුන්වහන්සේ පහැදිලි කරනව, අනුරුද්ධ තෙරුන්වහන්සේ පැවසුව බුදුන්වහන්සේට "පංචනිමිත්තංච" ඉදිරියේ දී දකින්න ලැබෙයි කියල අනුරුද්ධ ස්වාමීන්වහන්සේට පැවසුවේ බුදුන්වහන්සේ තමන් වහන්සේගේ අත්දැකීමක් ප්‍රකාශ කරනව, ඒ සම්බෝධියට පෙර බුදුන්වහන්සේ මෙය අත්දැක්ක කියල. ඒ දර්ශන ඥාණයේ අත්දැකීම් ප්‍රකාශ කරනව ගොඩක් අය, මේ ධර්මය පටලව ගන්නව. මේ "ඕභාසය" කියන වචනයට හිතනව අර සමථ සමාධියේ තියෙන ඕභාසය කියල එතන තියෙන්නේ, ආලෝකය, අර සමථය තුළ මතුවෙන, ඒ ආලෝක නිමිති මේ එහෙම දෙයක් නෙමෙයි. මේ අනිමිත්ත සමාධිය තුළ ඇතිවෙන ඔබ දකින්නේ ඒ දර්ශනයයි, අවධියයි, ඒ ප්‍රඥා ලෝකයයි, ඒ ධම්ම චක්කුශය අවධිවීමයි. ආලෝකෝ උදපාදී, අන්න එතනයි තියෙන්නේ චක්ඛුං උදපාදි, විජ්ජා උදපාදී, ආලෝකෝ උදපාදි, ඒ දර්ශනය ඔබ අත්දකින එකක් පොතක පතක තියෙන දෙයක් නොවේ. ඔබට අත්දකින්න ලැබෙනව. ඒ මග ගැන තමයි අපි මේ දර්ශනය පිළිබඳව සත්‍ය ඥාණය පිරිසිදු කරගෙන දේශනා කලේ, එය ඔබට අත් දකින්න, ඔබටම මෙය සාන්දිට්ඨික විය යුතුයි. අපි දන්නව එය ඔබ අත්දකිනව, හැබැයි පවතින්නේ නෑ, ඇත්ත මුලින් මුලින් පවතින් නෑ, ඇති වෙලා නැතිවෙනව. බුදුන්වහන්සේ මේක ප්‍රකාශ

කරනව, ඒකට හේතුවත් ප්‍රකාශ කරනව මටද සම්බෝධියට පෙරම "පරිකම්ම ඕභාසය" හා රූප දර්ශනය හැදිනීම් එතන "පරිකර්ම" කියන වචනය යොදල තියෙන්නේ "අනිමිත්ත සමාධිය" බුදුන්වහන්සේ භාවිතා කරන්නේ එදා වේදය තුළ තිබුණ, පස්වග තවිසන් කරපු වචනම තමයි. බුදුන්වහන්සේ මේ ලෝකයට හෙළිකරපු "ඉධ භික්ඛවේ භික්ඛු" මේ ශාසනයේදීත් බුදුන්වහන්සේ පැහැදිලි කරන්නේ ඒක නිසයි. බොහෝ අය රැවටිල ඉන්නේ මේ ඕභාසය කියන්නේ සමථය තුළ තියෙන එකමයි කියල. විසුද්ධි මාර්ගය ලියන කොට ඒ බුද්ධඝෝෂ හාමුදුරුවෝ ඒ හිටපු දෘෂ්ඨියේ ඉඳගෙනයි මේ ලියල තියෙන්නේ ඒ වේදය තුළ තියෙන "ඕභාසයමයි", මේ ඒක නෙමෙයි බුදුන්වහන්සේ ලෝකයට හෙළිකරන්නේ ඒක නෙමෙයි මේ බුදුන්වහන්සේ පෙර නොඇසුවිරූ දහම කියල කියන්නේ තිබුණු එක නෙමෙයි. මේ අනිමිත්ත සමාධිය කියන්නේ නිමිතිගත සමාධියක් නෙමෙ ඒක "සවිතක්කං සවිචාරං" සමාධියක් ඒ මනසිකාරයක් මෙතන තියෙනව. ඒ මනසිකාරය කියන්නේ සිතට එන අරමුනේ සත්‍ය දැකලා මිදෙන එක. ඒ මනසිකරෝති වුනේ නැතිනම් ඒ ඕභාසය මතුවන්නේ නැහැ. ඒකයි මෙකට හේතුව. ඒ කියන්නේ ඔබට තියෙනව එන අරමුණේ "සවිතක්ක සවිචාර" ස්භාවය එය දකින්න, සත්‍ය දකින්න, යෝනිසෝ මනසිකාරයත් යථාභූත ඥාණයත් තියෙන තැන දකින්න මේ අරමුනෙත් එහෙම දෙයක් නැති බව. ඔබ අභ්‍යන්තරයේ මනසිකාරයක් තියෙනව එය සිද්ධවෙන්න ඕනි. ඒ සත්‍ය, ඒ යථාභූත ඥාණය ඔබ එක අරමුනේ ඔබ සත්‍ය දැකිය යුතු වෙනව. එහෙම වුනොත් තමා ඔබ මිදෙන්නේ. ඔබේ සිතට එන අරමුනේ සත්‍ය දකින තැන තිබෙන මනසිකාරය, මනසිකරෝති කියන එතන මනසිකාරයක් තියෙනව නැත, අන්න විතක්ක විචාර

සන්සිදෙන තැන තියෙන සමාධිය ගැන මෙතන "**සවිතක්කං සවිචාරං**" සමාධියක් තියෙන්නේ මෙයයි බුද්ධවචනය "**ඉධ භික්ඛවේ භික්ඛු**" මේ ශාසනයේ සමාධිය නම් අනිමිත්ත සමාධිය, එය විදර්ශනා ධුරය තුළින් ඔබට හමුවෙනව, ඒ ග්‍රන්ථ ධුරය තුළින් විදර්ශනා ධුරය මතුකර ගන්න ඔබ දක්ෂ විය යුතුයි. එහෙම වුනොත් ඔබට නිවන් මග විවර වෙනව. එය ඔබ හදුනාගත යුතුයි අනුරුද්ධයෙනි, මාගේ ඒ පරිකර්ම ඕභාෂයේ දී, රූප දර්ශනයේ දී, නොබෝ කල්හිම අන්තර්ධාන වී ඒ කියන්නේ රූප දර්ශනය ගිලිහී ගියා කියනවා ඒ කියන්නේ එය මතුවෙලා නැති වුණා කියනවා ඔබගේ ඒ අත්දැකීම, ඒ කියන්නේ බාහිර දෙයක් නැති බව දැකල සත්‍ය දකිනවිට එය ඔබටත් දැනෙනව ඇති, ඔබ ප්‍රකාශ කරනව ඒ අවධිමත් ස්වභාවය ඇති වෙනව, ඒ අත්දැකීම් ඔබට ඇති මොකුත් දැනෙන් නැති මිදුණු ස්වභාවයක් මතු වෙනව කියල. ඔබ එතන කරන්න දේවල් හොයනව පටිච්ච සමුප්පාදය හරි, වෙන මොනව හරි, එතකොට මොකුත් නැති ස්වභාවය දැකල, නමුත් ඒක නිසාමයි ඒක පිරිහෙන්නේ ඇත්තටම ඔබට මෙතනදී කරන්න දෙයක් ඉතිරි වෙලා නෑ. ඒ රාග, ද්වේශ මෝහ, කෙලෙස් සංසිදෙන්නේ සබෑලෙසම ඔබ ඒ අරමුනේ සත්‍ය දැකල මිදෙන ඒ අවධිමත් ස්වභාවය තුළ ඔබ මේ එකකටවත් ඇලිල නැති ස්වභාවයකුත් මතු වෙනව. ඒක තුළ ඔබ රැවටෙන්න ඉඩ තියෙනව එතන ඔබ රැවටුනොත් ඔබ වෙනත් මනසිකාරයකට යනව. වැරදි මනසිකාරයකට, මෙතන තියෙනව උපක්ලේශ ගොඩක් ථිනමිද්ධය ඇති වෙන්න පුලුවන් අපි ඒක කථා කරමු. බුදුන්වහන්සේ සියල්ලම මෙතන පැහැදිලි කරනව දිගටම, එතකොට අනුරුද්ධයෙනි, මට පෙර මෙසේ සිත්විය යම් හෙයකින් මාගේ රූප දර්ශනය අතුරුදන් වේද ඊට හේතු කවරේද? එයට ප්‍රත්‍ය කවරේද? කියල මට

පෙර මෙසේ සිත් විය, මට විචිකිච්ඡාව උපන්න, ඔබටත් ඇති විචිකිච්ඡා නිවන් මගට එතකොට බොහෝ අයට මෙතන ඇති විචිකිච්ඡා, දැන් හැම දෙයකින්ම මිදුණු ස්වභාවයක් ඇති වෙනව. දැන් හැම අරමුණක්ම මිදෙනකොට පාලු ස්වභාවයක් දැනෙන්න ගන්නව.මේ දියුණු තැනක් කියල දැනෙන්නේ නෑ මේ පිරිහීමක් කියල හිතන්න පුලුවන් අනිත් පැත්තට. දැන් මෙතනද විරාගී ස්වභාවයක් දැනෙන්න ගන්නව. "**නිබ්බිදන්ති, විරාගන්ති, නිරෝධන්ති**" ස්වභාවය මතුවෙනව එතකොට මොකද වෙන්නේ විචිකිච්ඡාවක් ඇති වෙනව ඒ විචිකිච්ඡාව එක්ක ඔබට අර අවධිමත් ස්වභාවයත් නැති වෙනව. ඒකයි ඔය පාරුව පෙරලෙනව කීවේ. මේ කාරණාව බුදුන්වහන්සේ පැහැදිලි කරනව. ඒ රූප දර්ශනයයි මේ ගිලිහිලා යන්නේ, හේතු ප්‍රත්‍ය කුමක්ද? කියල, අනුරුද්ධ විචිකිච්ඡාව උපන්න මේ මොහොත අහිමි වෙනව. මේ විචිකිච්ඡාව උපක්ලේශයක් බව පැහැදිලි වෙනව. මේ මග වැරදිද, මේ පෙන්වා දෙන්නේ බොහෝ අයට මේ ප්‍රශ්ණය එනව මිදෙන ස්වභාවය තුළ මොකද වෙන්නේ, අන්න ඔබටත් ඇති විචිකිච්ඡා නිවන් මග වැරදිද? බොහෝ අයට මෙතනට එනකොට ඔය ප්‍රශ්නය එනව දැන් හැම දෙහකින්ම මිදෙන ස්වභාවයක් දැනෙනව. එතකොට මොකද වෙන්නේ, අරමුනෙන් මිදෙන කොට පාලු ස්වභාවයක් දැනෙනව. මේ දියුණු තැනක් කියල හිතෙන්නේ නෑ, පිරිහීමක් කියල හිතෙන්න පුලුවන්. අනිත් පැත්තට දැන් මෙතනදී විරාගී ස්වභායක් දැනෙන්න ගන්නව "**නිබ්බිධන්ති විරාගන්ති නිරෝධන්ති**" කියල මතුවෙනව. එතකොට මොකද වෙන්නේ විචිකිච්ඡාවක් ඇති වෙනවා, ඒත් එක්කම ඔබට අවධිමත් ස්වභාවය නැති වෙනව ඒකයි පාරුව පෙරලෙනව කිවේ. මග නොමග පැටලෙන තැන මෙතනයි. එතකොට මෙතනදී බුදුන්වහන්සේ පැහැදිලි කරනව "**සෝ ඛෝ පන මේ**

ඕභාසෝ න චීරස්සේව අන්තරධායති දස්සනංච රූපානං" ඒ දර්ශනය මේ ගිලිහි යන්නේ "බෝ නුබෝ හේතු බෝ පච්චයෝ" හේතු ප්‍රත්‍ය මොනවද? අන්න විචිකිච්ඡා, මෙතන උපක්ලේශ විදිහට මේ ඔබ දර්ශනයට පත්වීම අහිමි වෙනව ඒ විචිකිච්ඡාව නිසා. ඒ උපක්ලේශය විදිහට ක්‍රියාත්මක වන බව පෙන්වා දෙන්නේ උපක්ලේශ සූත්‍රය තුළ ඒ දර්ශනය වැහෙන්න හේතු වෙනව කියන එක. අපට ඕන උනේ ඒ පණිවිඩය ඔබට දෙන්නයි. උපක්ලේශ සූත්‍රය අපි ගන්න හේතුව මේකයි. අපි දන්නව බුදුන්වහන්සේ උපක්ලේශ පෙන්වන බව ඔබ දැන් මාර්ගය හොඳින් පිරිසිදු කරගෙනයි තියෙන්නේ. ඔබ දැන් හොඳින් දන්නව බාහිර දෙයක් නැති බව සිතේ දෙයක් නැති බව, හැබැයි ඔබට සැක මතුවෙනව ඔබට නිබ්බිදාවක් ඇති වෙනව. අරමුණු බැස ගන්නේ නෑ, අරමුණු මිදෙනව සංඛාර උපෙක්ෂාව ලක්වෙන තැන. එතන **පටිසංඛා ඥානය** කියන්නේ මෙතනමයි. උපක්ලේශ මතුවෙන තැනයි මේ පෙන්වන්නේ මෙතන සමාධිය ගිලිහුණු කල්හි ඒ ඕභාසයත් රූප දර්ශනයත් අන්තර්හීන වේ. විචිකිච්චාවට හේතුවෙන් අනිමිත්ත සමාධියයි ගිලිහෙන්නේ, ඒ අනිමිත්ත සමාධිය ගිලිහෙනකොට ඒ ඕභාසය අර දර්ශනයේ, අර මතුවෙන අර කලින් කී විදිහට, වෙනද විදිහට ඇසෙනව, දැනෙනව, පේනව වුනාට ඊට එහා එකකටවත් අයිති නැති ස්වභාවයක් මතුවෙනව. අන්න ඒ ප්‍රඥාලෝකය මතුවෙන අවධිය ඔබට අහිමිවෙනව එය අතුරුදන් වෙනව කීවේ ඒ නිසයි. එතකොට දර්ශන ඥාණයත් අරූප දර්ශනයේ ඔබට, ඒ දර්ශනයට පත්වෙන තැන තියෙන ඒ අවධිමත් ස්වභාවය බොහෝ අය කථාකරනව ඒ මෙහොතට අවධිය, **"අතීතං නාප්ප ගාමෙය නප්පටිච්තංච අනාගතං පච්චුප්පන්න යේ ධම්මා තත්‍ර තත්‍ර විපස්සතී".**

භද්දේක රත්න සූත්‍රය තුළ පෙන්වන මේ අවධිය ඇතිවන්නේ දර්ශන ඤාණ තිබුනොත් විතරයි කියල අපි කීවේ ඒ නිසයි. මොහොතට අවධිය කියන්නේ එතනටමයි, අතීතයේ සිතත් මේ සිතමයි. අනාගත සිතත් මේ මොහොත විතරයි. හැබැයි මේ මොහොතේ සිතේ සත්‍ය දකින්න එපෑයැ. ඒ කියන්නේ යෝනිසෝ මනසිකාරයයි යථාභූතඥානයයි දකින්න ඕන, නැත්නම් කොහොමද ඔය මොහොතට අවධිය හමුවෙන්නේ, එතනත් හමුවෙන්නේ නෑ. එහෙනම් ඒ අරමුණේ සත්‍ය දකින තැන ඒ දර්ශන ඥානය තිබුනොත් විතරයි එය මතුවෙන්නේ දර්ශන අවබෝධයයි ඒ සත්‍ය ඥානයයි වැදගත් වෙන්නේ, බොහෝ අය මේ ධර්මය පටලවාගෙන ඉන්නේ. ඒ සමථ භාවනා එක්ක පටලවා ගෙන ඕභාසය කියන වචනය එතනයි පටලවාගෙන තියෙන්නේ හිතට මේ **"ලක්ඛන පදට්ඨාදාන"** විදිහට රූපය ඇතුලෙන් දැකල මිදෙන්නේ නෑ ඔබ උත්සාහ කරල බලන්නේ නෑ. එතන නෙමෙයි මේ විදර්ශනා ඥාණය තියෙන්නේ සමථ විදර්ශනා යුගන්ධන කියන්නේ මෙතන සිත විසිරෙන්නේ නැතිව හොද ඒකාග්‍රතාවයක් තියෙන්න ඕන. මේ කෘත්‍ය ඥානයට අවශ්‍ය මෙතන හොදට සිහිය තියෙන්න ඕන. සිහි එලවගන්න **"අතාපි සම්පජානෝ සතිමා"** කෙලෙස් තවන වෙර ඇතිව, එතකොටයි එලදායී වෙන්නේ. එතකොටයි ඒ අරමුණම දැකල මිදෙන්නේ ඒ අරමුණට සිහිය තිබුනොත් තමයි ඒ විදර්ශනා වෙන්නේ ලෝකයට හදුන්වාදෙන ඒ විදර්ශනා ධුරය. ඔබට සමථය අවශයයි. ඔබ හිතන්න එපා රූප කාණ්ඩ බෙද බෙද බලල බෑ **"පොට්ඨපාද"** සිටියේ ඒ දෘෂ්ඨිය තුළ ඔබ යන මේ ගමන තුළ ඒ විතක්ක විචාර සංසිදෙන සමාධියකුයි ලැබෙන්නේ ඒ තුළ හමුවෙන්නේ **"අසඤ්ඤ තලය, ඒ අසඤ්ඤ"** තලයටයි ඔබ යන්න හදන්නේ ඔබට නිවන් මග හමුවෙන්නේ නෑ. ඔබ ඔය සමාධිය කියක

කියන්නේ සති නිමිත්ත වඩල හොයන සමාධිය ඔබතාම හරිම බොළදයි, තාම ඔබ මේ ධර්මය දැකල නෑ හරියට "**සතිනිමිත්ත**" වඩල සමිධිය වඩන එක ලාභ බොළද තැනක් එතන නෙමේ මේ දහම තියෙන්නේ "**ඉධ භික්ඛවේ භික්ඛු**" මේ ශාසනව තුළ "**බොජ්ජංග ද්වයං වදාමි**" කීවේ සූත්‍රවල ඒ නිසයි "**ස්වාමීනි අන්තොටු පිරිවැඩියනුත් බොජ්ඣංග වඩනව**" එසේය ස්වාමීනි, ඒ අය වඩන බොජ්ජංග "**ඉධ භික්ඛවේ භික්ඛු**" මේ සාසනයේ බොජ්ඣංග නෙවෙයි මහණෙනි, ඔබ බලන්න මේ දිහා බොජ්ඣංග සූත්‍රවල අපි පැහැදිලි කරල තියෙනවා මීට කලින් පැහැදිලි කලා "**ද්වයතානුපස්සනා**" සූත්‍ර බොහෝ ගනනක පැහැදිලි කලා මේ දර්ශනය දකින තැන අජ්ඣත්ත බහිද්ධා කියල දකින තැන සූත්‍ර ගණනාවක පැහැදිලි කලා අද රූපය හොයන්නේ ඔබ විශුද්ධි මාර්ගය තුළ යන අය ඔබ අතරමං වෙනවා.

නාමත් දකින්න යන්නේ සිතයි කියාගෙන, බාහිර කියල ගන්නේ රූපය, නාම රූප අන්ත දෙකක් හදාගෙන ඔබ ඉන්නේ අවිද්‍යාවේ. ඔබට තාම අවිද්‍යාවෙන්වත් ගැලවෙන්න බැරි වෙලා ඔබ අසරණයි නිවන් මග කියල මොකක්දෝ දෙයක් හදාගෙන, නමුත් ඔබට පේන දේ ඔබ ගන්නේ නෑ. මේ **ඛණික සමාධිය, ශුෂ්ක සමාධිය,** මේක සමථ සමාධිය ඔබට හිතෙන තරම් පුලුවන් තරම් ඔබ පටලව ගන්නව, පොත් ලියාගෙන තියෙනව ශුෂ්ක යානික සමථ යානික රහතන් වහන්සේ කීවේ මේ සමථය අඩු නම් එය වැඩියෙන් වඩන එකමයි සමථයානික කීවේ, ශුෂ්ක යානික කීවේ සමථය හොඳින් තියෙනව නම් කෙළින්ම විදර්ශනය වඩන එකයි, දර්ශනයට එන එකයි. නමුත් එකම මගයි තියෙන්නේ එකම තොටුපලෙන් ඔබ එකම ගඟටයි බහින්න තියෙන්නේ, මොකක්ද ඔබට කරන්න තියෙන්නේ, එකම අරමුණේ සත්‍ය

දකින එකමයි. ඔබට මේ ධර්මය මුල මැද අග ගලපාගෙන නැති නම් ඔබ අසරණ වෙලා ඔහේ සති නිමිත්ත වඩ වඩ ඔහේ ඉදියි. යමෙකුට දැස් විවර වුනොත් බුදුන්වහන්සේට වගේ පස්වග තව්සෝ ළග හිටියට එලක් නැති බව තේරිල ආළාරකාලාම, උද්දකරාම පුත්‍ර වැනි අය ළග හිටියට එලක් නෑ වගේ සත්‍ය දකිනකොට අන්න නුවනින් විමසනව එසේ කරන්නේ ප්‍රඥාවන්තයින් මහා බුද්ධිමතුන් ප්‍රඥාවන්තයින්ටයි මේ දහම තියෙන්නේ "**පඤ්ඤාවන්තස්ස අයං ධම්මෝ නායං ධම්මෝ දුස්පඤ්ඤස්ස**" කීවේ ඒ නිසයි. ඔබ පොඩ්ඩක් හොදින් විමර්ශනය කරල බලන්න ඔබට ප්‍රඥාව නැතිව නෙමෙයි. ඔබ ඉන්න දෘෂ්ඨිය වැඩි නිසයි හදුනාගන්න බැරි. මේ නිවන් මග අති සුන්දරයි මේ ඔබගේ නිවන් මග, ඔබ ප්‍රායෝගිකව අත් දකීනම් ඔබ විශ්වාස කරාවි ඔබ කියන එකවත් අප කියන එකවත් නෙමේ, කව්රුවත් කියන එක නෙමෙයි ඔබට ප්‍රත්‍යක්ෂ ධර්මය. ඒ දර්ශනය කියන්නේ අපි හිතන දේවල් කොහෙවත් නෑ, ඒකයි මේ ශබ්ද වර්ණ, මේ මහා නිධාන සූත්‍ර පෙන්වුයේ ඛජ්ජනීය සූත්‍ර , සංචේතනා සූත්‍රවල මොනවද තියෙන්නේ මේ සිත හැදෙන හැටි මනා කොට පිරිසිදු කලා. සලායතන සූත්‍ර, මහා නිධාන සූත්‍ර, ස්කන්ධ සූත්‍ර, මදු පිණ්ඩික සූත්‍ර මේවා අපි හොදට පෙන්නුවා. බුදුන්වහන්සේ මොනවද පෙන්වුයේ සිත හැදෙන හැටි මනාකොට ඒවා දැක්කොත් විතරයි මේ ත්‍රිවිද්‍යාවත් ඔබට හදාගන්න බෑ. මේ ක්ෂණ සම්පත්තිය ඔබට ගලපගන්න බෑ. මේ පුබ්බේනිවානුස්සතිඥාණය ගලපග ත්න බෑ ඔබට අප ආසවක්ඛ්‍යඥාණය කියන්නේ ලොකු කථාවක්, වෙනද විදියටම ඇසෙනව, පේනව, දැනෙනව නමුත් ඒ කිසිවකටත් අයිති නැති ස්වභාවයක් තමයි ඕභාසය කියන්නේ, "**චක්ඛුං ච උදපාදී, විජ්ජා උදපාදී, ආලෝකෝ උදපාදී**" මෙතනයි මේ ඕභාසය තියෙන්නේ. මෙය දකින්න

ඔබට මහා නුවනක් තියෙන්න ඕන. ඒ සමාධි සිතේ, ඒ රූප දර්ශනය, ඒ සමධිය ගිලිහුණ කල්හි ඒ ඕභාසය, රූප දර්ශනය අන්තර්ධානය වේ.

ඕභාසය රූප දර්ශනය කියන්නේ ආලෝකය කියන කොට රූප දර්ශනය කියන්න ඕන නෑ, ඥාණය දර්ශන සමාපත්තිය ඕභාසය කියල තියන්නේ ඉන්නේ නෑ, ඒ දර්ශන ඥාණය තුළින් මතුවෙන ඒ අවදිය ඕභසයයි මේ කථා කරන්නේ, ඒ ප්‍රඥාලෝකය ඔබට දකින්න ලැබෙනව, අත් දකිනව මේ කාරණය ගැඹුරු නුවණටයි හමුවන්නේ යම් පරිදි මට විචිකිච්ඡා නුපදින්නේද මම එසේ කරමි කියයි. අනුරුද්ධයෙනි, "**මම නොපමාව වෙර ඇතිව නිවනට මෙහෙය වු සිත් ඇතිව වාසය කර ඒ ඕභාසයත් රූප දර්ශනයත් හැඳිනිමි**" ඒ ඕභාසයත් රූප දර්ශනයත් එකට තියෙන්නේ ඒ ඥාණ දර්ශනයට පත්වෙනව කියන්නේ වෙන දෙයක් මෙය හඳුනාගනීද ඊට එළඹ වාසය කරයි. සිහිනුවන පවත්වනව කියනව ඒය දකින එක පහසු නෑ. ඔබත් අත් දකින්න මේ පරියංකයේ කරන එකක් ද නෑ, සක්මනේ හිටියත් ඉරියව්වක් නෑ, අරමුණේ සත්‍ය දකින එක මේ කියන්නේ ඒ නිමිත්ත ගැනයි මේ කියන්නේ, ඒ අනිමිත්ත සමාධියයි, මේ කියන්නේ ඔබ නුවනින් දකින්න මේ කරුණ. මේ කාරණය මෙහිදී යම් පරිදි විචිකිච්ඡාවක් උපදීද අනුරුද්ධ, නොපමාව නිවනට බරවු සිත් ඇතිව වාසය කරම්. ඒ මනසිකාරයත් තියෙනව "**සෝ යථාකරස්සාමි මේ පුණ්‍ය විචිකිච්ඡා උප්පජ්ජති**" අප්‍රමාදීව කෙලෙස් තවන වෙර ඇතිව අරමුනේ සත්‍ය දකින තැනමයි කෙලෙස් සංසිදෙන්නේ මෙතන මිදීමක් තියෙන්නේ, නිමිත්ත බැස ගන්නේ නෑ අනිමිත්ත සමාධියක්, කෙලෙස් පනවන්න බෑ රාග, ද්වේශ, මෝහ සිත් පනවන්න බෑ මනා නුවනින් මේ කරුණ මෙතන බුදුන්වහන්සේ පෙන්වා දෙන්නේ, දිගටම මේ දේශනා ඔබ

අහන්න. ඔබ මෙතන අවධියෙන් ඉන්නේ බාහිර දෙයක් නැති බව, සිතේ දෙයක් නැති බව, ඔබ දකිනවා ඔබ දැන් මිදීම අත්දකිනවා ඒ තුළයි මේ කරුණ තියෙන්නේ බුදුන්වහන්සේ කියනව, සම්බෝධියට පෙර මෙවැනි අත්දැකීමක් තියෙනව කියල ඊට අනුවම බැසගෙන, අන්න ඒ කටයුතු කරන බව **"සො ඛො අහං අනුරුද්ධය අප්පමත්තො අතාපි"** ඒ ඕභාසය මතුවෙන කොට ඒ අවධියට, අරමුණට හසුවෙනව ඒ කියන්නේ දර්ශනය දකින කොට, එය අරමුණු වෙන කොට, එතනට සිහිය එනව කියන එකයි. ඒ **"අප්පමත්තො පහීයන්තො විහරන්තො"** නොපමාව වාසය කරන බව **"සඤ්ජානාමි"** දැනෙන බව ඒ රූප දර්ශනය නොපමාවම වාසය කරන බව පවසනව. අන්තර්ධාන වන බව, මට මෙසේ සිත් වේ. කියල කියනව. මගේ රූප දර්ශන අතුරුදන් වුවානම් මට මෙසේ සිත් පහල විය කියනව. මනසිකාරය තුළින් මතුවන ඕභාසය ගැන මේ කියන්නේ ඒ රූප දර්ශනය අතුරුදන් වීද ඊට හේතු ප්‍රත්‍ය මොනවද අන්න අමනසිකාර, මෙතන තියෙනව මනසිකාරය තුළින් උපදින ඕභාසය ගැන කියන්න ඒ කියන්නේ ඒ අරමුණ මනසිකාර වෙන්නේ නෑ, අමනසිකාර වෙනව ඕභාසය ඇතිවෙනව බුදුන්වහන්සේ මනා පැහැදිලි කිරීමක් කරනව. ඒ නිසා මනසිකාර නොවීම නිසා සත්‍ය නොදැනීම නිසයි සමාධිය ගිලිහී තියෙන්නේ එහෙම පැහැදිලි කරනව. අමනසිකාරය තුළින් සමාධිය ගිලිහී ගියේද? අන්න මනසිකාර නොකිරීම නිසා සමාධිය ගිලිහී ගිය කල ඒ ඕභාසය අන්තර්ධාන විය. අතුරුදන් විය අන්න මනසිකාරයත් තියෙනව සවිතක්ක සවිචාර සමිධියත් තියෙනවා ඒ තමයි අරමුණේ සත්‍ය දකින තැන මනසිකාර කරන සමාධියක් ගැන සති නිමිත්ත වඩන කොට දැකල තියෙනවද, එහෙම එකක් නෑ මේ සාසනයේ භික්ෂුව මේ

අනිමිත්ත සමාධියයි වඩන්නේ ඔබ කියයි මේ සමථයානික, ශුෂ්කයානික වෙනයිනේ ඔබමයි ඔය බෙදාගෙන, ඔබමයි හිරවෙලා ඉන්නේ, සමථ විපස්සනා යුගනන්දන කියන්නේ සමථය අඩුනම් විදර්ශනා කරන්න එපා. ඔබට තාම ගලපග න්න බෑ. ඒකයි බොළඳ විදිහට හිතන්නේ, සමථය අඩුනම් එය වඩන්න ඕන, විදර්ශනා අඩුනම් එය වඩන්න ඕන එතකොට **"විදර්ශනා පුබ්බංගමා"** අනිත් පැත්තට එනව සමථ විපස්සනා යුගනන්ධන වන්නේ එකම විදිහට එක ගමනක්නේ යන්නේ එහෙනම් ඤාණ දර්ශන විසුද්ධිය තුළයි මේ ගමන යන්නේ වෙන ගමනක් නෑ ඔබට. සති නිමිත්ත වඩල එන සම්මා සතිය නෙමේ. ඒ වේදය තුළ තියෙන සමාධියයි ඒ අද ඔබට සැබෑ සමාධිය උපදින්නෙ නෑ. සති නිමිත්ත වඩන එකේ ගැටලුවක් අපිට නෑ. ඒ තුළ සිහිය සතිය අවශ්‍යයි සිහිය වැඩෙනව, නමුත් ඔබ ඒ පැත්තෙන් **"රූප, ලක්ඛන, පදට්ඨාන"** කියල ඒ පැත්තෙන් හොයාගෙන යන්න හදන්නේ ඔබ අමාරුවේ වැටෙන්න හදන්නේ එය ඔබට එතනින් නිවන් දකින්න බැහැ එහෙම අය ධර්මය තුළ හමුවන්නේ නෑ. ඒක සිද්ධවෙන්නේ නෑ. ධර්මය තුළ ඔබට සැම තැනම දකින්න ලැබෙයි ඒ මනසිකරෝති කියන මේ තැන. ඒ අමනසිකාරය නිසයි ඒ දර්ශන ඥාණය ඇතිවෙන්නේ මෙය බුදුන්වහන්සේ පෙන්වල තියෙනව උපක්ලේශක් හැටියට. අමනසිකාරය නිසයි දර්ශන ඥාණය නැති වෙන්නේ බුදුන්වහන්සේ පෙන්වල තියෙනව ඔබ එක අරමුණේ සත්‍ය දකිනම් ඔබට සිහිය තියෙන්න ඕන එය සිහියට හසුවෙනව ඒක අපි කරන හැටි පැහැදිලි කරනව. මනා කොට ඒ අරමුණ කෙසේද දකින්නේ, කෙසේද ප්‍රායෝගික වෙන්නේ කියන එක, ඒ දේශනා ඉතා වැදගත් හැම අරමුණක්ම දකිනව කීවට ඔබ බොහෝ දුරට බොහෝ අරමුණු මේ වන විටත් ඔබ බාහිර ඇත්තක් නොවන බවට

නිබ්බිදාවට යනව විරාගයට යනව නමුත් ඔබ සමහර අරමුණු තියෙනව බැස ගන්නව.

"**අජ්ඣෝසාය තිට්ඨති**" අන්න එතනදී ඔබ යථාභූත ඥාණයෙන් දැකිය යුතුයි. යෝනිසෝ මනසිකාරයෙන් දැකිය යුතුයි, හඳුනාගෙන කටයුතු කළ යුතුයි එයයි "**මනසිකරෝති**" කියන තැන, එයයි දර්ශනයට පත්වෙන්නේ එය දකිනවානම් පමණයි එය ඇති වන්නේ අනිමිත්ත සමාධියයි මොහොතට අවධිය කියන්නේ දර්ශන ඥාණයෙනුයි මතුවෙන්නෙ,' නැතිව මේ සිතුවිලි වලින් අතීත සිත ඉවරයි, අනාගත සිත ඇවිල්ල නෑ, මෝහනයක් නෙමේ, හිත හිත ඉන්නව නෙමේ මේ දර්ශන ඥාණය තුළින් අවධිවෙන එකක්, එයයි මොහොතට අවධිය, එයයි ඕභාසය කියල කියන්නේ ඒ අනිමිත්ත සමාධිය තුළ උපදින සමාධිය "**අනිමිත්තයි ශූන්‍යතයි අප්පනිහිතයි**" විමුක්තිය තුළ උපදින සමාධිය සම්මා දිට්ඨියෙනුයි එතකොට ඒ සම්මා දිට්ඨිය නැතිව උපදින්නෑ. බාහිර ඈත්ත කරගත්ත කෙනෙකුට මේ සමාධිය නෑ කීවේ බාහිර ඈත්ත කරගත්ත කෙනෙකුට ඒ බුද්ධ දර්ශනය හමුවෙලා නෑ. හඳුනාගෙන නෑ මහා නුවණටයි මේ සියල්ල ගැලපිල එන්නේ ඉතින් ඒ නුවන පෑදෙන්න ඕනේ ඉතින් බුදුන්වහන්සේ මෙන්න මේ කාරණය පෙන්වනව "**අමනසිකරෝ බෝ මේ උදපාදී අමනසිකාරදී කරංච පනමේ සමාධි සමාධි චුති ඕභාසෝ අන්තරා දස්සනංච රූපානං යථා කරස්සාමීති**" බුදුන්වහන්සේ පැහැදිලි කරනව අමනසිකාර හේතුවෙන් මගේ සමාධිය ගිලිහුණ සමාධිය මොකක්ද? "**සවිතක්ක සවිචාර සමාධියත් ඒ කියන්නේ යථාභූත ඥාණයෙන් සත්‍ය දකින තැන දෙයක් හමුනොව සමාධිය එයයි අනිමිත්ත සමාධිය සත්‍ය දකින තැන උපදින සමාධිය එය මනසිකාරය තුළ උපදින සමාධියක් සවිතක්ක සවිචාර**" එය මෙනෙහි නොකිරීම අමනසිකාර නිසා එයයි

සත්‍ය ඒ සමාධිය ගිලිහුන තැන ඕභාසය අන්තර්ධාන විය. සමාධිය ගිලිහුනොත් ඒ අනිමිත්ත සමාධිය නැති තැන ඒ රූප දර්ශනයට වෙනද විදිහටම පේනව, ඇහෙනව, දැනෙනව වුනාට ඊට එහා ගිය අවධියක් ඇති වෙනව කීවේ අන්න ඒකයි ඕභාසය කීවේ.

ඒකට හේතුව එන අරමුණ බැස ගන්න එක, එන අරමුණේ සත්‍ය දැක්ක නම් එය මනසිකරෝති කියන්නේ "සවිතක්ක සවිචාර" යථාභූත ඤාණයෙන් දැකිය යුතුයි. ඒ හේතුවෙන් සමාධිය ගිලිහෙනව අමනසිකාර උනොත් එතකොට එයයි උපක්ලේශ. එන අරමුණ සත්‍ය දකින්නේ නැති කමයි මනසිකාරය ගිලිහුණු කල සමාධියයි ගිලිහෙන්නේ ඒ **"ඕභාසය"** අන්තර්හිත විය යලි විචිකිච්ඡා උපදින්නේද, මනසිකාර උපදින්නේ ද, මම එසේ කරයි, එතකොට මේ අමනසිකාරය නිසයි දර්ශනය ගිලිහිලා යන්නේ, අනිමිත්ත සමාධියයි ගිලිහිලා යන්නේ, දර්ශන ඤාණය තුළ උපදින, බුදුන්වහන්සේ පෙන්වා දෙන්නේ **"දස්සනංච රූපානං ඕභාස දස්සනංච රූපානං"** කියල කියන්නේ සතර ඉරියව්වෙම ඔබට මෙය දකින්න ලැබෙනව **සම්පජානකාරී හෝතී ආලෝකිතේ විලෝකිතේ සම්පජානකාරිහෝති"** සතර ඉරියව්වේම **සතිසම්පජානයෙන්** කියන්නේ, මේ එන අරමුණේ සත්‍ය දැකල මිදෙන සමාධිය ඒක මහා නුවණටයි හසුවෙන්නේ උපක්ලේශ කුමක්ද? ඒ උපක්ලේශය අමනසිකාරය සිතට එන අරමුණේ සත්‍ය නොදකින තැන ඒ අනිමිත්ත සමාධිය මතු වෙන්නේ නෑ කියන එකයි. එතකොට ඒ දර්ශනයට පත් නොවන තැන එතනමයි. ඉතින් මේ මාර්ගයේ යන යෝගාවචරයෙකුට පෙන්වන උපක්ලේශයයි. ඉතාම ගැඹුරු තැනක් ඒ පෙන්වන්නේ ඒ තරම් ගැඹුරු නිසාමයි මෙතරම් දීර්ඝව ඔබට පැහැදිලි කලේ (කරන්නේ) ඔබ නුවනින් දැකිය

යුතුයි මේ කාරණය ඉතාම වැදගත් උපක්ලේශ සූත්‍රයේ මේ කොටසේ අපි හිතනව මේ කාරණා තුළ ඔබ අසන්නේ දර්ශනයට පත්වෙන හැටියි. මෙතන තියෙන වැදගත්කම අපි හදුනනව දර්ශන ඥාණය අපි දන්නව, සමාජයට ගිලිහිල තියෙන්නේ මේ අනිමිත්ත සමාධිය. බොහෝ අය හිතන්නේ මේ සමථ සමාධියක් කියල **"ඉද භික්ඛවේ භික්ඛු"** මේ ශාසනයේ බොහෝ අය මේ සමාධිය හදුනන්නේ නෑ, (ලෝකය) බාහිර ඇත්ත කරගත්ත තැන ඒ ඥාණ දර්ශනය විශුද්ධිය ඇති වෙන්නේ නෑ, දර්ශනයට පත්වෙන්නේ නැතිව කිසි කෙනෙක් නිවන් දකින්නේ නෑ. අපි මේ කතා කරන දර්ශන සමාපත්තිය කියන තැන ඒ **දස්සනංච රූපානංච** කියන තැන, ඒ රූපාරම්මණයෙන් මිදෙන තැන, දර්ශනය ඇත්තටම ඔබට මේ අරමුණේ සත්‍ය දැකල මිදෙන තැනයි, එයයි මෙතන තියෙන වැදගත්ම කාරණය. එයයි. අනිමිත්ත සමාධිය වන්නේ ඔබ විදර්ශනාවකින් තොරව නිවන් මගක් නෑ සමථය වඩල ඔබට නිවන් දකින්න බෑ එහෙම දෙයක් සිද්ධ වන්නේ නෑ ඇත්තටම මේ පටලවාගෙන ඉන්නේ සමථය තුළ ගිහින් නිවන් දකිනව කියල හිතා ගෙනයි, එහෙම නම් බුදුන්වහන්සේ ආළාර කළාම උද්දකරාම පුත්‍ර තවුසෝ ළඟ දිගටම භාවනා කරනව, ඇයි පටිච්ච සමුප්පාදය මෙනෙහි කළේ. එතන මනසිකාරයක් නැද්ද? ඒ අමනසිකරෝති නම් එතන සමාධියක් නැති බව මෙතනින් ඔබට පැහැදිලි වෙනව එහෙනම් ඒ පටිච්ච සමුප්පාදය මෙනෙහි කරන එක, ඔබ හිතන්න එපා ඔය සමථය වඩල ලබන නිවනක් නෑ, මෙනෙහි කිරීම තුළින්මයි එය ලැබෙන්නේ අපි ඔබට මොකුත් කියන්නේ නෑ. අපි මේ කියන මේ දර්ශනයට ඔබ පත් වුනොත් කොහොම හරි කමක් නෑ. ඔබ දුකින් මිදෙනව නම් ඒක වෙන්නැති නිසයි, ඔබ අමාරුවේ වැටෙන නිසයි

බොහොම කෙටි කාලයයි අපි ජීවත්වෙන්නේ ඒ තුළ ඔබ යන ඔය රාමුව.

අර අපි සමාන්‍ය කථාවට කියනව සුනඛයා අර තමන්ගේම නැට්ට අල්ලන්න දඟලනව. ඒ වගේ ඔබටත් දැනේවි. මේ අනිමිත්ත සමාධිය ඔබට ඒ තුළින් ලැබෙන්නේ නෑ මේ දර්ශන ඥාණය, ඒ රූප දර්ශනය ඔබ තාම හඳුනාගෙන නෑ ඉතිං ඔබ ඒ උපක්ලේශ කෙසේ හඳුනා ගන්නද? ඔබ මෙය පටලව ගෙනයි ඉන්නේ. සති නිමිත්ත අවශ්‍යයි, ඒක බොහෝම වටිනව. අපි සමථය තුළ පමණක් සිර වෙලා කොටු වෙලා නිවනක් සොයනව විදර්ශනා ධුරය අත හැරිල, ඒ කියන්නේ අන්ධයට මැණිකක් හම්බවුනා වගේ. ඔබ අතරමං වේවි මේ ඔබගේ දෑස් අරින්නට කාලයයි, නිවන් මග වැසී තිබෙන්නේ ඔබගේම අඥාණ කමටයි. සමහර විට ඔබගේ මාන්නය නිසාම මෙය අහිමි වෙන්න පුලුවන් අපිට පුද්ගල කථාවක් නෑ, ධර්මය දැනගෙන ඔබ සසර දුකින් මිදෙන්න.

මෙතනමයි චතුරාර්‍ය සත්‍ය, මෙතනමයි පටිච්ච සමුප්පාදය, මෙතනමයි ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය, සත්තිෂ් බෝධි පාක්ෂික ධර්ම, මෙතනමයි, මෙතනමයි ඒ ක්ෂණය, නිවන, ඒ ක්ෂණය දකින්න නම් ඒ දර්ශණ ඥාණය අවබෝධ කරගන්න. අනිමිත්ත සමාධියෙන් තොර කිසිවෙකුට ඒ දර්ශනය හමුවෙන්නේ නෑ. හොඳයි එහෙම නම් මෙය අවබෝධය ඔබගේ නිර්වාණ අවබෝධයටම හේතු වේවා, තෙරුවන් සරණයි.

මෙය කියවන ඔබ මහා භාග්‍ය වන්තයි,

ඔබට පුලුවනි නිවන් දකින්න

නැවත සසර දුකට වැටෙන්න හේතු නෑ

සත්‍ය ධර්මය හෙළිවෙනව

රහතන් වහන්සේලාගේ යුගයක් නැකතත් එනවා

ඒ ගැඹුරු ඥාණයන් අවධිකරගත් මහා මුණිවරු අදත්

වැඩ සිටිනව

කාලයේ වැලි තලාවට සැගව ගිය ඒ සත්‍ය හෙළිකරන්නට සුදුසු මොහොත පැමිණෙමින් තිබෙනව

රහතන් වහන්සේලාගේ යුගයක් ළගම එනව

ඒ අභිඥා ඇස පහල කරගන්න කාලයයි

මිත්‍යා දෘෂ්ඨික මෝහ ඝණ අන්ධකාරය දුරලන

ප්‍රඥා ලෝක හිරු කිරණ දසත හමා එනව

දුකින් මිදෙන සිත්හි සැනසුම් සුළගක් දසත හමා යනවා

ඔබට ඇසෙනවා ද ඔබ ඉන්න තැන

# උපක්ලේශ සූත්‍රය - 02

මේ බුදුන්වහන්සේ කථා කරන්නේ, අපි මුල් දේශනාවල පෙන්වා දුන්නා මේ අනිමිත්ත සමාධිය ගැන. ඔබට පෙන්වා දුන්නා සාමාන්‍ය සමාධියකදී විතක්ක, විචාර, සංසිඳුන තැන මෙතන දී විතක්ක විචාර සංසිඳුන සමාධියක් ගැන නෙමේ කථා කරන්නේ, අපි ඔබට නිතරම ඉදිරිපත් කරපු මේ දර්ශන ඥාණය ගැන, ඒ දර්ශනයට පත්වීම ගැන **"ඒවං අප්පමත්තානං අතාපි නං පහීයන්තානං විහරත්තානං උත්තරීමනුස්ස ධම්මං අළමරිය ඥාණ දස්සන විසේසෝ අධිගතෝ ඵාසුවිහාරෝති"** ඒ කියන්නේ අළමරිය ඤාණ දර්ශනය පහසු විහරනයෙන්, ඒ කියන්නේ අනිමිත්ත සමාධිය කියන කොට දර්ශන ඤාණය, දර්ශන සමාපත්තිය, කියන කොට දර්ශනයට පත්වෙනව කියන කොට සුවිශේෂ කාරණාවක් තියෙනව. මෙය හමුවෙන්නේ විදර්ශනායානිකයාට පමණයි. ඒ කියන්නේ අපි ග්‍රන්ථ ධුරය තුළ මේ ධර්මය, අපි සෛද්ධාන්තිකව දැනුමෙන් දැන ගන්නව, හබැයි දීර්ඝකාලයක් අපිට විදර්ශනා ධුරය අහිමිවෙලා තියෙනවා. ඒ කියන්නේ ප්‍රායෝගිකව තමා තුළින්ම මේ ධර්මයට අනුගතව පත්වීම, ඒ කියන්නේ නිවනට පත්වීම ඒ කියන්නේ රාග, ද්වේශ, මෝහ කෙලෙස් සංසිඳීම. තව විදිහකින් කියනවානම් සබ්බ සංඛාර සමථය, ඒ ක්ෂීණාශ්‍රව රහතන්වහන්සේගේ ස්වභාවය. ඇත්තටම රහතන්වහන්සේ කියල අපි කීවම, ඒ රහ නැති ස්වභාවයයි අරහත්ත

ස්වභාවයයි, ඒ අරහත්ත කියන්නේ අනුත්තරත්වයටයි. ඒ ශූන්‍ය ස්වභාවයයි, ඒ සිතෙන් මිදෙන තැන සිතිවිලි වලින් මිදෙන තැන, ඒ ශූන්‍ය ස්වභාවයයි ඔබ ඒ උත්තරීතර ස්වභාවයටයි අවදිවන්නේ. මේ බුද්ධ ස්වභාවය ගැන අපි ඔබට දීර්ඝව පැහැදිලි කළා. මේ සිතිවිලි වලින් වැහිල තියෙන බව, සෑම සිතකම බුද්ධ ස්වභාවය පවතින බව ඒ වගේම ඔබට මේ උපක්ලේශ සූත්‍රය තුළ පෙන්වන්නේ ඒ දර්ශන සමාපත්තිය දර්ශනයට පත්වීම. "**දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ**" කියල අපි කියනව, මේ කියන්නේ මේ ධර්මය තුළ මේ විදර්ශනා ඥාණය තුළ බුදුන් වහන්සේ පෙන්වන්නේ මේ ධර්මය ඔබ දන්නව, සමථ භාවනාව පස්වග තවුසෝ වැඩුව. ඒ අය බුදු සමය තුළ බුදුන්වහන්සේ බුදුවීමට පෙර වැඩු සමථ භාවනා, ඒවා ලෞකිකයි, ඒවා පිරිහෙනවා, ඒවා සංඛතයි, හේතුනිසා හටගෙන හේතු නැති වෙන විට නැතිවන දේවල්. මේ ලෞකික ධ්‍යාන අපි පැහැදිලි කළා, ප්‍රථම ධ්‍යාන, ද්විතීක ධ්‍යාන, මේ ධ්‍යාන අවස්ථා විතක්ක විචාර සංසිදෙන අවස්ථා, එතකොට මේ ලෞකික ධ්‍යාන නෙමෙයි බුදුන්වහන්සේ දේශනා කරන්නේ ලෝකෝත්තර ධ්‍යාන, අපි ඔබට සැහැදිලි කලා ඒ දර්ශනය කුමක්ද? මේ සමාජයෙන් ගිලිහිලා තියෙන මේ බුද්ධ දර්ශනය බාහිරයේ යමක් තියෙනව කියල කෙනෙක් දකිනව නම් එතනමයි තියෙන්නේ "**යා රූපේ නන්දි තදුපාදානං භවෝ**" කීවේ ඒකයි. මේ දර්ශනය අති සියුම්, අති ගාම්භීරයි, ඇත්තටම අවබෝධ වුන කෙනෙතුට නම් මේ දර්ශනය ඉතාම සරලයි නමුත් මේක අපිට අවබෝධ කරගන්න තියෙන බාධාව තමයි මේ දන්නව කියල තියෙන දැණුම. මේ දැණුම විසින් එය වසනව. ඒක ඒ තරම්ම සරලයි මෙතන දෙයක් නැති බව මේ අනාත්ම ධර්මයයි ඒ දර්ශනය තුළ පවතින්නේ, මේ දර්ශනය

හමුවන අයෙතුට මේ ආත්මයක් නැති බව දකින විටයි, දෙයක් නැති බව දකින විටයි අර අවධිමත් ස්වභාවයක් මතු වෙනවා. ඒක "භද්දෙක රත්ත" සූත්‍රයෙන් පෙන්වනව. මේක සාන්දිට්ඨික අකාලික දහමක් අන්න සාන්දිට්ඨික, අකාලික, ඒහිපස්සික, පච්චුප්පන්න, ධර්මය මේ මොහොත ඇතිවන මේ මොහොතෙම නැතිවන ධර්මතාවය තුළයි, හැබැයි මෙතනදී,හැබැයි අකාලික දහම කියන්නේ කාලයකට අයිති දෙයක් නෙමෙයි මේ මොහොතට අවධිය කියන්නේ, ඇත්ත මෙතන තුන් කාලයක් නෑ, මොහොතට අවධිය කියන්නේ එක් ක්ෂණික සිතක සිතේ රැවටීම. එහෙම නම් මේ අරමුණේ සත්‍ය දැකීම, එහෙනම් ක්ෂණ සම්පත්තිය කියන්නේ මේ මොහොත, එක මොහොතයි මේ තියෙන්නේ සිත දකින එකයි අරමුණේ සත්‍ය දකිනව කියල කියන්නේ සිතක් හටගන්නව ඒ කියන්නේ මේ මොහොතේ අපිට අරමුණක් තියෙනව. අපි දන්නව ඇස, කණ, නාසය, දිව, කය යන මේ ආයතන වල එක මොහොතක එක අරමුණක් පැවෙතෙනව එතකොට ඒ මොහොත පෙර නොතිබීම හට අරගෙන ඉතිරි නැතිවම නිරුද්ධ වෙනව.

මේ විදිහට හැම මොහොතෙම සිතක් ඉපිද නිරුද්ධ වෙනව සිතක් හටගන්නව නිරුද්ධ වෙනව. මෙතන අපි දකින්න ඕනි මේ යුගය වෙනවිට ධර්මය තුළ කථා කරන්න ඕනි, සමාධි කියන තැන. අපි උපසම්පදාව බුරුමයෙන් ගෙනාවා, ඒ වගේම භාවනා ක්‍රම ගෙනාවා, මහායාන ජෛන මහා වීර අමිතාබුද්ධ මේ වගේ දේවල් තියෙනව ලංකාව තුළ අනාපාන භාවනා, පිම්බීම හැකිලීම, සතළිස් කර්මස්ථාන කසින භාවනා මේ තමයි, මේ තමයි සමථය අසඤ්ඤ තලයට ගිය තැන අද බොහෝ දෙනා සිතනව ලක්ඛන පදට්ඨාදාන මේ සිතේ නොදැනෙන ස්වභාවය තුළ පච්චය පරිග්ගහ

ඤාණ මේ ආස්වාස ප්‍රස්වාස තුළ පච්චය පරිග්ගහ ඥාණය ඔවුන් සිතනව මේ අනාපාන සති සූත්‍රය තුළ පෙන්වන මේ කාරණා ටික මේ සමථය මේ සමථය තුළ මේක හමුවෙනව කියල. එහෙනම් බුදුන්වහන්සේ දේශනා කරනව පස්වග තවුසන්ටත් බුදුන්වහන්සේ දේශනා කරන්නේ "පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු" එහෙනම් පෙර නොඇසූ දහම සමථය වෙන්න බෑ එහෙමනම් සමථ විපස්සනා යුගනන්දන ගමනක් මේ තුළ තියෙන්නේ.

මහා සළායතන සූත්‍රය තුළ ඔබට ඒක දකින්න ලැබෙනව. ස්වාමීන්වහන්සේ නමක් බුදුන් වහන්සේගෙන් ප්‍රශ්ණයක් අහනව, ස්වාමීනි බුදුරජාණන් වහන්ස, විදර්ශනා වැඩීම සදහා සතරවන ධ්‍යානයට සමවැදිය යුතුද? තුන්වන ධ්‍යානයට සමවැදිය යුතුද? මේ ධ්‍යාන වලින් විදර්ශනා වැඩිය හැකිද? බුදුන්වහන්සේ මෙහෙම පිළතුරු දෙනව. මහණෙනි, පළවෙනි ධ්‍යානය තුළින් විදර්ශනා වැඩිය හැකියි මහණෙනි, තුන්වැනි හතරවැනි ධ්‍යාන තුළත් විදර්ශනා වැඩිය හැකියි මහණෙනි. බුදුන්වහන්සේ පෙන්වා දෙනවා මහණෙනි, ධ්‍යාන නැතත් ඕනෑම චිත්ත ඒකාග්‍රතාවයක් තුළ විදර්ශනා වැඩිය හැකියි මහණෙනි කියල දේශනා කරනව.

මේක තමයි ඇත්ත කථාව සමථ විපස්සනා යුගනන්ධන ගමනක් කියනනේ සමථයානිකයයි, ශුෂ්කයානිකයයි කියල සමථය තුළ නාමරූප වෙන්කරගෙන ඔබට කවදාවත් නිවන් දකින්න බෑ, ඒ පස්වග තව්සෝ කරපු දේවල්, උද්දකරාම පුත්‍රත් ඒවා කලා ඔබ කරල බලන්න ඒක කවදාවත් වෙන්නේ නෑ. සමථ විපස්සනා යුගනන්දන කියල කියන්නේ සමථය තුළ හිරවෙලා බෑ, ඒකාන්තයෙන් විදර්ශනාවට එන්න ඕන, හිතනව නම් සමථය තුළ , පරියංකය තුළ , ඒ තුළ නාමරූප

වෙන්කර ගෙන අභ්‍යන්තරයෙන් ඒ තුළ නිවන් දකින්න, ඒත් බුද්ධ දර්ශනය අවශ්‍යයි මොකක්ද ඒ නාම රූප පරිච්ඡේද ඤාණය කියන එක. නාම රූප උපරූජ්ජනය වන තැන නාමයටත් රූපයටත් හිමි නොවන තැන, මේ අවබෝධ කරන්න තියෙන්නේ මොකද්ද? ඇත්තටම මේ අනාත්ම ධර්මයයි අවබෝධ කරන්නේ, සිත කියල දෙයක් නෑ, අනාත්ම ධර්මයයි අවබෝධ කරන්න ඕන, මෙන්න මේ සිත තුළින් යන ගමන ඒ නිවන් මග සාක් ෂාත් කරගන්න තියෙන මග සමථය කරල හරි යන්නේ නෑ බුදුන්වහන්සේ සමථ භාවනා අත හැරල තමයි පටිච්ච සමුප්පාදය මෙනෙහි කරන්නේ, පස්වග තවුසෝ අලාර කාලාම උද්දකරාම පුත්ත අතහැරලා පටිච්ච සමුප්පාදය මෙනෙහි කලා, සමථය විතරක් වඩල ඔබට ඔය නිවන් මග හමුවෙන්නේ නෑ. සමථ විදර්ශනා යුගනන්ධ කියන්නේ චිත්ත ඒකාග්‍රතාවය අවශ්‍යයයි. ඒ කියන්නේ සිත විසිරෙන කොට සිතට එන අරමුණේ සත්‍ය දකින්න බෑ, ඒ සදහා අවශ්‍ය වෙනව චිත්ත ඒකාග්‍රතාවය එය පවතිනවනම් විදර්ශනා වැඩිය හැකියි මහණෙනි, කීවේ ඒක නිසයි. අපි හිතමු මෙතන ආත්මයක් තියා ගෙන භාවනා කළොත් මොකද වෙන්නේ, ඒක පස්වග තව්සෝ වඩපු භාවනා ක්‍රමයකටයි යන්නෙ.

ඒ කියන්නේ ආත්මය කවදාවත් නැති වෙන්නේ නෑ පොට්ඨපාද සූත්‍රය අධ්‍යනය කරල බලන්න. ඒ තුළ තියෙනනේ මේ ක්‍රමය කරල බලන්න, පොට්ඨපාදට වරදින තැන මෙතනයි ආත්ම දෘෂ්ඨිය තියාගෙන භාවනා කලාට නිවන් දකින්නේ නෑ. අසඤ්ඤ තලය ගැන කථා කරනව, සඤ්ඤා වේද සිත නිරෝධ සමාපත්තිය ගැනත් කථා කරනව ඒත් ආත්මයක් තියෙනව. **"අන්තොටු පිරිවැඩියත් වඩන ඒ නිරෝධ සමාපත්තිය තුළ ආත්ම සංඥාවත්, කෙනෙක්**

**ඉන්නව. සංඥා වේදනා නිරෝධ කරගෙන**, ඒ මේ සාසනයේ නිරෝධ සත්‍ය නෙමෙයි. අපි මේ සූත්‍රවල බොහෝ පැයැදිලි කළා **"බොජ්ඣංග ද්වයං වදාමි"** කියල ස්වාමීනි, අන්තොටු පිරිවැඩියනුත් බොජ්ඣංග වඩනව එසේය මහණෙනි, අන්තොටු පිරිවැඩියන් වඩනව බොජ්ඣංග මේ සාසනයේ භික්ෂුව වඩන බොජ්ඣංග නෙමෙයි කියල බුදුන්වහන්සේ සමථය තුළ අර තපස්වරු කරපු භාවනා මේ තුළ වචන විතරයි. පළමු ධ්‍යාන, දෙවන ධ්‍යාන, තෘතික ධ්‍යාන, කියන විතක්ක විචාර සංසිඳිල, ප්‍රිති සුඛ ඒකාග්‍රතා මේ අවස්ථාව තුළත් විදර්ශනා වැඩිය හැකියි මහණෙනි, කියනව ඇත්තනම සමථය තුළ විදර්ශනා වඩන විදිහටම විදර්ශනා යානිකයාත් සමාධියක් ඇති වෙනව ඒ අනිමිත්ත සමාධියයි. ඒ "සවිතක්කං සවිචාරං සමාධියයි සමථය තුළ ලබන සමාධිය විතක්ක විචාර සංසිඳීම තුළින් ලබන සමාධිය, තදංග විෂ්කම්භන ප්‍රහාණයක්, ආත්මයක් එතන තියෙනව, එතන තියෙනව ආත්ම සංඥාව තුළ ඉදගෙන ඒක කරන්නේ, මෙතන අවබෝධය තුළ මෙය සිදුවෙන්නේ, මේ හමුවෙන්නේ ඇත්තටම කීවොත් අපි කියන සත්‍ය ඥාණය තුළයි මෙය හමුවෙන්නේ දර්ශන ඥාණය තුළයි, අපි පැහැදිලි කරන පටිච්ච අන්තයටම අපි කථා කරන සත්‍ය ඥණය තුළයි මෙය සිදුවන්නේ පටිච්ච සමුප්පාදය අවබෝධය තුළයි මෙය සිදූවන්නේ පටිච්චච සමුප්පාදය අවබෝධ කරන්නේ භාවනා කරල නෙමෙයි. එය අවබෝධ කරන්නේ නුවනින් විමසල. ඒ මහා ප්‍රඥාවටයි හසුවෙන්නේ, එය නුවණට හසුවන කාරණයක් එය සතර ඉරියව්වෙන් තොරව, එය පරියංකයේදි ලබන දෙයක් නොවේ. මේ සතර ඉරියව්ව කියන කොට පර්යංකය, සක්මන, නිදාගෙන, සිටගෙන, ඕනෑම ඉරියව්වක ඔබට දකින්නට ලැබෙනවා. අපි යම් කිසි ඉරියව්වක එකම දිනක කටයුතු

කරනවා. මේ සිතේ දියුණුව, එය නුවණ වැඩෙන කෙනාට ඒ මහා ප්‍රඥාව අවධි වෙන තැන ඒ අභිඥ්ඥාව අවධිවෙන තැන. නිවන් මග ඔබට හසුවෙනව ඒකයි "**ඥායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ඡිකිරියාය**" කියන තැන, මේවා අපි ඉදිරියේ කථා කරනව බොහෝ අයට අවබෝධයක් නෑ මේ ගැන. ලෞකික අභිඤ්ඤා මොනවද? ලෝකෝත්තර අභිඤ්ඤා මොනවද ධම්ම අභිඤ්ඤා මේ ගැන කිසි අවබෝධයක් නෑ ලෞකික අභිඤ්ඤා නෙමේ, ලෝකොත්තර භූමිය තුළ නමුත් ඒ වචනමයි භාවිතා කරන්නේ, ලෝකෝත්තර භූමියෙත් අප භාවිතා කරන්නේ. ඒ වචන ටිකක් ටිකක් පමණයි, නමුත් ඒ තුළ ලබන අධ්‍යාත්මික දියුණුව අතිවිශිෂ්ඨයි. ඇත්තම කීවොත් මේ ධර්මය මනා කොට ගලපා ගත යුතු වෙනව. කිසිවෙකුට කිසිම කෙනෙතුට ඒ පටිච්ච සමුප්පාදය අවබෝධයකින් තොරව ඒ නිවන්මග හමුවෙන්නේ නෑ. ඒ පටිච්ච සමුප්පාද ධර්මය අවබෝධය තුළයි අනාත්ම ධර්මය හමුවෙන්නේ, ආත්මය තියාගෙන ඒ අරමුණේ සත්‍ය දකිනව කියල එකක් වෙන්නේ නෑ. මේක රාග සිතක්, ද්වේශ සිතක්, මෝහ සිතක්, කියල අනිත්‍ය දැක්ක කියල දෙයක් තිබුණොත් තමයි රාග , ද්වේශ, මෝහ සිත් හටගන්නේ ඒකේ අනිත්‍ය, දැන් දුක දැක්ක කියල, එහෙම නිවන් මගක් හමුවෙන්නේ නෑ. ඒ බාල බොළඳ වැඩ ඒ තුළින් නිට්ටාවටම අනිමිත්ත සමාධියක් උපදින්නේ නෑ ඒ **අනිමිත්ත, ශුන්‍යත, අප්පනිහිත සමාධිය, මේ සඳහා විදර්ශනා ධුරය අවධි විය යුතුයි.** විදර්ශනා කියල කියන්නේ මේ රාග සිත් ද්වේශ සිත් කියල එහෙම දෙයක් නෙමේ, අසරණ වෙලා බොහෝ අය "ඔය සර්පයා වලිග යෙන් අල්ලා ගත්ත වගේ තමන්ටම දෂ්ඨ කරාවි

අද බොහෝ දෙනෙක් අතරමං වෙලා, මේ සත්‍ය ධර්මය තුළ මේ පටිච්ච සමුප්පාදය අවබෝධය තුළ, මේ පිරිසිදු

ධර්මය තුළ ඒ රාග ද්වේශ මෝහ කෙලෙස් සංසිදෙන්නේ සම්මා දිට්ඨියට අවොත් පමණයි. ඒ සම්මා දිට්ඨිය කුමක්ද කියන එක ඒ දර්ශනය මොකද්ද කියන එක ඒ දර්ශනයට පත්වෙන්නේ කොහොමද කියන එක ගැන බොහෝ දෙනෙකුට අවබෝධයක් නෑ. අපි ඔබට ඉදිරිපත්කරන්නේ අන්න ඒ සමාජයට ගිලිහුණු කාලයේ වැලි තලාවට සැගව ගිය ඒ දර්ශන සමාපත්තිය කුමක්ද කියන එක. ඒ දර්ශනයට පත්වෙන්නේ කොහොමද, වැටහෙන්නේ කොහොමද කියන එක ගැන, ඒ සදහා ඔබට දේශනා විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කරල තියෙනව, ඒව ඔබට අසන්න ලැබෙනව ඒ හැම එකකම තියෙන්නේ දර්ශනය ලබන හැටි. ඒ දර්ශන විසුද්ධියට පත්වන ආකාරය, ඒ දර්ශන සමාපත්තිය තමයි ඇත්තටම අවබෝධ කල යුත්තේ, මේ දර්ශන සමාපත්තිය ඇති කර ගැනීමට එන බාධාව පිරිහීම තමයි මේ උපක්ලේෂ සූත්‍රයෙන් බුදුන්වහන්සේ පෙන්වන්නේ. මේ සමථ සමාධියක් වඩන කොට ඇතිවන බාධා නෙමේ, මේ වාක්‍යක් වාක්‍යක් ගානේ පෙන්වන්නේ මේ අනිමිත්ත සමාධිය. අනිමත්ත කියල කියන්නේ සමථ සමාධියක් නෙමේ. සතිනිමිත්ත වඩල ඒ තුළින් ලබන සමාධියක් නෙමේ. ඒක සමථය තුළ ලබන සමාධියක්, ඒක ලෞකිකයි නමුත් අපි කථා කරන්නේ ලෝකෝත්තර සමාධියක් ලබන ආකාරය, **අනිමිත්ත සමාධියක් ලබන අකාරයයි මේ කථාකරන්නේ හුස්ම දිහා බලාගෙන ඉදල "උග්ගහ නිමිත්ත පටිගහ නිමිත්ත ලබල හුස්ම නොදැනෙන සමාධියක් නෙමේ.** ඒ පළමු දෙවන තෙවන ධ්‍යාන ලබන සමාධි නෙමේ. අරූපි සමථයක් නෙමේ මේ කතාකරන්නේ අවිතක්ක අවිචාර සමාධියක් අනිමිත්ත සමාධියක් ගැන.

සිතට එන අරමුණේ සත්‍ය දකින තැනයි ඔබට මේ සමාධිය ලැබෙන්නේ. මුලින්ම ඔබ හදුනාගන්න කව්ද මේ

සමථයානිකයා, කව්ද මේ ශුෂ්කයානිකයා, කියල දැන් මොකක්ද මේ සමථ විපස්සනා යුගනන්දන කියන්නේ මේක හොඳින් ගලපගන්න. පොත් එක එක විදිහට ලියවිලා තියෙන්න පුලුවන් නමුත් අපි සත්‍ය හඳුනාගත යුතුයි. සිතට එන අරමුණේ සත්‍ය දකිනවනම්, ඒ සත්‍ය දකින්න බෑ සිත විසිරෙන කොට ඔබට පළමු දෙවන තෙවන චාතුර්ථ ධ්‍යාන තුළ බුදු සමය තුළ ප්‍රසිද්ධයි ලෞකික ධ්‍යාන. සංඥා සුකුම කරගෙන ඉන්න ධ්‍යාන සිත විසිරෙන්නේ නෑ, අරමුණ හොඳින් දකින්න පුලුවන් දුකින් මිදෙන, සිතෙන් මිදෙන, මගක් තමයි නිවන් මග කියන්නේ. සිතේ සත්‍ය දැකීමකින් තොරව එය කරන්න බෑ. මොකද එහිදී ආර්‍ය්‍යඅෂ්ඨාංග ික මාර්ගය හමුවෙන්නේ නෑ. ඒ තුළ ඔබ මිථ්‍යා දෘෂ්ඨියයි සම්මා දිට්ඨිය හමුවෙන්නේ නෑ. සම්මා දිට්ඨිය නැතිව සම්මා සමාධියක් හමුවෙන්නේ නෑ. එතකොට සමථයානිකයා කියල කියන්නේ "සමථ පුබ්බංගමා ධම්මා විදර්ශනාභාවේ තබ්බා" කියල කියන්නේ සමථය හොඳින් වඩල තියෙන අය යමෙකුට විදසුන් නුවන හොඳින් වැඩෙනව නම් ධ්‍යාන මට්ටම් වලත් සිත පිහිටනවනම් ඔහුගේ දුර්වලකම කුමක්ද? විදසුන් නුවන නැති කම, අන්න එතන තමයි **"විදර්ශනා පුබ්බංගමා ධම්මා"** කීවේ ඒ කෙනා සමථය හොඳින් වැඩිය යුතුයි **"විදර්ශනා පුබ්බංගමා ධම්මා සමථ භාවේතබ්බා"** කියල කීවේ මේ දෙන්නට. අපට වැටහෙනව සමථ විපස්සනා යුගනන්දන කියන දෙකම තමයි නිවන්මග කියල කියන්නේ එතකොට ශුෂ්ක යානිකයා කියන්නේ විදර්ශනාව හොඳින් වැඩෙන කෙනා. සමථයානිකයා කියල කියන්නේ සමථය හොඳින් තියෙන කෙනා. හැබැයි මේ දෙන්නටම විදර්ශනාව අවශ්‍යයි, ශුෂ්කයානිකයාටත් විදර්ශනාව අවශ්‍යයි. එතකොට **"ඛණික සමාධිය"** කියන්නේ එක අවස්ථාවක් එනව සමථයානිකයාටත්

විදර්ශනායානිකයාටත් දෙදෙනාටම මෙ අවස්ථාව එනවා, ඒ කියන්නේ අනිමිත්ත සමාධිය තුළ ඒ කියන්නේ අසමාහික සමාහිත කියන තැන තමා ඒ අනිමිත්ත ඒ මෙහොතට අවධිය. ඒක මේ අනිදස්සන විඤ්ඤාණය මිදෙන අවස්ථාව ගැන කථා කරන්නේ. "**භද්දේක රත්න**" සූත්‍රය තුළ උත්තරීතර හුදෙකලාව, මෙහොතට අවධිය කියල කියන්නේ ඕක තමයි. "**අනිමිත්ත සමාධිය**" ගැනයි මේ කථාකරන්නේ ඒ කියන්නේ මේ ලෝකෝත්තර සමාධි ගැනයි කථා කරන්නේ, මේ මෙතනට බාධා තියෙනව උපක්ලේශ කියල කියන්නේ ඒවා ඒ කියන්නේ සිතිවිලි වලින් මිදෙන අවස්ථාවක් එනව. ඒ දර්ශනයට පත්වෙන තැන, වෙනද විදිහටම ඇහෙනව, පේනව දැනෙනව. ඒ වුණාට ඒ හැම දේකින්ම මිදුණු ස්වභාවයක් පවතිනව. ඒ අවස්ථාව තමයි දර්ශනය කියල කියන්නේ, ඒ විදර්ශනා. විදසුන් නුවනින් තමයි ඒක දකින්න වෙන්නේ. ඒකයි විදර්ශනා කිවේ, ඒකයි විදර්ශනාවෙන් තොරව භාවනාවක් නෑ. කිවේ, පටිච්ච සමුප්පාදය තුළයි මෙය සිදුවෙන්නේ එයයි සත්‍යය. සිත ගැන මනා අවබෝධයක් තිබුනොත් තමා, ඒ සත්‍ය ඤාණය තුළ තමයි එය ආත්මයක් නැති බව, ආනාත්ම ධර්මයක් බව අවබෝධ කරගන්නේ එම නිසයි "**කල්‍යාණ මිත්‍රයා මතයි ආනන්ද මේ සාසනය පවතින්නේ**" කීවේ අන්න ඒ නිසයි මෙතන අත්තටම සද්ධර්ම ශ්‍රවණය දුර්ලභයි කීවේ. බුදුන් වහන්සේ පැහැදිලි කලේ මෙතනදී දර්ශනය. බුද්ධ දර්ශනය ලෝකයට හෙළිකළේ මේ දර්ශනය මොකක් ද කියන එක "පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු" කියපු තැන දේශනා කරන්නේ බුද්ධ දර්ශනය කුමක්ද කියන එක. පටාචාරාට දේශනය කරන ධර්මය කුමක්ද කියන එක, කිසා ගෝතමියට දේශනා කල ධර්මය කුමක්ද කියන එක අංගුලිමාලට දේශනා කල ධර්මය කුමක්ද කියන එක, අපිට

මේ දර්ශනය පැහැදිලි වෙනව. ඒ කෙන කෙනාට දේශනා කල ධර්මය තුළින් මේ එකම දර්ශනයයි නමුත් මේ සඳහා තොටුපොලවල් තියෙනවා එකම ගඟට යන්න, එයට බහින්න කෙන කෙනාගේ ස්වරූපය, ඒ අනුව පෙන්වන්නේ අනිමිත්ත සමාධිය. ආත්මයක් නැති බව.

අනාත්ම ධර්මය හමුවෙන්නේ "**පටිච්ච සමුප්පාද ධම්මේ සු ධම්මං**" කියන තැනින්. ඇත්තටම මේ ධර්මය අති ගාම්භීරයි. ඇත්තටම ඔබ මේ ධර්මය ශ්‍රවණය කරන්න. මේ අවබෝධය තුළින්මයි දර්ශනයට පත්වෙන්නේ.අවබෝධයෙන් තොරව කිසි කෙනෙකුට අනිමිත්ත සමාධියක් ඇති වෙන්නේ නෑ. අනිමිත්ත සමාධිය ඇතිවන්න නම් ඒ නිමිත්තක් නැති ස්වභාවයට පත්වන්නේ කොහෙමද කියල අවබෝධයක් තිබිය යුතු වෙනවා සමථය වඩල අනිමිත්ත සමාධිය ඇති වෙන්නේ නෑ. එතන නිමිත්තක් තියෙනව, නිමිත්ත බැස ගන්නව අසඤ්ඤ තලය දක්වා නිමිත්ත තියෙනවා. අරූප සංඥාවක් හෝ රූප සංඥාවක් හෝ තියෙනවා ඒ කියන්නේ ඒ අරූපය තුළත් කෙනෙක් ඉන්නවා. මෙතනදී අප කතා කරන්නේ **පොට්ටපාද සූත්‍රය තුළ විවේක, සුඛ සුඛුම ප්‍රිති සුඛ යන සංඥා. සංඥා අභිසංකරණ නිරෝධයක් ය මහණෙනි, "පොට්ඨපාද මේ නිවන් මග කියල පෙන්වන්නේ"** හිමිදිරි උදෑසන තණ අග පිණි බිඳක දේදුන්නක් යමක් දකීද ඊටම අදාළ වූ කෝණයකින් දැකිය යුතුයි මහණෙනි" කියල කීවේ ඒ නිසයි මහණෙනි. ඒ කෝණය මොකක් ද කියල දැකිය යුතු වෙනව. "අශ්වලෝමයක් සියක් කඩකට පැලෙන්න හැකියයි මහණෙනි ඒත් මෙය සුඛර නොවේ" කියපු එක මොකක්ද කියල දැකිය යුතු වෙනව. "ඉදි කටුවක් මහ මුහුදේ වැටුනොත් එය සොයා ගත හැකි වුවත් මෙය සුකර නොවේ", කීවේ කුමක්ද? මෙතන තියෙනව ඉතාම සියුම් කාරණයක්

ඒ සවිචක්ක සවිචාර සමාධිය තුළ ඇති වෙන දර්ශනය. ඒ කුමක්ද? ඔබගේ ඔය බොළඳ මනසට මේ නිවන් මග හරවන්න බෑ. නවතන්න බෑ, ඔබ අද කට මැද දොඩවනවා වෙන්න පුලුවන් ඔබ එක එක විකාර දොඩවනවා වෙන්න පුලුවන්, ඒත් ඔබ ඒකත් හොඳට මතක තබා ගන්න. බාහිර ඇත්ත කරගෙන ඉන්න තාක්කල් ඔබ ඉන්නේ මිථ්‍යා දෘෂ්ඨියේ ඔබ මහ තෙරක් විදිහට හිටියත් ඒත් මිථ්‍යා දෘෂ්ඨියේ, ඔබ ඇත්තටම මේ මිථ්‍යා දෘෂ්ඨිය හඳුනාගන්න. මිත්‍යා දෘෂ්ඨිය පෙන්වන්නේ ඔන්න ඔතනින්, යමෙක් මේ බාහිර ඇත්ත කර ගත්ත තැන, ඇත්ත කරගත්ත භූමිය මිථ්‍යා දෘෂ්ඨික භූමියයි. හැබැයි යමෙක් සිතට එන අරමුණේ දෙයක් නැති බවත්, බාහිරේ දෙයක් නැති බවත් අර සතා සිව්පවා පවා ඉන්නේ බාහිර ඇත්ත කරගෙන බාහිර දෙයක් කරගෙන එහෙම තිබුණොත් තමා හොඳත් තියෙන්නේ, නරකත් තියෙන්නේ දිව්‍ය ලෝක, නිරය තියෙන්නේ ඇත නැත අන්ත තියෙන්නේ බාහිර දෙයක් තියෙනවා  කියලා ගත්ත තැනයි.  ඇත නැත කියලා ගන්න අන්ත වලින් මිදුණු දහමක් දේශනා කරනවා **"මජ්ජේ ඤාණං"** කියලා. මජ්ජේ සූත්‍රය තුළ

**"යෝ භන්තේ විදිත්වාන මජ්ජේ මන්තා න ලිප්පතී**

**තං බෘහි මහා පුරිසෝ සේද සිම්භනී මජ්ජගා"**

ඇත නැත අන්ත වලින් මිදුණු දහමක් බුදුන්වහන්සේ ලෝකයට හෙළි කරනවා, එතනයි අජ්ජත්ත බහිද්ධා කියල අන්ත දෙකක් පෙන්වලා ඒ අන්ත දෙකෙන් මිදුණු දහමක් බුදුන්වහන්සේ දේශනා කරනවා. නාම රූප කියන මේ අන්ත දෙකම තමා අජ්ජත්ත බහිද්ධා කියල ඔබ මේ ගන්නේ, ඔබ අත්දකින අන්ත දෙක එ තුළින් තමයි අජ්ජත්ත බහිද්ධා කියන අන්ත දෙක ම. ඒ තුළින් තමයි සිත හට ගන්නේ.

සිතක් හටගන්නේ කෙසේද ශබ්ද වර්ණ එකතු වෙලා සිතක් හටගන්නේ කෙසේද? එලය නම් ආත්මයයි ඒ ආත්මය තුළ අපි ඉන්නේ රැවටිලා "**දිට්ඨේ දිට්ඨ මත්තං සුතේ සුත මත්තං විඤ්ඤාතේ විඤ්ඤාත මත්තං**" කියන තැන මේ ධර්මය දැක්කොත් ඔබට වැටෙහේවි. ආයතන නිරෝධයයි නිවන කියල. "**සළායතන නිරෝධෝ නිබ්බානං**" කියල සළායතන වල නිරෝධ යයි නිවන කියල එහෙනම් "**ආයතනං පටිලාභෝ අයං වුච්චති ජාති කියලා කියන්නේ** මහණෙනි, **ඇසේ උපතයි උපත එයමයි සළායතන නිරෝධය කියන්නේ එතනමයි.**"

ඇසින් බලල ඒක දෙයක් කියල ගත්තොත් ඒක එන්නේ සියල්ලම එකතුවෙලා. ශබ්ද වර්ණ සියල්ල එකතුවෙලා එහෙම වුනොත් තමා මනෝ කියන විඤ්ඤාණය තියෙන්නේ "**මනසංච පටිච්ච රූපේ ච උප්පජ්ජති මනෝ විඤ්ඤාණං**" ගත්තොත් එහෙම වුනොත් තමා පටිඝ සම්පස්සයට අධිවචන සම්පස්සයත් එන්නේ ඒ කථාව අපට හමුවන්නේ ඒ දෙයක් කර ගැනීමයි. ඒ තුළ තියෙන්නේ රැවටීමයි. ඒ කියන්නේ පුංචි බබා ළග තියෙන්නේ "**පුබ්බේ නිවාසානුස්සති ඥාණය.**" ඒ කියන්නේ පුංචි දරුවට එහෙම නෑ පෙර සිත් කද පිළිවෙල දකින ඤාණය.

අපි කොහොමද මේ උපදින්නේ, ලෝභයක් තිබුණේ නෑ, ද්වේශයක් තිබුණේ නෑ, මෝහයක් තිබුණේ නෑ අද මේ වන විට රාග, ද්වේශ, මෝහ සිත් හටගත්තේ කෙසේද කියල දකින්නේ පොඩි දරුවට එහෙම දෙයක් තිබුණේ නෑ. "ශුසවයයි" පොඩි දරුවගේ සිත ප්‍රභාස්වරයි "**පභස්සරං චිත්තං**" මේ පුංචි දරුවාගේ ප්‍රභාස්වර සිත රාග ද්වේශ මෝහ බවට පත්වුනේ කොහොමද? ඒ කෙලෙස් හටගත්තේ

කොහොමද? ඇසින් රූප බලල දෙයක් කියල ගත්ත තැනයි ඒක කෙසේද ගත්තේ ගර්බයෙන් පුංචි දරුවා ඉපදෙන කොට ඒක උපමාවකින් කියනව නම්, අම්මාගේ හැඩතලය එනකොට පුතේ මේ අම්ම කියන කොට අම්ම කියන හැඩ තලය එකතු වෙලා පුතේ මේ අම්ම කියන කොට දෙයක් කර ගත්තොත් අන්න එතනමයි උපාදානය තියෙන තැන. **"අජ්ඣෝසාය තිට්ඨති"** දෙයක් කියල ගත්ත නිසා අන්න රූපය ඇත්ත වුණා."යාරූපේ නන්දි තදුපාදානං භවෝ" අන්න එතනම භවය ඇති වෙනව උපාදානය ඇති වෙනව, එතනම භවයත් ඇති වෙනව, මේ මොහොතේම සිතට එන අරමුණ ඇත්ත කරගත්ත තැන උපාදානය භවය එතනම හැදෙනව **"යා රූපේ නන්දි තදුපාදානං භවෝ භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස" සියල්ලම තියෙන්නේ එක අරමුණකයි.** එක අරමුණක සත්‍ය දැකල මිදෙන්න ඕන. ඇත්තටම එලොවත් මිදෙනව මෙලොවත් මිදෙනව, මේ අරමුණේමයි දෙලොවම මිදීම තියෙන්නේ දෙයක් කියල ගත්තොත් ආයතන සදා ගත්ත පුටු, මේස, ඇදන් කියල ගත්තොත් ගස් කොලන් තියෙනව මෙලොවක් තියෙනව කියල ගත්ත තැනයි ආයතන වල උපත එහෙනම් මේ මොහාතේ මේ අරමුණේ උපතයි මෙලොවක් තියෙනව හැබැයි එතන සත්‍ය දැක්කොත් යථාභූත ඥාණයෙන් දැක්කොත් ඔබ එතෙර වෙනව. එලොවයි, මෙලොවයි දෙලොවම තියෙන්නේ මේ එකම අරමුණේ. එය පෙර පසු නොවී දැකීම ඒ නිසයි මෙය පච්චුප්පන්න ධර්මයක් කියල කිව්වේ. මේක සන්දෘෂ්ඨිකව සිහියට හසුවෙනව. ඤාණයට හසුවෙනව යෝනිසෝ මනසිකාරයත්, යථාභූත ඤාණයත් ඔබ නිවන කරා ගෙන යනව.

කුමක්ද මේ මොහොතේ එන අරමුණ දෙයක් කරගත්තොත් එයයි සමුදය සත්‍යය. දෙයක් තියෙන තැනමයි දුක්ඛ සත්‍යය. දුක දුක්ඛං, සුඛ දුක්ඛං සියල්ලම දුක කියන්නේ දෙයක් කියල ගත්ත තැනයි, දෙයක් කියල ගත්ත තැන දුකමයි. ඒ කියන්නේ එතන අගයක් තියෙනවා ඒ අගය තුළම දෙයක් වගේ නිරූපනය වෙනවා. එතන කෙනෙක් ඉන්නව **"ඒතං මම ඒතෝ හමස්මිං න මේ සෝ අත්තා"** මම මගේ ආත්මය කියල කියන්නේ එහෙම නම් මේ කාරණාව තුළ චතුරාර්ය සත්‍යයත් මේ අරමුණේමයි එහෙනම් පටිච්ච සමුප්පාදයත් මේ අරමුණේමයි, දෙයක් කියල ගත්තොත් සමුදය සත්‍යය එතනමයි, එතනමයි දුක්ඛ සත්‍ය දුක්ඛ සත්‍ය තියෙන තැන ඒ මාර්ග සත්‍ය දැකීමයි, චතුරාර්ය සත්‍ය, එහෙනම් ඒ අරමුණේ සත්‍ය දැකල මිදීමයි, අරමුණේ සත්‍ය දැකල දෙයක් කියල ගත්ත නිරෝධ සත්‍යය, ඒ අරමුණ දෙයක් බවට පත් වන්නේ නෑ. ශබ්ද වර්ණවලට කොහෙන්ද ආත්මයක්? ආත්මයක් හමුවන්නේ නෑ. දෙයක් තිබුණොත් තමයි ආත්මය, ආත්මය කියන්නේ දෘෂ්ඨියක් මැරෙන්නේ හිතද කයද කියල ඇහුවේ ඒ නිසයි. සිත මැරෙණවානම් මේ හැම මොහොතේ ම සිතක් හටගෙන නිරුද්ධ වෙනව ඒ සිතේ සත්‍ය දැකීමයි ක්ෂණ සම්පත්තිය කියල කියන්නේ, එක් සිතක උදය-වැය දකින්නාට සම්මුති මරණය හමුනෙවේ කීවේ අන්න ඒ නිසයි. මරණයක්, මරබියක් එන්න කෙනෙක් හමුවෙන්නේ නෑ. ක්ෂණයක් ක්ෂණයක් පාසා සිතක් හටගෙන නිරුද්ධ වෙනවා පවතින සිතක් නෑ. මේ මොහොතේ හුස්ම ගියොත් ඒත් සිතක් ඉපිද නිරුද්ධ වෙනව එපමණයි. එහෙනම් ඒ හැම මොහොතකම එයට ක්ෂණය පමණයි, **"ප්‍රභාස්වරං චිත්තං"** කීවේ ඒකයි, ඒ ප්‍රභාස්වර සිතයි ක්‍රියාවලියයි මතු වෙන්නේ රාග, ද්වේශ මෝහ සංසිදෙන්නේ මේ දකින තැන, මේ මොහාතේ එන

අරමුණේ දකින්න සත්‍ය දකින මෙතනයි පටිච්ච සමුප්පාදය මේ එන අරමුණේ දකින්න ඒ ක්‍ෂණ සම්පත්තිය දැකීමෙන් ඒ සද්ධර්ම ශ්‍රවණය තුළින් ක්‍ෂණ සම්මත්තිය දැකීමයි. ක්‍ෂණ සම්පත්තිය යනු මේ මොහොතේ සත්‍යය දැකීමයි මේ දැනීම තුළ කුමක්ද සිද්ධවන්නේ, පටිච්ච සමුප්පාදය කියන්නේ කුමක්ද? අවිද්‍යාව කියන්නේ කුමක්ද? දෙයක් කර ගැනීමයි සංඛාර කියන්නේ ශබ්ද වර්ණ එකතු වෙන එකයි ඒ එකතු වෙන එකයි විඤ්ඤාණය කියන්නේ, නාම රූප කියන්නේ එයමයි. සළායතන කියන්නේ එයමයි, එතකොට පස්ස පච්චයා වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කිව්වේ ඒකමයි. අපි හදාගත්ත උපාදානස්කන්ධය "**යං වේදේති තං සඤ්ජානාති යං සඤ්ජානාති තං විතක්කේති**" මුලු පටිච්ච සමුප්පාදයම මේ අරමුණේ.

අතීතය ගැන හිතුවත් මේ මොහොතේ, අනාගතය ගැන හිතුවත් මේ මොහොතේ, මේ මොහොතත් ඇත්තක් නොවේ සත්‍යක් වෙන්නේ නෑ.එහෙනම් තුන් කාලයම බොරුවක් එක මොහොතක් වත් පවතින්නේ නැ ඒකයි පච්චුප්පන්න ධර්මය කියල කීවේ. එහෙනම් ඔබට හමුවෙනව සත්‍ය ධර්මය මොකක්ද සත්‍ය ධර්මය එය සාන්දිට්ඨිකයි, අකාලිකයි කාලයක් නෑ. තුන් කාලයටම අයිතියි ඒහිපස්සිකෝ, ඕපනයිකෝ, පච්චුප්පන්න, ඕන කෙනෙකුට බලන්න පුලුවන් අන්න පච්චුප්පන්න ධර්මය ඔබට හමුවෙනව මේ සත්‍ය ධර්මය. ඔබට හෙළිකිරීම ඉතාම අසීරු වෙනව ඉතාම දුර්ලභයි මේක අවබෝධ කරගැනීම. මේ ක්‍ෂණය අවබෝධ කරගැනීම පහසු නෑ, මේ අනුත්තරත්වය කරා යන ගමන පහසු නෑ, පුද්ගල දෘෂ්ඨිය අතහැරෙන තැන, ඒ අනාත්ම ධර්මය හමුවෙන තැන, අන්න එතනයි අනිමිත්ත සමාධිය, එතනයි දර්ශන සමාපත්තිය, දර්ශනය දකිනව කියන්නේ දෙයක් නැති

සම්මා දිට්ඨිය එයයි **"දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නෝ කාමේසු විනෙය්‍යය ගේධං නහිජාතු ගබ්භසෙය්‍යයං පුනරේතිති"** නැවත උපතක් නෑ, අනාගාමීත්වය තුළින් අරිහත්වය කරා ඔබ රැගෙන යනවා. අනාගාමී, නැවත උපතක් නෑ එහෙනම් සෝවාන්, සකෘදාගාමී, අනාගාමී අරිහත්වය කරා යන නිවන් මග මෙයයි. මහා සිංහනාදයයි, බුද්ධ ආඥාවයි, බුද්ධ කියන්නේ, බුද්ධ කියන්නේ පුද්ගලයෙක් නෙමේ, ඒකයි "උපක" අහන්නේ ස්වාමීනි ඔබ කව්ද? මනුෂ්‍යයෙක්ද? දෙවියෙක්ද? ගන්ධබ්බයෙක්ද? බ්‍රහ්මයෙක්ද? ස්වාමීනි ඔබ කවරෙක්ද? **"බුද්ධ"** බුද්ධ කියන්නේ බුදුදහමේ න්‍යායයි. අනිමිත්ත, ශූන්‍යත ස්වභාදහමයි, චේතෝ විමුක්තියයි. බුද්ධ කියන්නේ ශූන්‍යතාවයයි සිතට එන අරමුණේ සත්‍ය දැකීම, සදා සුවය අමරණීයත්වයට පත්වන්නේ මර බියක් නැති වන්නේ සත්‍යවයෙක් පුද්ගලයෙක් හමුනොවන්නේ අනාත්ම ධර්මය තුළයි. මේ සත්‍ය ධර්මය කිසිවෙකුටත් බොරු කල නොහැකියි. කිසිදා මේ සත්‍ය ධර්මය වෙනස් කරන්න බෑ සත්‍ය නම් සත්‍යමයි ඒ සත්ව පුද්ගල ස්වභාවයෙන් මිදුණු ඒ අප්‍රමාණ චේතෝ විමුක්තියයි, මහා මෛත්‍රියයි උපදින්නේ, එය අවධිවන බුද්ධ ස්වභාවයයි. "**යෝ ධම්මං පස්සති සො "මං පස්සතී"** කීවේ අන්න ඒකයි "**නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං**" කීවේ ඒකයි. "**අනිමිත්තයි ශූන්‍යතයි අප්පනිහිතයි" චේතෝ විමුක්තියයි සිතට එන අරමුණේ සත්‍ය දකින තැන, ඒ සදා අමරණීයත්වයට පත්වෙන තැන, මර බියක් නැති තැන, මරණයක් නැති මරබියක් නැති සත්වයෙක් පුද්ගලයෙක් නැති ඒ අවබෝධ ඤාණය** මේ සත්‍ය ධර්මය කිසිවෙකුටත් බොරු කළ නොහැකියි ඒ සැම පුද්ගල ස්වභාවයෙන් මිදුණු අප්‍රමාණ චේතෝ විමුක්තියයි උපදින්නේ "**යෝ ධම්මං පස්සති සෝ මං පස්සතී**" කීවේ

අන්න ඒ නිසයි. යමෙක් ධර්මය දකීද **"නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මො මේ සරණං වරං"** කීවේ අන්න ඒකයි. ධර්මය දකින්නා ඒ සිතිවිලි වල සත්‍යයත් දකින බවයි විඤ්ඤාණ මායාව තුළ සත්‍යයක් නෑ එහෙනම් ඒ සත්‍යක් නැති බව දකින තැනයි අන්න **"ධම්මං සරණං ගච්ඡාමි"** කියන්නේ එය **අනිමිත්තයි, ශුන්‍යතයි, අප්පනිහිතයි** මේ ශුන්‍යත පටිසංයුක්ත ධර්ම දේශනා කිරීම අතිදුර්ලභයි. මේ **"බුද්ධෝත්පාද"** යුගයයි මේ කාලයේ අති දැවැන්ත සිංහනාදයක් සිදුවෙන මේ ධර්මය ඔබ ශ්‍රවණය කරනව ඒකාන්තයෙන් ඔබ නිවනට පත්වෙනව. මේ අවබෝධය ඇති කෙනෙකුට කිසිදා කිසි දුකක් ඇති වීමට හේතුවක් නෑ. ඒ කියන්නේ සිතට එන අරමුණේ සත්‍ය දකින තැන සිතිවිලිවලින් මිදුණු තැන,

සිතින් මිදෙන මග දුකින් මිදෙන මග

නිවන් දකින මග එයයි නිස්සරණ මග

ඒ කියන්නේ බාහිර බඩු මුට්ටු අත්හරින එක නෙමේ, සිතට එන සිතිවිලි වලින් මිදෙන මග මේ සියල්ලම තමන්ගෙම සිත බව, සිත කියල දෙයක් නැති බව, එයයි සත්‍ය, එහෙම නම් "සංඝං සරණං ගච්ඡාමි කීවේ එන එන අරමුණේ සත්‍ය දකින තැන **සංඝං සරණං ගච්ඡාමී කීවේ නත්ථිමේ සරණං අඤ්ඤං කීවේ අන්න ඒ නිසයි. "නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මෝ මේ සරණං වරං"** කීවේ දෙයක් නැති බව එය දකින්නා තමයි නත්ථි මේ සරණං අඤ්ඤං සංඝෝ මේ සරණං වරං කීවේ. ඔබ අසරණ වෙන්නේ සිතිවිලි නිසා ඔබ සිතිවිලි වල සත්‍ය දකිනවා නම් ඔබ අසරණ නෑ. ඔබට වෙන සරණක් නෑ ඒකයි කීවේ "නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධෝ මේ සරණං වරං අන්න **බුද්ධ, ධම්ම, සංඝ** තෙරුවන් සරණ යනව කියන්නේ ඒකටයි. අන්න තෙරුවන් සරණ හැර මේ ලෝකේ

වෙන සරණක් නෑ කියල බුදුරජාණන් වහන්සේ දේශනා කලේ අන්න ඒ නිසයි. ධර්මය කියල කියන්නේ ආගමක් නෙමේ බුදුන්වහන්සේ ධර්ම දේශනා කලේ නිගන්ඨයෝ, බ්‍රහ්මණයෝ, ජටිලයෝ කියන බෞද්ධයන්ට නෙමේ. මේ ධර්මතාවය තමයි ලෝක ධර්මතාව ස්වභාවදහමයි වෙන ධර්මතාවයක් නෙමේ. ඒ නිසයි සිතෙන් මිදෙන මගයි, එය අවබෝධ වීමයි පටිච්ච සමුප්පාදය අවබෝධ වීම "**පටිච්ච සමුප්පාදෙසු ධම්මං**" කියල කීවේ ඒ ධම්ම කියල කියන්නේ දෙයක් නැති බවයි "**ඉදප්පච්චතාවය**" කීවේ අන්න ඒ නිසයි.

ඒ කියන්නේ දෙයක් නැති බවයි ඒකයි **පටිච්ච සමුප්පාදෙසු ධම්මං කීවේ "මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ. මෙය ඇති කල්හි මෙය උපදී, නිරුද්ධ වුණ කල්හි නිරුද්ධ වේ."** ඒ කියන්නේ දෙයක් නැති බවයි එය දැක්කොත් ඔබ, අන්න ඔබට ඒ ධර්මය දකින තුරු ඔබට බුද්ධ දකින්නත් බෑ, ඒ කියන්නේ ඒ ධර්මයයි ලොව පවතින්නේ ඒ සත්‍ය ධර්මය කියන්නේ ඒ ධර්මතාවය අවබෝධ කරන එකයි. ඒ ධර්මතාවය ලෝකේ දෙකක් නෑ. තව එකක් තිබුණොත් ඒකත් බොරු වෙනවා ලොව ඇත්තේ එකම ධර්මතාවයයි. එකම පරම සත්‍යයයි එනම් මේ සත්‍ය ධර්මයයි සත්‍ය නම් සත්‍යමයි සත්‍ය ධර්මය කියන්නේ ආගමක් නෙමේ. ඕනම කෙනෙකුට සිතක් තියෙනවානම් ඒ සිතේ මිදීමකුත් තියෙනව, දැන් මේ තුළ ඔබ දකින්න මේ උපක්ලේශ සූත්‍රය තුළ පෙන්වන්නේ කුමක්ද? ඒ තුළ මතුවෙන දර්ශනය කුමක්ද? දෙයක් නැති බවයි. දෙයක් නැති බව තුළ ඔබ වෙනද විදිහටම දකිනව, වෙනද විදිහටම ඇසෙනව, වෙනද විදිහටම දැනෙනව, ඔබ අන්ධ වෙලා නෑ, බීරි වෙලා නෑ, ඔබ මේ මොහොතේම අනුත්තරත්වයට පත් වෙනව සදා අමරණීයත්වයට පත්වෙනව. ඒ ලොව්තුරු

සුවයට පත්වෙනව. ඔබට වචන ගොඩක් කියන්න පුලුවන් එය මේ මෙහෙතේම සිදු වෙනව සද්ධර්ම ශ්‍රවණය තුළින්ම මෙය අවබෝධ කරන බව, ඔබ නිවන් දකින බව, බුදුරජාණන් වහන්සේ හැම සූත්‍රයක් අවසානයේ වාක්‍ය තුළ සදහන් වෙනව. **"අන්න ඛීණා ජාති වුසිතං කථං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති."**

ස්වාමීණි අත්භූතයි, ස්වාමීණි ආශ්චර්යයයි, ස්වාමීණී මට වැටහුණා, මෙසේ කියන්නේ මේ කවුරුවත් භාවනා කරල නෙමේ මේ සද්ධර්ම ශ්‍රවණය තුළයි මේ දේ සිදුවන්නේ. මේ සද්ධර්මය ශ්‍රවණය කිරීමේදී ඔබට ඇති නොහැකියාව නිසයි. එසේ සිදුනොවන්නේ එසේ සිදු වනවාමයි. මෙලෙසින් අපගේ හෙලිදරව්ව මත බෙහෝ දෙනෙකුට ඒක සිදු වන බව පැහැදිලි වෙනව. ඒ අයගේම ප්‍රත්‍යක්ෂතාවය මත ඒ අයගේ හෙලිදරව් මේ "යූ ටියුබ්" නාලිකා මගින් විකාශනය කරනව. ඒ බුද්ධෝත්පාද නාලිකා තුළින් ඒ අයගේ ප්‍රකාශ වලින් හෙලි වෙනවා. කව්රුවත් කියල නෙමේ තම තමන්ගේ අභ්‍යන්තර පරිවර්තනය තුළ සිදුවන අත්දැකීම් විස්තර කරනව. ඒ ඒ අය සසර දුකින් මිදෙන බව නිසා සම්බෝධි පරායන බව සදහන් කරනව. වොස්සග්ග පරිනාම වන බව, නිවනට නැඹුරක් කොට පවතින බව, සුගති පරායන වන බව, ඒකායන මග කීවේ මෙයයි. කායානුපස්සනා, වේදනානු පස්සනා, චිත්තානු පස්සනා, ධම්මානු පස්සනා, චිත්තානු පස්සනා ධම්මානුපස්සනා කියන්නේ මේ ස්කන්ධයක් පිළිබද අවබෝධයයි. **ස්කන්ධකාය කියන්නේ මොකද්ද? දෙයක් කියල ගත්තොත් එයයි ස්කන්ධකාය, ඇසේ උපතයි මහණෙනි ආයතනං පටිලාභෝ අයං වුච්චති ජාති, ස්කන්ධ කියල කියන්නේ එළියේ හටගන්න දෙයක් නෙමේ.**

ස්කන්ධ කියල කියන්නේ වේදනා, සංඥා, සංඛාර ඒක චිත්ත ස්වභාවයක් මේක අපි ඔබට දිගින් දිගටම පැහැදිලි කලා. "ඛජ්ජනීය වග්ගයේ" ඒ "**රූප්පණය**" නිසා හැදෙන හැටි දිගින් දිගටම පෙන්වා දුන්නා. මහා නිදාන සූත , සංචේතනා සූත්‍ර, සළායතන සූත්‍රවල විවිධාකාර විදිහට ඔබට පෙන්වා දුන්න. ස්කන්ධකාය, සක්කාය දෘෂ්ඨිය කියන්නේ දෙයක් කියල ගත්තොත්, එතන සක්කාය දෘෂ්ඨිය තියෙනව දෙයක් කියල ගත්තෙ නැති නම් සත්‍ය දැකල දෙයක් නොමැති බවට අවබෝධ වුනොත් **යථා භූත ඥාණය කියන්නේ එයයි,** සක්කාය දිට්ඨි ප්‍රහීණ වෙනව කියන්නේ එයයි, සෝතාපන්න වන එකම මග. සෝතාපන්න වෙන්නේ සත්‍ය දැකීමෙන් පමණයි. යථාභූත ඥාණය ඇති කර ගැනීමෙන් පමණයි. ඒ යථාභූතඥාණ දර්ශන ඥාණය ඔබ ඇතිකර ගන්න. ඒ දර්ශන ඥාණය තුළ උපදින ඥාණය තමයි "**දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්මන්නෝ කාමේසු විනෙය්‍ය ගේධං**" කියන තැන අනිමිත්ත සමාධියයි. මේ මොහොතේ අරමුණක් එනව ඔබ හොඳින් බලන්න පොත දකින උපමාව හොඳින් සිහි කරන්න ඔබට හොඳින් දැනේවි බාහිර පොතක් තියෙනවද? පොත කියන්නේ ශබ්දයක්, වර්ණයක්, නේ හැඩ තලයක් ඒ එන අරමුණේ ශබ්ද වර්ණවල කෙහෙද පොතක් බාහිර පොත් හමුවන්නේ නෑ පොත කියන්නේ ශබ්දයක් ඇමරිකන් ජාතිකයෙක් මේකට "බුක්" කියනව චීන ජාතිකයෙක් "චාං" කියනව "චාං" ද "බුක්" ද පොත ද ඔය භාෂාව බොරුවක් චීන, ඕක පොතක් නෙමේ "බුක්" ද නෙමේ "චාං" ද නෙමේ. ඒක තමයි සත්‍ය කථාව, ඒ කියන්නේ මේ ශබ්දයයි වර්ණයයි එකතු වෙලා චිත්තය කියල දෙයක් කරගත්ත එකයි මෙතන තියන්නේ ඒක මනෝ විඤ්ඤාණයෙන් සකස් වෙන දෙයක් "**ඒකයි චිත්තේන නීහති ලෝකේ**" කීවේ විඤ්ඤාණ මායාවක

අතරමං වෙලා කීවේ අපි ඉන්නේ මැජික් එකක් ඇතුලේ අපි ඉන්නේ මායාවක් ඇතුලේ කොටු වෙලා. ඒකයි අපි හීනෙනුත් හීන දකිනව සැබෑවෙනුත් හීන දකිනව කීවේ, මේ ආයතන වලින් යමක්ද පවසන්නේ එය හීනයක්මයි සත්‍යයක් නෙමේ. ඔබ ඔය කථා කරන භාෂාව තනිකරම බොරුවක්, එයයි සත්‍ය මෙය අවබෝධ කරන එක පහසු නෑ අවබෝධ කලොත් මොකද වෙන්නේ බාහිරෙන් මිදෙනව පොතක් බාහිරින් හමුවන්නේ නෑ අන්න අනිමිත්තයි. අරමුණෙ සත්‍ය දැකල මිදෙනව අන්න, අරමුණේ සත්‍ය දකින සීලය, අන්න ස්කන්ධයේ ඇතිවීම නැති වීම දකිනව. **"සමුදයංච අත්තගමං ච දකිනව" ඉති රූපං කියල කියන්නේ තියෙන රූපයක් නෑ "ඉති රූපං සමුදයෝ" අන්න හැඳුන හැටි දකින්න ඕන. එහෙම දැක්කොත් තමයි "ඉති රූපං අත්තගමංච" වෙන්නේ තියෙන රූපයක් නැති වෙනව පොත කියල අන්න අනිමිත්තයි, ශූන්‍යතයි අප්‍රනිහිතයි විඤ්ඤාණ අනිදස්සනං.'**

ඒ කේවට්ට සූත්‍රයේ පෙන්නුවේ මෙන්න මේ කාරණය,

ඒ කියන්නේ නාම රූප උපරුජ්ජනය වන විට දෙයක් නැති වෙනව විඥ්ඥාණය අනිදස්සන වෙනව කීවේ යථාභූත ඥාණය ඇති කෙනාට විඤ්ඤාණය පතිත වෙන්නේ නෑ. **අප්පට්ඨිතයි,** එය බාහිරින් හසුවන්නේ නෑ බාහිරට පතිත වෙන්නේ නෑ. අභ්‍යන්තර බාහිර අන්ත දෙකම නැති වෙලා යනවා. ඒ අවබෝධය තුළිනුයි නැතිවෙලා යන්නේ. එතකොට බාහිර පතිත වෙන්නේ නෑ. **අප්පතිට්ඨිත විඤ්ඤාණය, අනිදස්සන විඤ්ඤාණය කොහෙවත් හමු වෙන්නේ නෑ නිමිත්ත අනිමිත්ත වෙන තැන එහෙනම් "පඨවි ආපෝ තෙජෝ නගාරති"** කීවේ එහෙම දෙයක් වත් හමුවන්නේ නෑ එතකොට මොකද වෙන්නේ **"දීඝංච රස්සංවා අනාමුලක සුභා**

**සුභං"** දිග කොට, හීනි මහත, ඇත නැත අන්ත නෑ. දෙයක් තිබුණොත් ඔය අන්ත තියෙනව හොඳ නරක සැප දුක් කීර්ති - ප්‍රශංසා, දිග - කොට, හීනි - මහත අටලෝ දහමින් කම්පා නොවන ගුණය දෙයක් තිබුණොත් තමයි ඔබ පිං කරන්නෙත් පව් කරන්නෙත් දෙයක් නැතිනම් ඔබට පුඤ්ඤාභි සංඛාරත් නෑ, අපුඤ්ඤාභි සංඛාරත් නෑ අන්න කර්ම තුළ කර්ම භූමියක් හමුවෙන්නේ නෑ **හේතු-ඵල දහම තුළ සංවරත්තේන සීලානං කියන තැනට එනව තමන්ගේම සිත බව දැකල සියල්ලෙන් මිදෙන එක ඒ තමා උත්තරී මනුස්ස ධම්ම කියන්නේ එක තමා මහා පුරිසෝ කියන්නේ ඒ තමා "අරියානං දස්සාමි අරිය ධම්මේහි කොවිදෝ" කියන්නේ එයයි "සප්පුරිස ධම්මෝ සප්පුරිස ධම්මො විනයෝ" කියල කියන්නේ, ඒ ආර්යය විනයයි සත්පුරිස ධර්මයයි** එය දෙයක් බව දැක්කොත් එයා ඉන්නේ ආත්ම තණ්හාව තුළයි. ඔහු තණ්හාවෙන් මිරිකෙනව ගොඩ වැඩි කරගන්න උත්සාහ කරනව. ඔහු කරන්නේ මහා විනාශයක් ඒ සිතිවිලි ඇත්ත කර ගැනීමයි, අද මේ දර්ශනය නිවන් මග අහිමි වීම බෞද්ධයාගේ විනාශය නැවතත් ඒ සත්‍ය ධර්මය අවදි කල යුතුයි. ඒ තුළයි "**සංවරත්තේන සීලානං**" කියන තැනට එන්නේ. ඒ නිසයි එයා තමන්ගේම සිත දකිනව නම් එයා සොරකම් කරන්නේ නෑ. එයාට සොරකම් කරන්න බැරි වෙනව, මංකොල්ල කාරයෙක් සොරෙක් වෙන්නේ නෑ, එහෙම කරන්න දෙයක් හමුවෙන්නේ නෑ, බාහිරින් සියල්ලම තමන්ගේ සිත බව දැනෙනවා. අන්න එයයි නිවන් මග හමුවන මහා පුරුෂයා "**සප්පුරිසානං දස්සාමි**" ඒක දක්නේ මේ ධර්මය දකින කෙනාමයි. එයා "**ශූන්‍යතයි අප්පනිහිතයි චේතෝ විමුක්තියයි**" බලන්න අනිමිත්ත සමාධිය දෙයක් හමුවන්නේ නෑ දෙයක් හමුනොවන සමාධියයි අනිමිත්ත සමාධිය, දර්ශනයට පත්වෙනව කියන්නේ ඒ දර්ශනය නැති

වෙනව කියන එකයි මේ උපක්ලේශ සූත්‍රය තුළ පෙන්වන්නේ මෙන්න මේ හේතු නියාමයි. මේ දර්ශනය නැති වන්නේ අනුරුද්ධ, කියල භාග්‍යවතුන් වහන්සේ පෙන්වනව මොනවද හේතු මේ දර්ශනය ගිලිහෙන එකයි අනිමිත්ත සමාධිය ගිලිහීමට හේතු මොනවද? **"සමාධි භාවේ තබ්බං"** කීවේ වෙනද විදිහටම ඇහෙනව, පේනව, දැනෙනව නමුත් ඒ හැම දේකටම අයිති නැති මිදුණු ස්වභාවයක් විදර්ශනායානිකයාට ඇති වෙනව. **සත්‍ය දකින කෙනාට සියල්ලෙන් මිදුන සමාධියක් අත් දකිනව ඒ සවිතක්කං සවිචාර සමාධියක් ඒකට බාධා එනව. සිත විසිරෙන කොට ඒ උපක්ලේශ තියෙනව ථීනමිද්ධ මේවා තමයි මෙහි පෙන්වන උපක්ලේශ ඒවා මොනවද?**

බුදුන්වහන්සේ, අනුරුද්ධ ස්වාමීන් වහන්සේට පෙන්වනව, අනුරුද්ධයෙනි, සම්බෝධියට පෙර මටත් ඔය වගේ තිබුණා අපි කියන සමාහිත අසමාහිත සමාධිය කියල මෙතන දර්ශනය ඇති වෙනව-නැති වෙනව, මේ අනිමිත්ත සමාධිය ලබන හැටි තමා බුදුන්වහන්සේ පෙන්වන්නේ. සාධු සාධු අනුරුද්ධයිනි, මේ අළමරිය ඥාණ දර්ශනයෙන් අධිගතව, ඵාසුවිහරනයෙන් වැඩ වැඩවසනවද කියල බුදුන්වහන්සේ අහනව. අනුරුද්ධ හැමුදුරුවන්ට කියනව, එය නොලැබීමට හේතු සදහන් කරනව "ඕභාසය" කියන්නේ අවිද්‍යාව දුරු වන විට ඇතිවන විද්‍යාලෝකය හැම දෙයම පේනව, ඇහෙනව, දැනෙනව වුනාට ඒ සියල්ලගෙන්ම මිදුණු ඒ මහා ප්‍රඥාලෝකය තමයි **"ඕභාසයං ච රූපානං දස්සනංච රූපානං"** කියල කියන්නේ දර්ශන සමාපත්තිය. දර්ශනයට එනවිට අනුරුද්ධ ස්වාමීන් වහන්සේ පත්නොවුන බව පවසනව මේ දර්ශනයද රූප දර්ශනය, දර්ශන සමාපත්තිය වැඩිකල් පවතින් නෑ කියනව. දර්ශන සමාපත්තිය කියන්නේ මේ තියෙන දර්ශනයට එයා ගිය දර්ශනයක් මතු වෙනව **"මොහොතට අවදිය"** කියන්නේ

ඒක. ඒක ලැබෙන්නේ නෑ මේ සත්‍ය ධර්මය දන්නේ නැතුව ඒකයි අපි ඔබට දීර්ඝ පරියායක් පැහැදිලි කලේ, ඒ දර්ශනයට පත්වුණු කෙනා සත්‍ය ධර්මය පැහැදිලි කලයුතු වෙනව දර්ශනයට පත් වෙනව කියන්නේ මේ කාරණාව **මොහොතට අවධිය කියන්නේ අනිමිත්ත සමාධිය.**

අතීතයත් මේ මොහෙතේ, අනාගතයත් මේ මෙහොතේ මේ මෙහෙතත් පවතින්නේ නෑ. මේ සිත මේ අරමුණ අවබෝධ කරන එක මේ තුළ දෙයක් හමු නොවන ස්වභාවය ප්‍රායෝගිකව අත්දකින කොට හැම දෙයකින්ම මිදුණු සමාධියක් ඇති වෙනව. අවබෝධයෙන් ඇතිවෙන්නේ **සංඛිත්තේන නිබ්බිදාය** ආධ්‍යාත්මික දියුණුවක් වෙනව වෙනද වගේම වැඩ කරනව කථා කරනව නමුත් ඒ හැම දෙයකින්ම මිදුණ සමාධියක් ඇති වෙනව. ඒ තමයි මේ දර්ශනයට පත්වෙනව කියන්නේ ඒ තමයි මොහොතට අවදිය. මේක දර්ශන සමාපත්තියෙන් එන්න ඕන **මෙතන දර්ශනය වැහෙන එක උපක්ලේශ කියන්නේ,** බුදුන්වහන්සේ පෙන්වා දුන්න ආකාර කීපයක් පෙර පෙන්වා දුන්න, සම්බෝධියට පෙර විචිකිච්ඡා හේතුවෙන් එතනදී කියනව, විචිකිච්ඡා හේතුවෙන් මගේ සමාධිය ගිලිහෙනව සැකය, බුද්ධ ස්වභාවය, අට තැන සැකය, බුද්ධාදී අට තැන උපදින සැකය නමුත් මේ සමාධිය ගිලිහෙනව දර්ශන සමාපත්තිය නැති වෙනව මේ "ඕභාසය" කියන වචනය නිසා බොහෝ දෙනා මේක ලෞකික සමාධියට ගලපනව මෙතන කථා කරන්නේ ලෝකොත්තර සමාධියක් එය රූප දර්ශනයට එහා ගිය දෙයක් "ඕභාස" දර්ශනය කියන්නේ එයයි. මේ සමාජය තුළ ප්‍රසිද්ධ වෙලා තියෙන්නේ සමථ සමාධිය විතරයි "ඕභාසය" කියල ඇහුන ගමන් සමථ සමාධියක් කියල හිතනව එහෙම නෙමේ හුස්ම දිහා බලාගෙන සිහිය ඒකාග්‍ර කරල ලබන සමාධියක් නෙමේ මේ කියන්නේ.

බුද්ධ දර්ශනය අවබෝධ කරගැනීම තුළ දෙයක් නැති බව දැකීම තුළ ලබන අවබෝධය නිසා ඇතිවෙන සවිතක්ක සවිචාර සමාධිය ගැනයි මේ කථා කරන්නේ මෙතනදී **"යම් පරිදි විචිකිච්චාවක්"** ඇතිවුන විට මෙසේ කරමි, පැහැදිලි කලා අමනසිකරෝති මට **අමනිසිකරය හේතුවෙන් ඕභාසය අතුරුදන් විය.** මනසිකාරය තුළින් ලබන සමාධිය අමනසිකාරය තුළින් ලැබෙන්නේ නෑ, එතනදී සිතට එන අරමුණේ සත්‍ය නොදැක්කොත් අන්න සමාධිය ගිලිහෙනව. **සත්‍ය දකිනව කියන්නෙ මෙතන දෙයක් නැති බව දැකීම බාහිරත් දෙයක් නෑ සිතෙත් දෙයක් නෑ එවිටයි මේ සමාධිය උපදින්නේ. අමනසිකාරය කියන්නේ උපක්ලේශයක්** එහෙනම් විතක්ක විචාර සංසිදෙන තැන ඒ සවිතක්ක සවිචාර සමාධියයි මේ කථා කරන්නේ. මෙතනද යම් පරිදි විචිකිච්ඡාව නුපදිද මම එසේ කරමි. මේ ගැන අපි පැහැදිලි කලා විචිකිච්චාව එක් හේතුවක් බව අමනසිකාරහෝති එයත් පැහැදිලි කලා, එයට හේතු ප්‍රත්‍ය කවරේද? අමනසිකාර හේතුවෙන් මගේ සමාධිය ගිලිහී ගියේය මේ අමනසිකාර කියන්නේ මනසිකාරයෙන් ලබන සමාධියක් අමනසිකාරයෙන් ලබන්න බෑ. **එන එන අරමුණේ සත්‍ය නොදැක්කොත් මොකද වෙන්නේ අන්න අනිමිත්ත සමාධිය ගිලිහෙනවා සත්‍ය දකිනව කියන්නේ මෙතන දෙයක් නැති බව දැකීම එසේ වූ විට බාහිර දෙයක් හමුවන්නේ නෑ සිතෙත් දෙයක් නෑ එතකොට තමා සමාධිය උපදින්නේ එහෙනම් එතන අමනසිකාරය උපක්ලේශයක් මෝහයට තේරෙන්නේ නෑ විතක්ක විචාර ඇති වෙන තැන අමනසිකාරය** එහෙනම් මනසිකාර නොවෙන්න එපැයෑ මේ අමනසිකාරය උපක්ලේශයක් ඒ කියන්නේ මේ සමාධියට බාධාවක්. ඒ කොහොමද? එන අරමුණේ සත්‍ය දැකිය යුතුයි එහෙම නැතිනම් ඒක උපක්ලේශයක් තේරෙනව මේ

දර්ශන සමාපත්තිය අනිමිත්ත සමිධිය ගිලිහෙන්න හේතු බුදුන්වහන්සේ පැහැදිලි කරන්නේ.

එතකොට අපි අද දවසේ පැහැදිලි කරන තවත් කාරණයක්
**ථීන මිද්ධය**

අපි ගිය වර සදහන් කලේ නැහැ නිදිමත අලසකම ථීනමිද්ධය. මට ථීනමිද්ධ උපන අනුරුද්ධය, මට විචිකිච්චාව උපන, ථීනමිද්ධය උපන, එතකොට මේ දර්ශන සමාපත්තිය නැති වෙලා යනව, ඕභාසය නැති වෙලා යනව, බුදුන්වහන්සේ මේ පැහැදිලි කරනවා. සම්බෝධියට පෙර, මේ සම්බෝධියට පත්වෙන්න පෙර මේ අත් දැකීම් ලබපු බව අනුරුද්ධ හිමියන් පවසනව, මේ අත්දැකීම් අනුරුද්ධ හිමි සමග බෙදා හදා ගන්නව. මෙහෙම එකක් තියෙනව කියල පෙන්වන්න ඔබත් අද මේ දර්ශනය තුළ බුද්ධොත්පාද නාලිකාව තුළ දැන් දකිනව බාහිර දෙයක් නැතිබව, සිතෙත් දෙයක් නැති බව, එතකොට ඔබට තියෙනව ගැටලුවක් ඒක තමා එන අරමුණේ සත්‍ය දැකල මිදෙන කොට තව ඉදිරියට තියෙනව මේ තුළ පැහැදිලි කරන්න ඕනි. ථීනමිද්ධ ඔබටත් තියෙනව අම්මල කියනව අපිට කිසිදෙයක් වටින්නේ නෑ. ඒ කියන්නේ අභ්‍යන්තරයෙන්ම මේ දේ සිදුවෙනව අපිට දැන් නිදිමතක් දැනෙනවනේ එතකොට අර අනිමිත්ත සමාධියට තමයි මේ උපක්ලේශය එන්නේ. දැන් ථීනමිද්ධය එනව මේකට හේතු තියෙනව රාග, ද්වේශ, මෝහ එතකොට ථීනමිද්ධය අඩුයි. මොකද රාග, ද්වේශ, මෝහ තියෙන කොට හිත ගිනි ගන්නව එතකොට ඒ පැත්තට ගින්න හමාගෙන යනව දැන් එන අරමුණ මිදෙනව ගින්න නිවෙනව එතකොට ටිකක් තියෙනව ථීනමිද්ධ ස්වභාවයක් ඒකත් උපක්ලේශක් අමනසිකාරයත් දර්ශන සමාපත්තිය නැති වෙන විචිකිච්චාව එහෙමමයි

මතුවෙන්නේ, ආය සැකය ඇතිවෙන කොට ගිලිහෙනව එතකොට හොඳටම පැහැදිලියි මේ සූත්‍රය තුළ පෙන්වන්නේ දර්ශන සමාපත්තිය ගිලිහෙන ආකාරයයි. මේ අනිමිත්ත සමාධිය ගිලිහෙන හැටි තමයි '**සමාධි භාවේතබ්බං**' කියල පෙන්වන්නේ "**සමාධි භාවෙතබ්බං**" කියන්නේ මේ අනිමිත්ත සමාධියම තමයි ඒකත් පිරිසිදුව දකින්න.

ඊට පස්සේ **ඊළඟ කාරණාවට එනව තැති ගැනීමක් ඇතිවු විට මට මෙසේ සිදුවෙනව** ඊළඟ කාරණය තැති ගැනීමක් ඇතිවු විට එතකොට තැතිගැනීමක් ඇති වු විට ඒ කියන්නේ ඔබට යම් තැති ගන්නා දෙයක් සිදු වු විට සිත විසිරෙනව මෙතන අමනසිකාරය සිදුවෙනව, දර්ශනය ගිලිහෙනව, ඒ වගේම මොනව හරි සිද්ධියක් නිසා ඉපිලීම් නිසා ඉස්මතු වුනොත් දර්ශනය යට යනව එතනම තියෙනව විචිකිච්චාවත් එතනමයි මේ සේරම නීවරණ බවට පත්වෙනව අමනසිකාරය මෙතන නිවරණයක් නෙමේ, නීවරණ කියන්නේ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්චා අමනසිකාර වෙනව. අරමුණ සවිතක්ක සවිචාර ලෙස විශේෂයෙන් දකින්න තියෙනව නීවරණවලට අමතරව "**තැතිගැනීම**" ඉපිලීම් දක්වල තියෙනව. කාය දරථය ඒ කියන්නේ වෙහෙස මහන්සිය අපි භික්ෂු දුර ගමනක් පයින් යන්න වෙනව එතකොට මහන්සිය වෙහෙස වැඩි වෙන කොට අපි අවධිමත් ස්වභාවය ගිලිහෙනව කියල බුදුන්වහන්සේ පැහැදිලි කරනව. මේ සූත්‍රය ඔබට ගොඩක් වැදගත් ඒ මොකද ඔබ උත්සාහ කරනව දර්ශන දකින අරමුණේ සත්‍ය දැකල මිදෙන්න මේ මොහොතට අවධිය කියන කාරණය තමයි මේ තියෙන්නේ දර්ශන සමාපත්තිය කියල ඒ වුණාට ඒක එන්නේ නෑ අර සත්‍ය ඥාණය නැතිව ඒකයි මේ සියල්ලම එකිනෙක පටිබද්ධව පවතිනව කියන්නේ කෙනෙක් ඉන්නව මනෝමයෙන් මේ

හිත එනව ආ--- ඒක ගියා මේ මොහොතේ මොකුත් නෑ කියල මේ විදිහට ඒක විඥාණ මායාවමයි. හීනයක් කරගෙන හීන ඇතුලේ හීන දකිනව. ඒ අවධිය හීනයක් කරගෙන එහෙම එකක් නෙමේ මේ ස්වභාව ධර්මයට පත්වෙන එක සිහියටයි හමුවෙන්නේ. මේ විඥාණ මායාවට හිතල අවධියක් ඇති කරගන්න බෑ කාටවත් හිතුව කියල කාටවත් අවධියක් ඇති වෙන්නේ නෑ එහෙම වුණොත් ඒකත් මායාවක් ඇත්තටම **"අවධිය හසුවෙන්නේ සිහියටයි සියල්ලෙන් මිදුන තැන ඒ සත්වයෙක් පුද්ගලයෙක් ආත්ම දෘෂ්ඨිය නැති තැනයි ඇතිවෙන්නේ ඒ අවබෝධය ඇති කෙනාටයි මේ ස්වභාවය ඇති වන්නේ ඒකයි "පඤ්ඤාවන්තස්ස අයං ධම්මො නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස"** කියල කියන්නේ මහා ප්‍රාඥ්ඥාවටයි හසුවන්නේ මෙතනින් මේ දේශනය අපි පොඩ්ඩක් අවසන් කරනව. මෙතනදි අපි කාරණ කීපයක් ඔබට ඉස්මතු කලා ඒ තමයි මොනවද මේ ක්ලේශ ධර්ම කියන එක **දර්ශන සමාප්තියට බාධා කරන උපක්ලේශ සූත්‍රය තුළ බුදුන්වහන්සේ පෙන්වන්නේ එතනදී කාරණා කීපයක අපි ඉස්මතු කලා අමනසිකරෝති ඒක ඉතාම වැදගත් විචිකිච්ඡාව ථිනමිද්ධය තැති ගැනීම කාය දරතය වෙනද වගේම ඇසෙනව, පෙනෙනව, දැනෙනව දේට එහා ගිය ස්වභාවයක් තියෙනව ඒක ඇති වෙනනේ නෑ මේ උපක්ලේශ නිසා ඒ වගේම එතන යථාභූත ඥාණයෙන් දකින්නේ නැති නම් අමනසිකරෝති එන්නේ නෑ. නිදිමත ඒ කියන්නේ ථිනමිද්ධය තියෙනව නම් ඒත් එන්නේ නෑ ඒ වගේම තැති ගැනීමක් අපි හිතමු අලියෙක් වගේ සතෙක් හිටියොත් මෙහොතකට අවධිය එයිද? එන්නේ නෑ අපි හිතමු හිතේ ඇතිවන ඉලිප්පීම් ඇතිවෙන එයත් බාධාවක් කාය වෙහෙස නිසා අවධිය නැතිවෙනව තවත් කාරණ බොහෝ තියෙනව ඔබට පැහැදිලි**

කිරීමට අපි තවත් දේශනයකට යමු මෙහොතට අවධිය අන්න දර්ශන සමාපත්තිය ගිලිහෙන්න කාරණා තමයි ඔබට ඉදිරිපත් කරගෙන යන්නේ මේ ධර්මය තුළ ප්‍රායෝගික වෙන කෙනෙකුට මේ දේශනා ඉතාම වැදගත් අසන්න දූර්ලභයි මේ දේශනා අසන්න නෙලැබෙන්න හේතුව විදර්ශනා ධූරය නැති නිසා ඒ ප්‍රත්‍යක්ෂ තාවය නැතිව බෑ ප්‍රයෝගික නැතිව දේශනා කරන්න බෑ. අත් දැකීම් සහිතව ඔබට අද අසන්න ලැබෙනව. ඔබ හරිම භාග්‍යවන්තයි ඔබ සියලු දුකින් මිදිල කිසිදා දුගතියකට නොවැටෙන ඒකාන්තයෙන් සුගති පරායන වන **"වොස්සග්ග පරිනාම"** වන නිවනට නැමුණක් කොට පවතින ඒ සත්‍ය ධර්මයයි ඔබ කියවන්නේ ඒ දූර්ලභයි **"දූර්ලභං සද්ධම්ම සවණං"** හොදින් අසන්න අවධිය ඇතිකර ගන්න. ඒ සදහා ඇති බාධා දකින්න උපක්ලේශ සූත්‍රය ඒ වෙනුවෙන් තියෙනනේ ඒ අනිමිත්ත සමාධිය කුමක්ද කියල හදුනාගන්න ඒ සති නිමිත්ත වඩන සමාධිය නොවන බව මතක තබා ගන්න **"සමාධි භාවෙතබ්බං"** **කියන්නේ ඒ අනිමිත්ත සමාධිය නෙමේ. යථාභූත ඥාණයෙන් දැකීම තුළින් ඇති වන සමාධිය එයයි මොහොතට අවධිය එයයි විදර්ශනායානිකයාගේ සමාධිය හොඳින් දකින්න එය අනිමිත්තයි, ශූන්‍යයි, අප්පනිහිත එය තුළින් ලබන චේතෝ විමුක්තිය තුළින් ලබන සමාධිය අරහත්ත සමාධියයි. ඒ අරහත්වය කරා යන මගයි. සම්මා දිට්ඨිය ආර්යඅෂ්ඨාංගික මාර්ගය ඇතිවන්නේ ඒ හමුවන සම්මා සති කියන්නේ අනිමිත්ත සමාධියයි. සියල්ලම පවතිනව නමුත් ඒ සියල්ලෙන්ම මිදුණ සමාධියක් උපදිනව ඒ සතර ඉරියව්වෙන් තොරව ඔබට උපදිනව එහෙම නම් තෙරුවන් සරණයි.**

# උපක්ලේශ සූත්‍රය - 03

## අනිමිත්ත සමාධිය මොහොතට අවධිය විදර්ශනා සමාධිය

**මජ්ජිම නිකායේ 3 වන බාණ්ඩයේ බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ 12 වන ග්‍රන්ථය 355 වන පිටුව.**

අනුරුද්ධයෙනි, මම නොපමාව කෙලෙස් තවන වීර්යය ඇතිව නිවනට මෙහෙයවූ සිත් ඇතිව වාසය කරන්නෙමි. "ඕභාසය" ද රූප දර්ශනය ද හඳුනමි. මාගේ "ඕභාසයේ" හා රූප දර්ශනයේ **නොවේ** වීර්යයෙහි අතුරුදන් **කෙරේ** අනුරුද්ධයෙනි, මට තෙල සිත්වේ. යම් හේතුවකින් මගේ "ඕභාසය" හා රූප දර්ශනය අතුරුදන් කෙරේද ඊට හේතු කවරේද? ප්‍රත්‍ය කවරේද? අනුරුද්ධයෙනි.මට තෙල සිත්වේ, මට රූපයන් පිළිබඳ අධික නිධ්‍යානා ඇති බව උපන් මාගේ රූපයන් පිළිබඳ "අතිනිධ්‍යානා" ඇති බව හේතුකොට ගෙන සමාධි වඩා සමාධි වුන කල "ඕභාස" හා රූප දර්ශනය අතුරුදන් කෙරේ. යම් පරිදි මට නැවත විචිකිච්ඡා නූපදන ද අමනසිකාර නූපදන ද දැන් මේ මෙතනදී අපි මේ ඡේදය සම්පූර්ණයෙන් කියවල ඉමු.

පරිවර්තනය පැහැදිලි කරන්නේ සිංහල පරිවර්තනයෙන් 355 වන පිටුව, අන්තිම ඡේදය, මාගේ රූපයන් පිළිබඳ දැන් මෙතනදී සමාධි වුණ කල "ඕභාසය" හා රූප දර්ශනය අතුරුදන් කෙරේ. යම් පරිදි මට නැවත විචිකිච්ඡාව නූපදනේද,

අමනසිකාර නූපදනේද, ථිනමිද්ධය නූපදනේ ද, තැති ගැනීම් නූපදනේද, කාය දරත නූපදනේද, අනුරුද්ධ වීර්යය නූපදනේද අනිතිත විර්ය නූපදනේද, තෘෂ්ණාව නූපදනේද, "**නානත්ථ සංඥා නූපදනේ ද, රූපයන් පිළිබඳ අතිනිධ්‍යානා නූපදනේද,** මම එසේ කරමි. එතකොට බුදුන්වහන්සේ අපි දැන් මේ උපක්කිලේශ සූත්‍රය තුළ පැහැදිලි කලා බුදුන්වහන්සේ දිගින් දිගටම පැහැදිලි කරගෙන ආව. මුලින් අපි ඔබට පැහැදිලි කලා, බුදුන්වහන්සේ අලමරිය ඥාණ දර්ශනයට පත් වී ඇති බවත් බුදුන්වහන්සේ ඒ තත්වයට පත්වී සිටීද කියල අනුරුද්ධ තෙරුන් වහන්සේගෙන් ප්‍රශ්න කලා. එතකොට මූලික සිහි කිරීමක් කරනව නම් අනුරුද්ධ තෙරුන් වහන්සේ එතනදී බුදුන්වහන්සේට පැහැදිලි කලා ඒ තිරස්ථිතව පවතින්නේ නැති බව ඒ ඤාණ දර්ශනය එතකොට දර්ශනය බොහෝ කල්හිම අන්තර්හීන වෙනව කිව්ව.

එතකොට බුදුන්වහන්සේ අන්න එතනදී සම්බෝධියට පෙර අනුරුද්ධයෙනි, මටත් මෙවැනි රූප දර්ශනය හඳුනාගත් බවත් ඒ රූප දර්ශනය **අන්තර්හීන වූ බවත් බුදුන්වහන්සේ ප්‍රකාශ කරල ඒ රූප දර්ශනය අන්තර්හින ඒ කියන්නේ සැඟව ගිය බවත් සැඟව යන බවත් ඒ සඳහා කළයුතු දේ තමයි මේ උපක්ලේශ සූත්‍රයේ සඳහන් වෙන්නේ එතකොට මෙන්න මෙතනදී කතා කරන්නේ සමථ සමාධි ගැන නෙමෙයි "සමාධි භාවේ තබ්බං" කියල අපට ගොඩක් තැන් වල අපට දකින්න ලැබෙනව, සූත්‍රවල අහන්න ලැබෙනව. මෙතන බුදුන්වහන්සේ දේශණා කරන්නේ අනිමිත්ත සමාධිය ගැනයි කියල අපි නිතරම කිව්ව.**

එතකොට මේ උපක්ලේශ සූත්‍රය තුළ බුදුන්වහන්සේ පැහැදිලි කරන්නේ මෙන්න මේ අනිමිත්ත සමාධිය ගැනයි. ඒ

කියන්නේ අපි කියන්නේ අපි කියනව දර්ශනයට පත් වෙනව කියල මේ දර්ශනය කියන්නේ බෙහෝ අයට අවබෝධයක් නෑ මේ ග්‍රන්ථ ධූරය තුළ අපට පොතේ දේ, තුළින් මේ දේ විදර්ශනා තුළයි මේ දේ අත් දකින්න ලැබෙන්නේ, මේ සමථ සමාධිය නෙවෙයි මේ ලොකෝත්තර සමාධියක් ගැනයි මේ කතා කරන්නේ. එතකොට අපි අර නිතරම කියපු දෙයක් තියෙනව. වෙනද විදියටම තියෙනව, වෙනද විදියටම ඇහෙනව වෙනද විදියටම පේනව, වෙනද විදියටම දැනෙනව. හැබැයි ඒ හැම දේකින්ම මිදුණු ස්වභාවයක් මතු වෙනව. අන්න ඒ ස්වභාවය තමයි එතකොට මේ දර්ශනයට එහා ගිය දැනීමක් තමයි මේ විදර්ශණාව කියල කියන්නේ. සමාන්‍ය පේන දේට අදාළ නෑ, පේන දේට වෙනද විදියටම පේනව, වෙනද විදියටම ඇහෙනව, වෙනද විදියටම දැනෙනව. නමුත් ඒ එකකටවත් අයිති නැති හැම දේකින්ම මිදුණු අවධිමත් ස්වභාවයක් මතුවෙනව. ධර්මය අවබෝධයෙන් තමයි මේක සිද්ධ වෙන්නේ මේ අත් දැකීම් සහිතව තමයි මේක සිද්ධ වෙන්නේ. මේ අත්දැකීම් සහිතව තමයි අපි ඔබට දිගටම පැහැදිලි කරගෙන ආවේ. ඔබ දන්නව මේ බුද්ධොත්පාද නාලිකාවේ මෙවැනි දෙයක් දිගටම කියා ගෙන එනව කියල. ඔව් ඒ අපේ අත්දැකීම් අපේ අත්දැකීම් තමයි අපි ඔබට ගෙන හැර පාන්නේ ඒ ඔබට මේ ධර්මය තුළින්ම පෙන්වල දෙන්න උත්සාහ කරන්නේ ඒක. අද බොහෝ අයට අත්දකින්න ලැබිලත් තියෙනව ප්‍රායෝගිකව බොහෝ අය ඒ හෙලි කරන කාරණා මේ බුද්ධොත්පාද නාලිකාව තුළ ඔවුන්ගේම වචන වලින් ඔවුන්ම ඒ දර්ශනය දැකල දේශනා කරන ඒව හෙලිකරල තියෙනව.

ඉතින් අද බොහෝ පිරිසක් අවධිවීගෙන එනව මේ අවධි වෙන්නේ ඔබ ධර්මයටයි, ධර්මය හොදින් පිරිසිදු

වෙන විටයි මේ අවධිය ඔබට මතු වෙන්නේ. රාග, ද්වේශ, මෝහ කෙලෙස් සංසිදෙන ප්‍රමාණයට තමයි. ඒ ප්‍රමාණයට තමයි ඒ අවධිය තිරස්තිථිය කියන එක ඔබට බැස ගන්නේ, එතකොට ඔබට මේ අවධිමත් ස්වභාවයට වර්ණ, ශබ්ද, ගන්ධ, රස, පහස, උණුසුම, සීතල තද ගතිය මේ කිසිවක් අදාළ වෙන්නේ නෑ. ඒකයි ප්‍රථම නිබ්බාන සූත්‍රයේ පෙන්වන්නේ **"න පඨවි, න ආපෝ, න තේජෝ, න වායෝ කියල පඨවි ආපෝ තේජෝ වායෝ කියල දෙයක්වත් හමු නොවන බව ඇත්තටම අභ්‍යන්තරයෙන් ම ප්‍රත්‍යක්ෂතාවය තුළ තමන්ට සාන්දිට්ඨික වෙනව හැම දේකින්ම මිදුණු ස්වභාවයක් අවධිමත් වෙනව කියල.** මෙන්න මේ අවධිය ගැන තමයි මේ අවධියෙන් වාසය කරනවද කියල මේක තමයි බුදුන්වහන්සේ උපක්ලේශ සූත්‍රය තුළ අනුරුද්ධ ස්වාමීන් වහන්සේගෙන් අහන ප්‍රශ්නය, මේ අලමරිය ඥාණ දර්ශනය අධිගතද කියල. මෙතනදී බුදුන්වහන්සේ ඒ වචනයෙන්ම කියනව නම්, **"අති පන කෝ අනුරුද්ධ ඒවං අප්පමත්ථානං ආතාපීනං පහීයන්තානං විහරත්තානං උත්තරී මනුස්ස ධම්මා අලමරිය ඤාණ දස්සණ විස්සෝසෝ අධිගතෝ පාසුවිහරහෝති"** අලමරිය ඤාණ දර්ශනයට පත්වෙලා ඒ අධිගතව පහසු විහරණයෙන් වාසය කරම්දෝ කියල බුදුන්වහන්සේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේගෙන් විමසනව, අන්න එතනදී තමයි මේ අනුරුද්ධ ස්වාමින් වහන්සේ දේශනා කරන්නේ **ඉද මයං බන්තේ අප්පමත්ථා ආතාපිනෝ පහීයන්තා විහරත්තා ඕභාසංච සංජානාම දස්සනංච රූපානං සෝ කෝ පණ කෝ ඕභාසෝ න විහාරස්සේව අන්තරාදායතී දස්සනංච රූපානං නව නිමිත්තං න පටිවිජ්ජා හෝති"**

එතකොට එතනදී අනුරුද්ධ ස්වාමීන් වහන්සේ බුදුන් වහන්සේට දේශනා කරනව **අන්තර්හීන** වෙනව කියල. ඒ

කියන්නේ ඒක පවතින්නේ නැති බව ඒ කියන්නේ එතකොට "**ඕභාස**" කියන්නේ අපි දන්නව ලෞකික සමාධි වලදීත් ඒ වචන කියවෙනව ලෝකෝත්තර සමාධි වලදී මේ රූප දර්ශනයට එහා ගිය ඒ සමාධිමත් ස්වභාවය මතුවන එකට තමයි ඕභාස කියන්නේ. අපි දන්නව ආලෝකෝ උදපාදී ලෞකික සමාධි වලදීත් කතා කරනව මේ ඕභාස ගැන විවිධාකාර ඕභාස මතුවෙලා පැහැදිලි කරන්න පුලුවන්, එතකොට "**ආලෝකෝ උදපාදී, ප්‍රඥා උදපාදී, විද්‍යා උදපාදී, ඤාණං උදපාදී**" කියන තැන ඒ කතා කරන්නේ "**ඕභාස**" **සංඥා නාමිකයෙ ඉදල දස්සනංච රූපානං ඒ කියන්නේ ඒ ඕභාසය මතු වුණාද කියල අහන්නේ ඒ ධ්‍යාන අවස්ථාවට එන්න කලින් අපි දන්නව උපචාර ධ්‍යාන අර්පනා අවස්ථාවට මතුවෙන්න තියෙන අවස්ථාවට පෙර අවස්ථාව සමාධිමත් අවස්ථාවක් ඒ "ඕභාස" කියන අවස්ථාව මතුවෙන අවස්ථාව සමාධිමත් අවස්ථාවක් ඒ ඕභාස කියන අවස්ථාව මතුවෙන අවස්ථාව එතකොට සමාධිමය අවස්ථාවක් මතු වෙනකොට ඒ කියන ස්වභාවයට තමයි "ඕභාසය" කියල කියන්නේ** ඒ ස්වභාවය ඔබට අත්දැකීමක් තුළින්ම දකින්න ලැබෙයි. ඒ ඕභාස අවස්ථාව තමයි ඇත්තටම ඒ රූප දර්ශනයෙන් මිදුණු ස්වභාවය. එතකොට ඒ මිදුණු ස්වභාවය තමයි අපි මේ කතා කරන්නේ. එතකොට "**ඕභාස න විහරන්සේම අන්තරාහදායති දස්සනංච රූපානං තිරස්තමේව ඕභාස අන්තරායදාය දස්සනංච**" මේ තිරස්චිතව පවතින්නේ නෑ කියන එක රූප දර්ශනයෙන් මිදුණු ඒ ඕභාස ස්වභාවය තිරස්චිතව පවතින්නේ නැති බව එය අන්තර්හිත වන බවයි අනුරුද්ධ ස්වාමීන් වහන්සේ පැහැදිලි කරන්නේ එතකොට තමයි බුදුන්වහන්සේ කියන්නේ සම්බෝධියට පෙර ඒ රූප දර්ශනයට තිරස්තිථිව පැවැතුනේ නැති බවත් එය අන්තර්හීන

වූ බවත් බුදුන් වහන්සේ විසින් එතනදී අනුරුද්ධ ස්වාමීන් වහන්සේට දේශනා කරනව ඒ සඳහා බුදුන්වහන්සේ කටයුතු කරපු ආකාරය ඒ උපක්ලේශ සංසිඳවපු ආකාරය තමයි ඒ උපක්ලේශ ඒ දර්ශනයට පත්වෙන්නේ නැති බව. ඒ රූප දර්ශනයෙන් මිදුණු සමාධිමත් ස්වභාවය මතුවෙන්නේ නැති බව තමයි බුදුන්වහනසේ මේ අනිමිත්ත සමාධිය අවධිමත් ස්වභාවය මතු වෙන්නේ නැති බව තමයි දේශනා කරන්නේ එතකොට විදර්ශනා කියල කියන්නේ මෙන්න මේ ඇස. අපි මෙච්චර මේ කතා කරන්නේ ඇත්තටම ආර්ය අෂ්ඨාංගික මාර්ගය සම්මා දිට්ඨියට පැමිණීම තුළ මෙන්න මේ සියල්ලෙන්ම මිදුණු ස්වභාවය මතුවෙන තැනයි. මේ විදර්ශනා සමාධිය මතු වෙන්නේ එතකොට මෙතනදී වැදගත් වෙනව මේ උපක්ලේශ තියෙන තාක් කල් ඒ විදර්ශනා සමාධිය මතුවෙන්නේ නෑ කියල.

ඒ වගේම තමයි මේක අනාගාමී භූමිය දැන් අපි කතා කරනව නම් නාම රූප පරිච්ඡේදයෙන් තමයි ඒ සම්මා දිට්ඨියට එන්නේ, ඒ බාහිරත් දෙයක් නෑ, සිතෙත් දෙයක් නැති බව දකින තැන "අජ්ජත්ත බහිද්ධා" කියන අන්ත දෙකෙන් මිදුනු තැන නාම රූප උපරූජ්ජනය වුණු තැනයි. එතකොට මෙතන සම්මා දට්ඨියට පත්වන තැන, ඒ සම්මා දිට්ඨියට පත් වන තැන සිතට බැස ගන්න තැනක් නැති වෙනව. සිත ප්‍රකට වෙන්නේ නෑ බාහිර ඇත්ත වෙන්නේ නෑ. අන්න එතනයි සම්මා දිට්ඨිය, ඒ සම්මා ආජීවය, ඒ රාග, ද්වේශ, මෝහ සිත් වල දිය වී යාම රාග, ද්වේශ, මෝහ සිත් හට ගන්න දෙයක් තියෙන්න ඕන. දෙයක් හම්බ නොවන තැන රාග, ද්වේශ, මෝහ සිතක් ඒ ආරම්මණයේ බැස ගන්නේ නෑ. ඇති වෙන්න හේතු නෑ. අන්න ඒ මිදීම තුළ තමයි සත්‍යට අවධිවීම තුළ තමයි සම්මා දිට්ඨියට පත්වීම කියල කියන්නේ. එතන

තමයි රාග, ද්වේශ, මෝහ කෙලෙස් සංසිදෙන අවස්ථාව. එතකොට මේ විදියට දැන් උපක්ලේශ විදියට පෙන්නුවේ එතකොට අපි පැහැදිලි කරගෙන ආව දේශනාව මේ ඔබට ඉදිරිපත් කරන දේශනාව මේ තුළ 4 වන දේශනය. එතකොට මේ දේශනය බවට පත්වෙනවා. එතකොට දේශනා 4ක් අපි ඔබට ඉදිරිපත් කරල තියෙනව උපක්ලේශ සූත්‍රය විදියට.

එතනදී ඒ උපක්ලේශ විදියට අපි ඔබට පැහැදිලි කලා **විචිකිච්ඡාව**, ඒ වගේම **අමනසිකාරය සැකය** කියල පැහැදිලි කලා. අමනසිකාරය එතකොට සවිතක්ක සවිචාර මෙනෙහි නොකිරීම, **ථීනමිද්ධය** නිදිමත ඒ වගේම **තැති ගැන්ම** ඒ වගේම **ඉපිලීම**, ඒ වගේම **කාය දරතය** වෙහෙස වීම නිසා ඒ **අවධිමත් ස්වභාවය මතු වෙන්නේ නැති බව**. ඒ කියන්නේ මේ කතා කරන්නේ නාම රූප වලින් මිදුනු තැන, බාහිර සාමාන්‍ය ප්‍රායෝගික පැතිකඩේ දී ඔබට අත්දකින්න ලැබෙන අත් දැකීම වෙනද විදිහටම පේනව, වෙනද විදියටම දැනෙනව, ඇසෙනව කියපු තැන නමුත් ඒ සියල්ලෙන්ම මිදුණු ස්වභාවයක් අවධි වන බව. මෙය ප්‍රායෝගිකව අත්දකින්න ලැබෙනව. මෙන්න මේ අවධිමත් ස්වභාවය තිරස්චිතිව පවතින්නේ නැත්තේ මෙන්න මේ උපක්ලේශ නිසයි කියල කාය දරතය වෙහෙස තියෙන කොටත් ඒ ස්වභාවය පවතින්නේ නෑ. ඒ මිදුණු සමාධියේ ස්වභාවය. ඒ වගේම තමයි කාය දරතය නිසා සමාධි ස්වභාවය ගිලිහෙනව. **ඒ වගේම අපි මෙතනදී කතා කලා වීර්යය, දැඩි වීර්යය නිසත් ඒක අවධිමත් ස්වභාවය ගිලිහෙනව ඒ දර්ශනයට පත්වීම සිද්ධ වෙන්නේ නෑ.**

ඒ වගේමයි එතකොට අපි ගන්න **අනවරද්ධ වීර්යය**, ඒ වගේම **අතිවීර්ය ඒ කියන්නේ වීර්ය අඩු වුණත් ඒක වෙන්නේ නෑ. වීර්ය වැඩි වුණත් වෙන්නේ නෑ. ඒ වගේම**

**තෘෂ්ණාව නිසත් තණ්හාවේ ස්වභාවය නිසාත් එය ගිලිහී යනව අවධිමත් ස්වභාවය මතු වෙන්නෙ නෑ.** සත්‍යටමයි මේ අවධිය සිද්ධවෙන්නේ ඒ නිසයි මෙච්චර කාරණා පැහැදිලි වන්නේ ඒ කියන්නෙ ධර්මය සත්‍ය දකිනතාක්කල්, අවිද්‍යාව ඇතිතාක්කල් එය අවධිමත් ස්වභාවය පූර්ණ ප්‍රකට වීමකට ලක් වෙන්නේ නෑ. නමුත් අවධිමත් ස්වභාවය ඇති වන නැති වන ස්වභාවයකුත් එනව. ඒ රාග, ද්වේශ, මෝහ ස්වභාවය අනුවයි අවිද්‍යාවේ ස්වභාවය අනුවයි, මතුවීම සිද්ධ වන්නේ අරහත්ඵ සමාධිය කියන තැනේදී දවල්, රෑ දෙකේම එකම ආකාරයට මේ අවධිය මතු වෙන බව ඉදිරියේදී මේ සූත්‍රයේ ඉතිරි කොටසේදී බුදුන් වහන්සේ පැහැදිලි කරනව.

ඉතින් මෙතනදී ඉතාම වැදගත් කාරණාවක් මේ මොහොතේ ඔබට පැවසිය යුතුයි. මේ දේශනයෙන් ගියවර දේශනයෙන් ඒ ගැන පැහැදිලි කලා. ඒක තමයි නා නාත්ඵ සංඥා දැන් අන්තිමටම අපි පැහැදිලි කලේ උපක්ලේශ සූත්‍රයේ අර දැඩි වීර්යයටත් ඒ වගේම වීර්ය අඩු කමටත් දර්ශනයට පත්වීම ගිලිහෙන බව, ඒ වගේම තෘෂ්ණාව නිසාත් ගිලිහෙන බව, ඒ වගේම නා නාත්ඵ සංඥා නිසත් මේ දර්ශණය ගිලිහෙනව එතකොට නා නාත්ඵ සංඥා කියන්නේ දැන් විවිධාකාර සංඥා ස්වභාව මතුවෙනකොට ආරම්මණ වලින් ඒ අපි දන්නව රූපාරම්මණ, ශබ්ධාරම්මණ, ගන්ධාරම්මණ, රසාරම්මණ වලින් එන අරමුණුවල ඒ මතුවන ස්වභාවයට බැස ගන්නව නම් ඒ **නා නාත්ඵ සංඥා** මතු වෙනව නම් එතකොට ඉන් මිදුණු ස්වභාවය ඒ අරමුණු වලින් මිදුණු අවධිමත් ස්වභාවය ගිලිහෙන්න හේතුවත් වෙනව.

ඒ වගේම තමයි **"අනිනිධ්‍යාන"** කියන තැන අන්තිමටම පැහැදලි කල කාරණාව මේ "අනිනිධ්‍යාන" කියන එක හෙදින්

ඔබ නුවනින් දකින්න ඕන තැනක් අපි දන්නව දැන් ලෞකික ධ්‍යාන වලත් අපි කතා කරනව සති නිමිත්ත වඩන තැන සති සමාධියක් උපදිනව තදංග විෂ්කම්භන විදියට සිතට එන අරමුණු යටපත් කරගෙන එකම අරමුණක සිත පවත්වා ගන්න සමාධියක් උපදිනව. එතනදී අපි ගන්නේ නිමිත්තක්, නිමිත්තක් බැස ගන්න එකක් හැබැයි මෙතන අපි කතා කරන්නේ ඒක ලෞකික සමාධියක් එතකොට මෙතනදී අපි කතා කරන්නේ අනිමිත්තක් ඒ කියන්නේ නිමිත්තෙන් මිදීමක් ගැන. හැබැයි ඔබ බලන්න දැන් ලෞකික සමධිය ගැන බුදුන්වහන්සේ මෙතනදී පැහැදිලි කරන්නේ උපක්ලේශයක් විදියටයි ඒ කියන්නේ එකම නිමිත්තක බැසගෙන සිටීම තුළ ඒකට අපි හිතමු ඒ නිමිත්තක රූප සංඥාවක බැසගෙන හිටියොත් වෙන්නේ මොකක්ද? එතනින් ගැලවෙන්න බැරි වෙනව ඒක උපාදාන වෙනව එතකොට ඒ සමාධියක් තමයි සමාධියට උපක්ලේශයක් විදියට තියෙනව. අන්න ඒකයි මේ පැහැදිලි කරන අනිනධ්‍යානයෙන් නූපදනේද එතකොට මෙතන මේ කතා කරන්නේ උපක්ලේශයක් විදියට බුදුන්වහන්සේ පෙන්වා දෙනව මේ "**අනිනිධ්‍යාන**" කියන කාරණාව **මට රූපයක් පිළිබඳ අධික අධිනිධ්‍යාන ඇති බව උපදී. එතකොට නිදවාන කියන්නේ රූප සංඥාවක බැසගෙන සිටියොත් එතනින් මිදෙන්නේ නැති නම් ඒ අනිමිත්ත සමාධිය තුළ උපදින්න එය උපක්ලේශයක් බවට පත් වෙනව.** මගේ රූපයන් පිළිබඳ අනිනිධ්‍යාන ඇති බව හේතු කොට ගෙන සමාධිය ගිලිහින සමාධිය මුවා කල ඕභාස රූපදර්ශණය අතුරුදන් කෙරේ එතකොට මෙන්න මේ කාරණාව මේ දේශනයේදී ඔබට ඉතාම වැදගත් කාරණයක් මේ ලෞකික සමාධිය කියන්නේ ඇත්තම කිව්වොත් මේ අවසානයේදී අපි මේ කතා කරන ඒ දර්ශණයට පත්වෙනව කියන තැනේදී එයත් උපක්ලේශයක් බවට පත්වෙනව කියන කාරණාව.

ඉතින් මේක බොහෝ අය කතා නොකරන කාරණයක් සමහර විට මුලු සමාජයේම පළවෙනි වතාවට වෙන්න ඇති මේක අහන්න ලැබෙන්නේ. මේ "අනිනිධ්‍යාන පිළිබඳ ප්‍රායෝගිකව ඔබ අත්දකිනව නම් ඔබට දැනේවි මේ මොකක්ද බුදුන්වහන්සේ දේශනා කලේ කියල. මෙය උපක්ලේශයක් බවට පත් වෙනව ඔබට මේ දර්ශණයට පත්වෙන තැනේදී අර මෙහොතට අවධිය කියන කාරණාව අපි දන්නව භද්දේකරත්න සූත්‍රය තුළ කියනව "**අතීතං නන්නාගමෙයියං න පට්ටිත්තංච අනාගතං පච්චුප්පන්න යේ ධම්මා තත්‍ථ තත්‍ථ විපස්සති**" කියල කියන්නේ අතීතය ගිහිල්ල ඉවරයි අනාගත සිත් ඇවිල්ල නෑ මේ මොහොතේ තියෙන සිතත් ඇත්තක් නෙවෙයි කියල. මේ අරම්මණය ගැනයි කතා කරන්නේ මේ මොහොතේ තියෙන අරමුණත් සත්‍යක් නොවේ. සිතත් සත්‍යක් නොවේ නමුත් එතන කතා කරන්නේ ඒ භද්දේකරත්න උත්තරීතර හුදෙකලාව කියල ඒ කතා කරන්නෙත් මේ මොහාතට අවධිය කියල කතා කරන්නෙත් ඒ හැම දේකින්ම මිදුණු අවධිවන ස්වභාවයක් මතුවෙනව අන්න ඒ අවස්ථාව ගැනයි. එතකොට ඒ අවස්ථාව තමයි මේ කතා කරන අනිමිත්ත සමාධිය කියන්නේ සෑම දේම වෙනද විදියටම තියෙනව වෙනද විදියටම ඇහෙනව වුණාට ඒ කිසිවකටත් අදාළ නැති අවධිමත් ස්වභාවයක් මතුවෙනව. අපි කතා කරන්නේ මේ අනිමිත්ත සමාධිය කියල කතා කරන්නේ මොහොතට අවධිය කියල කතා කරන්නේ උත්තරීතර හුදෙකලාව ගැන කතා කරන්නේ මේ මෙතන වචනය කිව්වත් මේ ඔක්කොම වචන ලෞකිකයි මේ වචන ඇවිල්ල හුදෙක් වචනයක් පමණයි සංකාරයක් පමණයි ඒව සත්‍යක් නොවේ. නමුත් ඒ තුළ ධර්මය අපි සන්නිවේදනය සඳහා වචන භාවිතා කරනව පමණයි ඉතින් ඒව බොහොම

පරිස්සමින් හඳුනාගන්න ඕනි. අන්න බුදුන්වහන්සේ ලෞකික ධ්‍යානවල තිබුණ ඒ වචනම ලෝකෝත්තර ධ්‍යාන විදර්ශනා ධ්‍යාන වලදී පැහැදිලි කරනව. ඇත්තටම කිව්වොත් ඒක ඉතාම වටිනව. පැහැදිලි කිරීම් යමෙකුට අවබොධයට පත්වෙනව නම් ඒ කියන්නේ සිතට එන අරමුණුවල සත්‍ය දකිනව කියන්නේ දෙයක් නැති බවයි ඔබ දකින්නේ ඔබට දෙයක් හම්බවෙන්නේ නෑ අපි අහන හිතන දේවල් බාහිර නෑ ඒ වගේම අපි මේ විඤ්ඤාණ මායාවට මැවුණ ලෝකෙක ජීවත් වෙනව කිව්ව **චිත්තේන නීයති ලෝකේ සලායතන ලෝකෝ ලොකෝ** එහෙම එකක් අපට බාහිර හම්බවෙන්නේ නෑ බාහිර අපට අත්දැකීමක් නෑ අපි දන්නේ අපේ ආයතන වල අත්දැකීම් අපි කිව්ව හිරු එළිය දිහා බැලුවම හිරු එළිය සුදු පාටට පේන්නේ නමුත් ඒක දිස්නයක් දිහා බැලුවම අපිට පේන්නේ වර්ණ 7ක් එක්කයි.

අන්න ඒ වගේ අපේ ඇස කියන්නේ අක්ෂි කාචයයි උපමාවක් විදියට ඔබ ඒක දකින්න. එහෙනම් ඒ වර්ණය අපේ මේ අක්ෂි කාචය තුළ මැවෙන ඒව. න්‍යෂ්ඨි සෛල, කේතු සෛල කිව්වේ ඒ නිසයි එතකොට ඒ ස්වභාවය අනුවයි සමහර අයට රතු පාටට පේන්නේ නෑ සමහර අයට නිල් කොල පාට පේන්නේ නෑ. එතකොට මෙන්න මේ ස්වභාවය ඒ කෙනාගේ කෙනාගේ ස්වභාවය අනුව තමයි යෂ්ඨි සෛල වල ස්වභාවය එතකොට තීර්ණය වෙන්නේ. ඒ අක්ෂිය තුළ ඒ වර්ණ 7 එළියේ තියෙන එකක් නෙමෙයි හදාගෙන බලනව කියන්නේ එතකොට එළියේ ආලෝක හැඩතලයට වර්ණ සකස් වෙන්නේ විඤ්ඤාණ මායාවෙන් එහෙනම් ඒ විඤ්ඤාණ චක්ඛු ප්‍රාසාද විඤ්ඤාණ මායාවෙන් මැවෙන ආලෝක හැඩතල අර ශබ්දයක් සමග ශබ්දයක් එළියේ නෑ අපේ කර්ණ සංඛ පටලය හෙල්ලෙන එකයි ශබ්දය කියන්නේ

මේ ඔක්කොම එකතු වෙලා, අපි එකතු වීමයි, චිත්ත සංඛාර කියන්නේ අපි කිව්ව චිත්තයක් කියන්නේ ඒකයි.

ඒ කියන්නේ සිතක් හැදෙන හැටි පැහැදිලි කලා ශබ්ද තරංග, වර්ණ තරංග එකත් වෙලා චිත්ත තරංගයක් හැදෙන ආකාරය එතකොට අපි පැහැදිලි කලා මේ ශබ්ද සංඥාවක් කියන්නේ ඒ නිසයි මන පටිච්ච ධම්ම උප්පජ්ජති මනෝ විඤ්ඤාණං කියන්නේ මනසට අරමුණු එන ධම්ම විතරයි කියල කිව. එතකොට ධම්ම කියන්නේ බාහිර තියෙන ශබ්ද වර්ණවලට අදාළ එකක් නොවේ. ධම්ම කියන්නේ සංඥාවක් ඇසුරු කරන්නේ එකයි අපට හීන පේන්නේ ඇස් දෙකෙන් නොවෙයි ඇස් දෙක ඇරල බලනව නොවේ, කන් දෙක ඇරල බලනව නෙවේ. නමුත් චිත්ත ස්වභාවයන්ට ඒක පේන්නේ ඒ චිත්ත ස්වභාවය තමයි අපි කිව්වේ අර ශබ්ද තරංගයි, වර්ණ තරංගයි එකතු වෙලා චිත්ත තරංගයක් හැදෙනව වගේ කියල ඒක උපමාවකට ගන්නේ එතකොට ඒ විදිහටම ඔබට දකින්න ලැබෙයි. ඇත්තටම මේ පැත්තෙන් දුරකථනයෙන් අපි කාටහරි කෝල් එකක් දීල පිච්ච මල කියනකොට ඒ පැත්තෙන් රූපයක් මැවෙන්නේ ඒ රූපයයි, ශබ්දයයි එකතුවෙලා මේ පැත්තෙන් යන්නේ ශබ්දයක් නමුත් ඔය කතා කරන බිත්තිය, මේසය හැම දෙයක්ම ශබ්දයක්, එතකොට ශබ්දයකුයි, වර්ණයකුයි හැඩතලයක එකතුවීම තමයි නාම රූප එක්වීම තුළ අපි සංඛාර කියල දකින්නේ එතකොට ඒ සබ්බේ සංඛාරා කියල කියන්නේ දෙයක් වගේ දැනෙන එකක් දෙයක් වගේ දැනෙන එක තමයි **"රූපන්ති කෝ ආවුසෝ රූපං"** කීවේ **"ඛජ්ජනීය වග්ගය තුළ රුප්පන්ති කෝ ආවුසෝ රූපං"** කියල ඒක තමයි **"උජ්ජියිති කියල පලෝක ධම්මං කියල බිදෙන සුලුයි කියල, ඇස බිදෙන සුලුයි, ලෝකය බිදෙන සුලුයි කියල කිව්වේ ඒ ලෝක සූත්‍රය තුළ**

සළායතන ලොකෝ ලෝකෝ කියල කිව්වේ මේ ආයතන ටික එකට එකතු වෙලා දෙයක් හැදෙන එකයි.

චිත්තානුපස්සනාවේ දී මනායතනය කියල කියන්නේ අපි කිව්ව බිත්තිය දිහා බලන් ඉන්නකොට චිත්තක්ෂණ කෝටි ගනනක් පහල වෙනව වගේ කෝටියෙන් තත්පරයෙන් පංගුවකට වේගයක් තුළ "ස්පාක්" වෙවී තියෙනවා මෙන්න මේ ආලෝකය විදියට "ස්පාක්" වෙනකොට, ශබ්දයත් ඒ විදියට ස්පාක් වන විට, දෙකම එකට එන එකයි එහෙනම් මනෝ විඤ්ඤාණය කියල කියන්නේ. ඒ සොබාදහමේම සංසිද්ධියක් අපි කතා කරන සෝතායතන, ඒ චක්ඛායතන, ඒ මනායතන, මනායතන එකට එකතු වන එක තමයි ආයතන පහ අපි ගත්තොත් සෝත ප්‍රසාද වර්ණ ප්‍රසාද එතකොට චක්ඛු ප්‍රසාදය එතකොට ඒව ඝාණ, ජිව්හා එතකොට ජිව්හා ප්‍රසාදය රස දැනෙන එක එතකොට ගන්ධ දැනෙන එක. කාය ප්‍රසාදය උණුසුම සීතල තදගතිය එතකොට මෙන්න මේ අරමුණු එකට එකතු වෙලා එක මොහොතේම දැනෙන ස්වභාවයයි මනායතනය කීවේ.

ඒක වේගයක් තුළ පටිඝ සම්පස්සයට අධිවචන සම්පස්සය කීවේ අන්න ඒ කාරණාව ඒ ආකාර ඒ ලිංග ඒ උද්දේශ ඒ නිමිති ඇති කල්හි අධි වචන සම්පස්සයක් කියල කියන කොට පටිඝ සම්පස්සයට අධිවචන සම්පස්සය කියන එකම තමයි නාම රූප විදියට ඔබ දකින්නේ එතකොට ඔබ දකින්නේ එහෙමයි. නාම රූප කියන්නේ වෙන් කරන්න පුලුවන් එකක් නෙමෙයි. නාමයක් රූපයක් ඇසුරු කරන්නේ, සංඛාරයක් ඒක සිතුවිල්ලක් මනෝමය සිත්තටික් ඒ කියන්නේ "පැන්ටසි වර්ල්ඩ් එකක වගේ ඒ කියන්නේ අපි ඉන්නේ අපි මවා ගත්ත ලෝකෙක ඒ කියන්නේ මේ ලෝකේ ජනගහනය කෝටි

800ක් ඉන්නවානම් ඒ සියල්ලෝම විඤ්ඤාණ මායාවෙන්, එළියේ අත්දැකීමක් නෑ. "සෙන්සස්" වල අත් දැකීම් විතරයි තියෙන්නේ එතකොට ඒ "සෙන්සස්" වලට එන ශබ්ද, වර්ණ ගන්ධ, රස, පහස, උණුසුම, සීතල, තද ගතිය ඒ කියන අත්දැකීම් පමණයි අපට තියෙන්නේ අපි කිව්ව ශුද්ධාෂ්ඨකය කියල කියන්නේ රූප කලාප 54කින් ප්‍රසාද රූපයක් හැදෙනව කියන්නේ කම්ම, චිත්ත, ඍතු, ආහාර ඔය විදියට දශක කලාප කිව්වත් ඒ අපේ මේ එළියේ තියෙන එකක් නෙමෙයි ප්‍රසාදය කියන්නේ හදාගත්ත එකක් එහෙනම් අපි හදාගෙන අත් දකින දෙයක් මිස දෙයක් හබ්බ වෙන්නේ නෑ. ඒක අපි ප්‍රථම නිබ්බාන සූත්‍රයේම කීවා අපි නැවතත් පැහැදිලි කරනව ඒවායින් අපි තව ටිකක් හොඳින් ඉස්මතු කරමු දැන් මෙතනදී අපි එමු උපක්ලේශ සූත්‍රයට.

උපක්ලේශ සූත්‍රය තුළ එතකොට අපට මේ අවධිමත් ස්වභාවය මතුවෙන්නේ සත්‍ය දකින කෙනාට බාහිරත් දෙයක් නෑ සිතට එන අරමුණ බාහිර ඇත්ත වෙන්නේ නෑ. එතකොට රූප, ශබ්ද, වර්ණ එකතු වී සංඛාරයක් බවට පත් වෙන්නේ නෑ. සිතෙත් හම්බ වෙන්නේ නෑ  එතකොට අවිද්‍යාව කියන්නේ මෙන්න මේ දෙයක් වගේ දැනෙන එකමයි. එතකොට ග්‍රන්ථ ධූරය තුළ අපි දැක්ක පටිච්ච සමුප්පාදය දැක්ක පේළියට ලියල තියෙනවා, අවිද්‍යා පච්චයා සංඛාරා සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාම රූපං, නාම රූප පච්චයා සළායතන, සළායතන පච්චයා පස්සෝ, පස්ස පච්චයා වේදනා, වේදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණ ශෝක පරිදේව දුක්ඛ  දෝමනස්ස නමුත් මේ විදිහට අපි පටිච්ච සමුප්පාදය පේළියට ලිව්වට ග්‍රන්ථ

ධූරය තුළ, අපට විදර්ශනා ධූරය තුළ අපට මතු වෙනව සත්‍ය මේක ප්‍රායොගිකව දකින්න යනකොට අත් දකින්න ලැබෙනව මේ එකම තැන එකම මොහොතෙ ආරම්මණය තුළයි මේ කතාව. ආරම්මණය තුළයි එන සිත ඒ ආරම්මණය ඒ ක්ෂණ සම්පත්තිය තුළ ඒ සිත දැකල හඳුනාගෙන මිදීම තුළයි මේ සියලු සිත්වලින් මිදීම සිද්ධ වෙන්නේ. එහෙනම් ක්ෂණ සම්පත්තිය කියන්නේ එක සිතක සත්‍ය දකින එක එහෙනම් එක් ක්ෂණික සිතක උයද වැය දකින්නාට සම්මුතිය තුළ මරණයක් හමු නොවේ කියල කිවේ එතකොට **මෙතන දී අපට ඉතාමත්ම වැදගත් වන සිද්ධිය තමයි දකින්න පුළුවන් නුවනින් ඒ තමයි පටිච්ච සමුප්පාදය කියන්නේ මෙතන දෙයක් කරගන්න එකයි. ධම්ම කියන්නේ දෙයක් නැති බවයි දෙයක් කියල ගන්න එකමයි එතකොට විඤ්ඤාණ මායාව රැවටීම ඉදපච්චයතාවය කියන්නේ "ඉමස්මිං සති ඉදං හෝති ඉමස්මිං අසති ඉදං න හෝති ඉමස්මිං අසති ඉදං න හෝති ඉමස්ස උප්පජ්ජා ඉදං ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ජති"** කියන්නේ දෙයක් නැති බවයි. මෙය ඇති කල්හි මෙය වේ, මෙය නැති කල්හි මෙය නොවේ මෙය ඉපදුන කල්හි මෙයවේ මෙය නිරුද්ධ වූ කල්හි මෙය නිරුද්ධ වේ. මේ කියන්නේ දෙයක් නැති බවයි. දෙයක් කියල ගත්තොත් එතන තියෙන්නේ අවිද්‍යාවයි, ශබ්ද වර්ණ වල කොයින්ද දෙයක්, දෙයක් කියල දැනෙන එකමයි මේ නිමිත්ත. ඒ කියන්නේ ප්‍රභාෂ්වරං චිත්තං මේ පුංචි දරුවගේ ප්‍රභාෂ්වර සිතේ ස්වභාවය පුංචි දරුව දන්නේ නෑ බිත්තියක්ද, මේසයක්ද පොතක්ද, අල්මාරියක්ද, කබඩ් එකක්ද කියල නමුත් පුංචි දරුවට සාමාන්‍යයෙන් එතන දැනෙන ස්වාභාවයක් පවතිනව ඒ නිසා තමයි පුංචි දරුවට අම්මල නලවන්න පෝන් එකක් එහෙම දුන්නම ඒ දරුව ඒක ලෙවකනව, ඉඹිනව, මිරිකනව පොළෙවෙ ගහනව එතකොට

මොකද සිද්ධ වෙන්නේ ඒ දරුවගේ ආයතන වලින් තමයි ඔය "සෙන්සස්" වලින් තමයි ස්පර්ශය කරන්නේ එතකොට ඒ අනුව තමයි ඒ දරුව ඊට පස්සේ ඒක ගන්න ගියොත් කෑ ගහනව, චෑස් ගාල ඒකට බැදෙනව ඒ බැදීම ඇති වුණේ දැනගෙන නෙමෙයි. පෝන් එකක්ද මොකක්ද කියල ඉපදුන ගමන් පුංචි දරුවෙක් සතියක් දෙකක් තුනක් යන දරුවෙක්ට මේ ගැන අවබෝධයක් නෑ. එතකොට සාමාන්‍යයෙන් සති ගානක දරුවෙක් ඉපදිච්ච ගමන් දරුවෙක්නේ, අත් දැකීම බැලුවොත් ඒක ප්‍රභාෂ්වර සිත හැබැයි එතන නිමිත්තක් ඒ නිමිත්තේ ස්වභාවය ඔබට දකින්න ලැබෙනව. හැබැයි ඔතන ඊට පස්සේ මෙන්න බාහිරින් දානව ශබ්ද මෙන්න පුතේ අම්ම, මේ තාත්ත , මේ අයියා, මේ අක්ක, මොන්ටිසෝරි යනකොට අවුරුදු 4 යනකොට වර්ණ ටික, ඒ දරුව දන්නේ නෑ, ඒත් දරුවට උගන්වනව රතුපාට, කහපාට, නිල්පාට ඇහැට දෙනව රූපය. කණට ශබ්දය දෙනව. ඒක එකතු වෙන එක තමයි දැනගන්නව කියන්නේ එතකොට ඒ වුණාට පස්සේ දෙයක් වගේ දැනෙනව දෙයක් වගේ දැනෙන එක තමයි අන්න ඇසින් බලල දෙයක් වගේ දැනෙනව නම් අන්න ඒක තමයි එතකොට ජාතියේ උපත. බුදුන්වහන්සේ පනවන්නේ "**ජාති ධම්ම සූත්‍රය තුළ 'ස්කන්ධානං පාතිභාවෝ ආයතනං පටිලාභෝ අයං වුච්චති ජාති**" එතකොට ස්කන්ධ මට්ටම කියන්නේ සාමාන්‍ය මේ ආයතන ටික වැඩ කරන මට්ටම එහෙම නම් හුස්ම වැටෙනකම් මේ ආයතන ටික ප්‍රසාද මට්ටමකින් වැඩ කරනව එතකොට ඒක තමයි ස්කන්ධ මට්ටම මොනවද කියල හඳුනන්නේ නෑ. චක්ඛු විඤ්ඤාණය දන්නේ නෑ මේසයක් ද, පුටුවක් ද කියල ඒක මනෝ විඤ්ඤාණයේ දැන ගැනීම. එහෙනම් පළවන වතාවට අර ශබ්දයක් දානකොට වර්ණයක් එන කොට ඒක පළවෙනි සිත

බවට දැනගන්න තැනම තියෙනව ඇලීම, ගැටීම රාග ද්වේශ මෝහ එහෙනම් දෙයක් තියෙනව නම් එතනයි රාග ද්වේශ මෝහ සිත් පනවන්නේ. එහෙනම් දෙයක් තියෙන තැනයි කර්ම විපාක භූමිය අපට හමු වන්නේ දෙයක් තියෙන්න ඕන හොඳ හරි නරක හරි වෙන්න අන්ත දෙකක් තියෙන්න දෙයක් තියෙන්න ඕන. හොඳ නරක කියන අන්ත දෙකම තමයි මේ ඇලෙන ගැටෙන කියන අන්ත දෙකම තමයි අපි මේ කතා කරන්නේ රාග, ද්වේශ, මෝහ කියන ස්වභාවය අලෙන ගැටෙන ස්වභාවය හොඳ නරක කියන ස්වභාවය. දෙයක් කියල ගන්න තැන **"අතීත අනාගත පච්චුප්පන්ණං ඕලාරිකාවා සුකුමාවා දුර ළඟ වේවා"** කියන්නේ අන්න දෙයක් වගේ දැනෙන එක ඒ ස්කන්ධ ස්වභාවය සාමාන්‍යයෙන් රස පටිසංවේදී කියන තැන නමුත් ඒකේ රස රාග න පටිසංවේදී ඒකට රාගයත්, ඡන්ද රාගය දුරු වන තැන එතකොට පුංචි දරුවට මොකද වුණේ පුංචි දරුවගේ ස්වභාවය දැනෙන ස්වභාවයක් තිබුණට මෙනවද කියල තිබුනේ නෑ. රාග ද්වේශ මෝහ හට ගත්තා දෙයක් කියල, මේසයක් පුටුවක් පොතක් කියල දැනගත්තට පස්සේ ඒක ශබ්දයක් දැන ගත්තේ ශබ්ද වර්ණ එකතු වන එකයි මනෝ විඤ්ඤාණය. එහෙනම් මනෝ විඤ්ඤාණය චිත්තානු පස්සනාවෙදී අන්න ඒ අවබෝධයයි එතකොට චිත්තානු පස්සනාව, දැන් අපි ගත්තොත් කායානු පස්සනා, වේදනානු පස්සනා, චිත්තානු පස්සනා, ධම්මානු පස්සනා, ස්කන්ධයම තමයි.කායානුපස්සනාව කියන්නේ, ඒ රූප කියන කොටසේ දී වේදනාව කියන්නේ වේදනානු පස්සනාව කොටසේදි එතකොට සංඥා සංඛාර ඒ වේදනා එකතු වෙන තැන, එක තමයි සංඛාර සකස් වන ආකාරය චිත්තානු පස්සනාව එතකොට ඒකම තමයි විඤ්ඤාණයේ දැන ගැනීම. ආයතනයක් විදියට පොත කියන එක හඳුනාගන්න

එක, ඒක තමයි එතකොට ධම්මානු පස්සනාව එතකොට මෙතනදී දෙයක් කියල ගත්තොත් එතන රාග, ද්වේශ, මෝහ කෙලෙස් හට ගන්නව. මෙන්න මේ සත්‍ය දන්න තැන තමයි යථාභූත ඥාණයට අවශ්‍ය මූලික සිද්ධාන්ත ටික තමයි මේ පැහැදිලි කලේ.

එතකොට මෙතනින් තමයි අපි දෙයක් කරගත්තොත් එතන අපට රාග, ද්වේශ, මෝහ හට ගන්නව. දෙයක් හමු නොවන තැනයි **"විනෙය්‍යය ලෝකේ අභිඣ්ඣා දෝමනස්සානං කායේ කායානු පස්සී විහරති"** කියන තැනට එන්නේ, විනෙය්‍යය ලෝකේ, ලෝකයක් නැති බව දකින්නයි සතර සතිපට්ඨානය වඩන්නේ කියල මීට පෙරත් අපි ඔබට පැහැදිලි කලා. මෙන්න මේ පුංචි පැහැදිලි කිරීම අපි හැම දේශනයකදීම උපක්ලේශ සූත්‍රවල පැහැදිලි කලා. ඒකට හේතුව තමයි මේ අවධිමත් ස්වභාවය මතු වෙන්නේ, මේ අවබෝධය ඇති කෙනාට පමණයි. මේ අවබෝධය ඇති කෙනාට දෙයක් හම්බ වෙන්නේ නෑ. බාහිරින්වත් සිතින්වත් හම්බ වෙන්නේ නෑ. එහෙමනම් අන්න එතන මිදීම තමයි අවබෝධයට හේතු වෙන්නේ ඒ සත්‍ය දකින කෙනා තමයි අවබෝධයට පත් වෙන්නේ, එතකොට මෙතන උපක්ලේශවල පෙන්වන කොට මෙතන විචිකිච්ඡාව ඒ වගේම ඉල්ප්පෙන ගතිය, තදගතිය, උපක්ලේශ විදියට මෙතන බුදුන්වහන්සේ පෙන්වල තියෙනව විචිකිච්ඡාව, අමනසිකාරය සවිතක්ක, සවිචාර, යථාභූත ඥාණයෙන් නොදැක්කොත් එතනත් උපක්ලේශයක් බවට අවධිමත් ස්වභාවය ගිලිහෙන්න හේතු වෙනව. ථීනමිද්ධය තියෙනව නම්, නිදිමත තියෙනව නම්, ඒත් අවධිය මතු වෙන්නේ නැති බව, ඒ එහෙම අමනසිකාරය නිසත්, ඒ මනසිකාරය, ඒ කියන්නේ සවිතක්ක සවිචාර

දැක්කේ නැති නම් මේ අනිමිත්ත සමාධිය ගැන කතා කරන කොට, ලොකෝත්තර සමාධිය ගැන කතා කරන කොට, මේ ලෞකික සමාධි පටලවගන්න එපා ඒකේ නෑ මේ අමනසිකාරය කියල දෙයක් එතකොට ඒකෙ අමනසිකාරය ක්ලේශයක් වෙනව. අමනසිකාරය කියන්නේ මෙනෙහි නොකිරීම නමුත් දැන් ලෞකික සමාධිවල සිතට එන අරමුණු යටපත් කරනව කියන්නේ මෙනෙහි නොකිරීම.

නමුත් මෙතන තියෙන්නේ මෙනෙහි කරන්න කියල එහෙනම් ඒ "සවිතක්කං සවිචාරං සමාධියක් මෙතන තියෙන්නේ එතකොට විතක්ක විචාර සංසිදෙන සමාධි ලෞකික සමාධි. සවිතක්ක සවිචාර සමාධි. ලෝකෝත්තර භූමියේ සමාධි, එතකොට එතන එන්නේ අන්න සවිතක්කං සවිචාරං මුල් අවස්ථාවේදී සත්‍ය දකින අවස්ථාව, ඊට පස්සේ ඉන්ද්‍රිය ධම්ම බල ධම්ම බවට පත් වන අවස්ථාව. ඒ ශ්‍රද්ධා කියන්නේ  සත්‍ය දකිනව. ඒකට ගන්න වීර්යයි, ඒ කියන්නේ සතිය, කියන්නේ අනිමිත්ත සමාධිය ලබන සමාධිය තුළයි මහා ප්‍රඥාව. එතනයි සත්‍ය දැකීම මෙන්න මේ කියන පංචඉන්ද්‍රිය ධර්ම, අරමුණේ සත්‍ය දකින තැන එතකොට මෙතන මනසිකාර තියෙනව, ඒක තමයි සත්‍ය දකිනව කීවේ. එහෙනම් ඒ අමනසිකාරය කියන එක, මනසිකාරය නොවුණොත් උපකලේශයක් බවට පත් වෙනව.

එතකොට ථීනමිද්ධය, අමනසිකාරය, ඉපිලීම, තැති ගැනීම දෙයක් කියල ගත්තොත් තමයි. ග්‍රන්ථධූරය තුළ වචී සංඛාර, කාය සංඛාර, මනෝ සංඛාර කියල තමයි සබ්බේ සංඛාර කියන්නේ විදර්ශනාධූරයට එන විට ග්‍රන්ථ ධූරයෙන් සත්‍යට එනවිට ප්‍රායෝගිකව මේක අත්දකින්න ගත්තොත් ඔබට දැනෙයි දෙයක් කියල දැනීමයි, එහෙනම් වචී සංඛාරය

ශබ්දය තුළත් දෙයක් කියල දැනුනොත් තමයි වචී සංඛාර වෙන්නේ. එහෙනම් මනෝ සංඛාර වෙන්නේ ඒ සිතිවිල්ලත් දෙයක් කියල දැනෙන නිසයි. ඒ කියන්නේ අපි ගත්තොත් පච්නේ ඒ සතා අනුකම්පා කරනව කියල එතනත් කෙනෙක් ඉන්නව දෙයක් තියෙනව දෙයක් තියෙනව නම් කෙනෙක් ඉන්නව. **"ඒතං මම ඒසෝ හමස්මිං නමේසෝ අත්ථා"** හැබැයි දෙයක් හැබැයි දෙයක් නැති බව දකිනව නම් කෙනෙක් කියල දෙයක් හම්බ වෙන්නෙත් නෑ. එහෙනම් එතනම තමයි තියෙන්නේ එතකොට, අපි සත්‍ය දකිනව කියන තැන. එතකොට දෙයක් තියෙනව නම් එතන ඇවිදින කෙනෙක් ඉන්නව. එළවලු කපන කෙනෙක් ඉන්නව, කරන දෙයක් දෙයක් වගේ දැනෙනවා. ශබ්දෙකවත් වර්ණයකවත් දෙයක් හම්බ වෙන්නේ නෑ. ශබ්ද වර්ණ එකතු වුණ තැන තමයි දෙයක් හම්බ වෙන්නේ අන්න ඒ එතන මේ දෙයක් කියල දැනෙන තැන පෙන්වනව. එහෙනම් දෙයක් කියල දැනෙන තැන, පෙන්වන එකමයි නිමිත්තක් කියල පෙනවන්නේ එහෙනම් දෙයක් කියල දේකුත් තියෙනව. ඒකට තව ඔප මට්ටම් වෙනව තවත් අනුව්‍යංජන එනව. මේස පුටු ඇදන් කියල එනව එතකොට කෙලෙස් බවට පත්වෙනව.

පුංචි දරුව, ප්‍රභාෂ්වර චිත්තයේ නිමිති බවට පත්වෙනව. හැබැයි ඊට පස්සේ මොකද වෙන්නේ ඒක වැහෙනව මේස, පොත්, ඇදන් කියල දෙයක් බවට පත් වෙනව. එතකොට මොකද වෙන්නේ කෙලෙස් බවට පත් වෙනව. එතකොට ශ්‍රාසවීයයි ඒක ආශ්‍රව වලට හිත ඇදිල යනව. අනාශ්‍රව හටගන්න. කෙලෙස් හට ගන්න දෙයක් කියල ගත්තම ඇලෙනව, ගැටෙනව. රාග ද්වේශ මෝහ හට ගන්නව එහෙම වුණොත් අන්න එතන ශ්‍රාසවීය ස්වභාවය පත්වුණාට

පස්සේ අන්න එතන සත්‍ය දැක්කොත් බීනාශ්‍රව කෙලෙස් දියවීගෙන යනව. අන්න එතන අනාශ්‍රව වෙලා රහත් භාවයට පත්වෙනව.

ඒ තුළ ශ්‍රාසවීය ස්වභාවය දිස්වීගෙන යනව මෙන්න මේ තමයි නිවන් මග දිශානතිය. යන මාවත ලිපිනය මේ උපක්ලේශ සූත්‍රවල පෙන්වන්නේ මෙතන මේ අවසාන ඒ විදර්ශනා සමාධියක් ලබන, ඒ අනිමිත්ත සමාධියක් ලබන මොහොත. හැම දේකින්ම මිදෙන අවස්ථාව එතනයි එතකොට මේ හැම දෙයක්ම මේ උපක්ලේශ වැදගත් වෙනව. මේ පිරිහෙන්න හේතු වෙනව ඒ කියන්නේ සත්‍ය නොදැක්කොත් එන අරමුණ සත්‍ය දකිනව කියල අපි කිව්වේ, එන අරමුණේ උදය වැය දකිනව කියල එය නොදැක්කොත් පිරිහෙනව. එතකොට අපි කිව්වේ අමනසිකාරය නිසා පිරිහෙනව. එතකොට ථිනමිද්ධය නිසා පිරිහෙනව, එතකොට විචිකිච්ඡාව සැකය නිසා පිරිහෙනව, එතකොට තැති ගැන්ම නිසා එන අරමුණ ඇත්ත කරගෙන තැති ගැනීමකට ලක් වෙනවා එතකොට පිරිහෙනව.එතකොට ඒ අරමුණේ ඉලිප්පීමක් තියෙන කොටත් පිරිහෙනව. හොදයි සුබයි මනාපයි කියල ඉලිප්පීමක් එනව නම් ඒත් පිරිහෙනව. එතකොට නා නාත්ථ සංඥා ඒ කියන්නේ විවිධ සංඥා මතු වෙනව නම් එතකොටත් ඒ අවධිමත් ස්වභාවය මතු වෙන්නේ නෑ. එතකොට වෙනද විදියටම පේනව, වෙනද විදියටම ඇහෙනව, දැනෙනව අත්දැකීම් සාමාන්‍ය රහතන් වහන්සේගේ ස්වභාවය, අන්ධවෙලා නෑ, බිහිරි වෙලා නෑ, වෙනද විදියටම පේනව කිව්වේ ඒකයි ඇහෙනව කිව්වේ ඒකයි දැනෙනව කිව්වේ ඒකයි. එතකොට රහතන් වහන්සේගේ ස්වභාවය රස පටිසංවේදී රස, වර්ණ පටිසංවේදී වර්ණ රාග, ශබ්ද පටිසංවේදී ශබ්ද රාග, නපටිසංවේදී, ගන්ධ පටිසංවේදී ගන්ධ රාග.

එතකොට මෙන්න මේ පටිසංවේදී, සාමාන්‍ය වෙනද විදියටම ශරීර කුඩුව රොබෝ කෙනෙක් වගේ හරියට මැෂින් එකක් වගේ වැඩ කරනව දැනෙන ස්වභාවය දැනෙනව. හැබැයි එතන කෙනෙක් පුද්ගලයෙක් දෙයක් කියල ගන්නේ නැති නිසා පුද්ගලයෙක් දෙයක් හම්බ වෙන්නේ නෑ. අන්න ඒකයි රාගය සංසිඳෙනව කිව්වේ රස රාග නපටිසංවේදී ඒ විදියටම තමයි දෙයක් විදියට ගන්න කොට මනසින් එන ඇරම්මණය දෙයක් වගේ දැනෙනව එතකොට මෙත්තා, කරුණා, මුදිතා කියන ඒවා සාමාන්‍යයෙන් අපි කතා කරනව. ඒක සංඥාවක් විදියට මෙනෙහි වෙනව. ඒක අපි ධර්මයේ තවත් පැතිකඩකින් පැහැදිලි කරනව නමුත් එතන නිවන් මගක් අපට හමුවන්නේ නෑ. අන්තෙක බැහැලයි තියෙන්නේ ඒව ලෞකික දේවල් කරන කටයුතු ලොකෝත්තර භූමියේදී ඇත්තටම කිව්වොත් දෙයක් කරගෙන මනෝ විඤ්ඤාණයෙනුත් එන ආරම්මණ එනකොට දෙයක් කියල දැනෙනව නම් ඒ දැනුන තැනම කලකිරුනා. කරන කෙනෙක් ඉන්නව, මෛත්‍රී කරන කෙනෙක් ඉන්නව එතකොට අනාත්ම ධර්මය හමුවෙන්නේ නෑ. බුදුන්වහන්සේ දේශනා කරන්නේ මෙතන සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක් නැති බවයි. ඒකයි "**චක්ඛුං නිච්චංවා අනිච්චංවා අනිච්චං භන්තේ**" මහණෙනි ඇස නිත්‍යද අනිත්‍යද අනිත්‍යයි ස්වාමීනි. එහෙනම් එය ආත්ම වශයෙන් ගත හැකිද **නෝ හේතං භන්තේ කීව.**

මෙතන වේගයෙන් පැහැදිලි කරපු මේ කාරණා ටික මීට පෙරත් අපි ඔබට මේ උපක්ලේශ සූත්‍ර පැහැදිලි කරන කොට කරල තියෙනව හැබැයි මෙතනදී විශේෂ කාරණ කීපයකටයි එන්නේ ඒ කියන්නේ ඔබ මෙතන හඳුනා ගන්න මේ දේශනය තුළ "**අනිනිධ්‍යාන**" කියන එක එතකොට මේ "**අනිනිධ්‍යාන**"

කියල අපි පෙන්නුව ඒ එක්කම අරමුණක සිත තබාගෙන ලබන ලෞකික සමාධියත් උපක්ලේශයක් බවට පත් වෙනව මේ විදර්ශනා සමාධිය තුළ. එතකොට මේක ඉතාම වැදගත් වෙන අවස්ථාවක් මේ ලෞකික සමාධි හොයන අයට ඔබ මේ තුළින් හොද පණිවිඩයක් දකිනව. ඒ කියන්නේ විදර්ශනා සමාධි අහිමි වෙන්න එකම නිමිත්තක බැස ගෙන සිටීම ම හේතු වෙනව. එතකොට එතනින් ගැලවෙන්න බැරි නිසා ඒ සංඥාව සකස්වීම තුළ එය අපි දන්නව ප්‍රථම ධ්‍යාන රූප සංඥා ස්වභාවවල රූප ලෝක වල සනස් වන බව. එතකොට අපි දන්නව අරූප ලෝක වලත් අරූප සංඥා ස්වභාවවලත් සකස් වන බව. එතකොට ඒවායේ බැස ගෙන හිටියොත් හෙම මෙන්න මේ විදර්ශණා සමාධියත් හමුවෙන්නේ නෑ. විදර්ශනා සමාධියත් තියෙන්නේ සවිතක්ක සවිචාර මෙනෙහි වීම තුළ සත්‍ය දැකීම තුළ මිදෙන සමාධියක් තමයි විදර්ශනා සමාධිය. එතන හිරවෙලා හිටියොත් එකම නිමිත්තක් හරි බැසගෙන සමාධියක් කියල හිරවෙල හිටියොත් ඒකම උපක්ලේශ බවට පත් වෙනව විදර්ශනා සමාධිය තුළ. ඒ නිසා ඉතාම වැදගත් මේ කියන කාරණාව. "**අනිනිධ්‍යානාව**" චිත්ත උපක්ලේශයකැයි බුදුන්වහන්සේ පැහැදිලි කරන එක එතකොට ඒකම මනා කොට ඔබට දකින්නට ලැබෙනව, එතකොට **නානත්ථ සංඥා චිත්තස්ස උපක්ලේශ හෝති විදිත්වා නානත්ථ සංඥා තස්ස උපක්ලේශ පජාහි**" එතකොට **අනිනිධ්‍යාන අනිනිධ්‍යාන්හි තත්ථං උපානං චිත්තස්ස කිලේසේති විදිත්වා අනත්ථා රූපානං චිත්තස්ස උපක්කිලේසා පස්සති**" දුරු කරන්න කියල. බුදුන්වහන්සේ විදර්ශනා සමාධි, අනිමිත්ත සමාධිය බවට පත් වෙන්න අනිමිත්ත සමාධියට පත් වෙන්න නම් මේ නිවන් මග යන යෝගාවචරයෙක් ඒ ලෞකික සමාධිය තුළ උපක්ලේශයක් බවට පත්වෙන බව දැනගෙන සිටිය යුතුයි.

ඒ නිසා තමයි අපි කිව්වේ සති නිමිත්ත වඩන සමාධිය **ඉද භික්ඛවේ භික්ඛූ** මේ ශාසනයේ එකක් නොවන බව. එය පස්වග තවුසෝ කරපු දේ බව එය කුමන හෝ ආකාරයකින් සමාජයට බැහැල තියෙනව නම් භාවනා පන්තිවලින් බැහැල තියෙනව. නමුත් මේ සමාධිය සමථය එක්තරා අවස්ථාවකදී මේ සිත දකින්න වැදගත් වෙනව. සමථ විපස්සනා යුගන්දන් ගමනක් කිව්වේ ඒ නිසයි චිත්ත ඒකාග්‍රකාවය වැදගත් වෙනව. හැබැයි ඒ චිත්ත ඒකාග්‍රතාවය වැදගත් වුණා කියල ලෞකික සමාධිය වැදගත් වෙන්නේ නෑ. ලෞකික සමාධිය තුළ, ඒ සමාධි අවස්ථාව තුළ මනසිකාරය තුළ, සත්‍ය දැකල මිදෙන්න උදව්වක් වෙනව. එකත් කියන්නේ නෑ, නමුත් ඒකෙනුත් මිදිය යුතු වෙනව ඒ කියන්නේ විදර්ශනා සමාධියක් ලැබීම සඳහා එහෙනම් ලෞකික සමාධියට උපක්ලේශයක් වෙනව, විදර්ශනා සමාධි සඳහා එහෙනම් ලෞකික සමාධියෙනුත් මිදෙන්න ඕනි. මේ විදර්ශනා සමාධියක් ලැබීම සඳහා විදර්ශනා සමාධිය කියන්නේ ඇත්තටම අරහත්ත සමාධියටයි ගොඩක් මේකේ අවසාන වශයෙන් ගත්තම සෝවාන්, සකෘදාගාමී, අනාගාමී භූමිවලත් සමාධි අවස්ථා හැටියට පෙන්වනව ඒක ග්‍රන්ථධූරය විසින් විදර්ශනා ධූරයට එන විට අපට දකින්න ලැබෙන්නේ කෙලෙස් සංසිදෙන සංසිදීමයි, සත්‍ය දැකීමයි එතකොට ඒක ඉතාම නිර්මලයි.

ඒ ප්‍රායෝගික අත්දැකීම් සහිතව යන ඒ විදර්ශනා ධූරයට අනුගතව ඒ ප්‍රායෝගිකව අත්දකින දේ ඒ වගේම දැන් අපි යමු ඊළග ඡේදයට. අනුරුද්ධයෙනි, මම අප්‍රමාදව කෙලෙස් තැවුණු වැර ඇතිව නිවනට මෙහෙයවූ සිත් ඇතිව වසන්නෙමි. මුලු රැයද, මුලු දවසද, මුලු දිව රෑ දෙකමද "ඕභාසය" දකිමි, රූප නොදකිමි, එතකොට මෙන්න මෙතන ඉතාම වැදගත්

තැනක් බුදුන්වහන්සේ පැහැදිලි කරනව අනුරුද්ධයෙනි, මම අප්‍රමත්තවය ඒ කියන්නේ අප්‍රමාදීව දැන් මෙතන කියනව "**සෝ කෝ අනුරුද්ධ අප්පමත්තෝ ආතාපි පහීයන්තෝ විහරන්තෝ ඕභාසන්ති කෝ සංජානාමි නච රූපාති පස්සාමි රූපානි නිකෝ පස්සං මිථච ඕභාසං සංජානාමි කේවලම්පි දිවසං කේවලංපි රතිං රත්ත්‍රියන්ති තස්සමයං අනුරුද්ධ ඒතදවෝච කෝ හේතුං**" එතකොට මෙතනදී බුදුන්වහන්සේ පැහැදිලි කරනව බැලුවොත් පැහැදිලි වෙයි, 357 වන පිටුවේ එතකොට අනුරුද්ධයෙනි, මම අප්‍රමාදව කෙලෙස් තවන වෙර ඇතිව **අප්පමන්තෝ අතාපි පහීයන්තෝ** එතකොට නිවනට මෙහෙය වූ සිත් අතිව වසන්නෙමි. මෙතනදී බුදුන්වහන්සේ දේශණා කරනව මෙන්න මේ අනිමිත්ත සමාධිය සතර ඉර්යව්වේම පවතින බව ඒකයි අපි කිව්වේ අරහත්ත සමාධිය සතර ඉරියව්වේම පවතින බව. ඉස්සරහට යද්දී තේරෙයි මේ අරහත්ත සමාධිය ගැන හොදට බුදුන්වහන්සේ සූත්‍රය තුළ අපට දකින්න ලැබෙනව එතකොට බුදුන්වහන්සේ දේශනා කරනව පහැදිලිවම මුලු දවසම ඒ කියන්නේ මුලු රැයද, මුලු දවසම මුලු දිවා රෑ දෙකද "ඕභාසය" දකිමි. අන්න ඒ උපක්ලේශ සංසිදිල වාසය කරනව නම් ඒ නිවනට මෙහෙයවූ සිත් ඇතිව වසන්නේ නම් දිවා රෑ දෙකම "ඕභාසය" පවතිනව කියනව ඒ කියන්නේ අනිමිත්ත සමාධිය පවතිනව කියනව දිවා රෑ දෙකම පවතින්නේ කොහොමද? ඔබ හිතිනවද පර්යංකයේ කියලා නැහැ. මේ සතර ඉරියව්වේම මේ සතර ඉරියව්වෙන් තොර සමාධියක් තමයි මේ විදර්ශනා සමාධි කියන්නේ ඔබ එදිනෙදා වැඩ කරන කොටත් ඒ හැම දේකින්ම මිදුණු ස්වභාවයකට අවධිවන ස්වභාවයක් ඔබ චිත්ත අභ්‍යන්තරයෙන් මතු වෙනව. හැබැයි ඒ තුළ ඔබට කිසිම කම්පනයක් කම්පාවක් නෑ. ඔබ සාමාන්‍යයෙන් ඒ

විදියට කටයුත කරනව. "රස රාග න පටිසංවේදී" කියන තැනටයි යන්නේ රස පටිසංවේදී ඒ නිසා සාමාන්‍ය විදියට දැනෙනව කටයුතු සිදු වෙනව හැබැයි ඔබ ඉතාම පුදුමාකාර ශාන්ත සුවයකින් සැහැල්ලුවකින්මයි කටයුතු කරන්නේ. ඒව එකක්වත් ඔබට උපාදානය වෙන්නේ නෑ ඒ නිසා ඔබ මිදිලයි ඉන්නේ. මේ නිසා තමයි අපි කිව්වේ අනාගාමී භූමිය සධීකාර අනාගාමී කියල, ඒ කියන්නේ සාමාන්‍යයෙන් මේ අවබෝධයට පත් වන ඕනම කෙනෙක් මෙතන නැවත ගර්භයක් පනවන්නත් බෑ. ඒ කියන්නේ **"දිට්ඨිංච අනුපගම්ම සීලවා දස්සනේන සම්පන්නො"** දර්ශනයට පත් වෙලා ඉන්නේ **"කාමේ සු විනෙය්‍යය ගේධං"** ආයතන පිනවීමක් සිද්ධ වෙන්නේ නෑ. **"නහිජාති ගබ්බ සෙයියං"** නැවත ගර්භාසයකට සකස් වෙන්න හේතු නෑ. එතකොට මේ **"දිට්ඨිංච අනුපග ම්ම සීලවා දස්සනේන සම්පන්නෝ"** කියනකොට මේ දර්ශනය මොකක්ද කියල ගොඩක් අය දන්නේ නෑ. ඒවගෙ ම සබ්බාසව සූත්‍රයේ **"දස්සනා පහාතබ්බාං"** කියනකොට ගොඩක් අය මේ දර්ශනය මොකක්ද කියල දන්නේ නෑ අද ග්‍රන්ථධූරය ගොඩක් අය මේ පළවෙනි වතාවට සමහර විට මේ දේශනාවෙන්ම අපි හෙලිකරන කාරණාවෙන්ම මුලු සමාජයටම අවධි වෙන්න හේතු වෙනව ඒ කියන්නේ ඇත්තටම අනිමිත්ත සමාධිය කියන එක මේ වෙනද විදියටම පේන, දර්ශනයට එහා ගිය දර්ශනයත් අවධිමත් බවත් සිතේ ඇති වන බව මේ සිතින් මිදෙන ස්වභාවය ගැන බොහෝ අයට අවබෝධයක් නැහැ. ඒක ප්‍රත්‍යක්ෂ වන බව අපි ඔබට ඒ අත්දැකීම් සහිතව හෙලිකරනව කිවේ අන්න ඒ නිසයි. එතකොට දැන් හේතුවෙලා තියෙනව බොහෝ අයට එතන අවබෝධයට පත් වීගෙන යනව ප්‍රත්‍යක්ෂ වෙනව. හැබැයි

කිසිම පොතක මේක ලියන්න පුළුවන් දෙයක් නෙමෙයි. පොත්වල ලියන්න බැරි කාරණාවක් තමයි විදර්ශනා ධූරය කියන්නේ පොතේ තියෙන කාරණා සෛද්ධාන්තිකයි. ඉතින් ඒ තුළ ග්‍රන්ථ ධූරය තුළ තියෙන සෛද්ධාන්තික කාරණා තුළින් ප්‍රායෝගිකව අත්දැකීම් ලබන ඒ අත්දැකීම් තුළ ඒ විදර්ශනා ධූරය මතුකර ගතයුතු වෙනව.

ඉතින් ඒක තමන්ට අත්දකින ආකාරය ට ඒ තුළයි මතු වෙන්නේ මෙන්න මේ සූත්‍රය තුළ ඔබට බැලුවොත් මේ ඡේදය තුළ තව දුරටත් මේක බුදුන්වහන්සේ පැහැදිලි කරනව, රූපය දක්මි එතකුදු "ඕභාසය" නොදක්මි රූපය දකිනව නම් "ඕභාසය" නෑ කියල කියනව. ඒක එක මූලික අවස්ථාවක පැහැදිලි කිරිමක් මේක ගැඹුරට ගැඹුරට යනකොට මේක තවත් ටිකක් ගැඹුරට යනව ඒ කියන්නේ අනුරුද්ධයෙනි, මට තෙල සිත්වේ මුලු රෑයද, මුලු දවසද, මුලු දිවා රෑ දෙකද මම "ඕභාසය" දකිමි ද රූප නොදකිමි අන්න රූපය දැක්කොත් "ඕභාසය" නෑ කියනව "ඕභාසය" දැක්කොත් රූපය නෑ කියනව එතකොට මෙන්න මෙතන ඉතාම වටිනව. මේක තමයි මූලික අවස්ථාව ඔබටත් අත්දකින්න ලැබෙයි සමන්‍යයෙන් බිත්තිය පේනව, ගහ පේනව, පොළව පේනව, හැමදේම පේනව පේනකොට ඔබට ඒ රූපය පේනව, රූපය පේනකොට ඔබට රූපයට එහා ගිය අවධිමත් ස්වභාවය මතු වෙනව ඔබ ධර්මය දකින කොට ඔබට අවබෝධ වෙනව යථාභූත ඥාණයෙන් පැහැදිලි කරන කොටත් ඔබට අවබෝධ වෙනව දෙයක් නැති බව. බාහිර දෙයක් නැති බව. රූප අන්තයේ දෙයක් හම්බ වෙන්නේ නැ, නාමය අන්තයේ දෙයක් හම්බ වෙන්නේ නෑ, එතකොට අරමුණෙන් මිදෙන ස්වභාවයක් එනව.

මෙන්න මේ ස්වභාවය දකින කෙනාට තමයි මේ මතු වෙන්නේ මොකක්ද ඒ කියන්නේ රූපයෙ බාහිර දෙයක් නැති බව. රූපය අන්තයේ දෙයක් හම්බ වෙන්නේ නෑ, එතකොට සිතෙත් දෙයක් නැති බව එතකොට මේක ප්‍රායෝගිකව අත්දකින්න ලැබෙනව. මේ එන අරමුනින් මිදීමක් වෙනව. එතකොට මොකද වෙන්නේ අන්න මිදීම දැන් ඔබ රූපය ප්‍රකට වෙන්නේ නෑ අන්න එතකොට අනිමිත්ත සමාධිය ප්‍රකට වෙනව, ඒක තමයි වැදගත්ම තැන මේක තමයි අපි ඔබට හිමිහිට පැහැදිලි කරන්න හේතුව. ටිකෙන් ටික ගලපලා දෙන්න හේතුව. මොකද මේ සමාජයට පළවෙනි වතාවට හෙලි කරන්නේ මේ විදර්ශණා ධූරය අවුරුදු සියවස් ගාණකට පස්සේ මේ හෙලි කරන්නේ බෙහෝ අය නිකං කටමැද දොඩවනවා, සමහර වෙලාවට මේ අත්දැකීමක් වත් නෑ. රහත් වෙලා තියා හිතන්නවත් බෑ එහෙම දෙයක් අරහතුන් වහන්සේලා කියල කියා ගන්නව. මේ සමාධියවත් අත්දැකිමක් වත් නෑ, මේ අත්දකින්නේ නැ ඇත්තටම, ඇත්තටම ප්‍රත්‍යක්ෂතාවයක් නෑ. අපට තේරෙනවා වෙන වෙන ඒව ගොඩක් කියවනව ඒ කියවන කොට ඒ සේරම තියෙන්නෙ උපක්ලේශ මෙච්චර උපක්ලේශ ප්‍රමණයක් තියාගෙන කොහොමද මෙයාට අනිමිත්ත සමාධියක් කවදාවත් උපදින්නේ නෑ,

සමහර විට වයසට ගිහිල්ලා අරහතුන් වහන්සේලා කියල කියන්නේ තනිකරම ඇත්තටම බැලුවොත් මානෝමයෙන් හිතනවා. හිතුවට අර සිතුවිලි නෙමෙයි අත්තටම මේ අවධිය කියන්නේ අවධිය කියන්නේ සිතුවිලි වලින් මිදුණු ස්වභාවයක් ඒ නිසා හොදටම ඔබට නොතේරෙනාට අපට මනා කොට අවබෝධයි මේ **"විතක්ක සංඥා සමුදය චරන්ති"** කියන කොට අපට තියෙන ඒ අභ්‍යන්තර **"විතක්ක සමුදය චරන්ත"**

කියන මේ ඤාණයට හසුවෙනව මේ අය ගාව මේ උපක්ලේශ තියෙන්නේ කියල. මේ අය තාම දර්ශනයට පත්වෙලා නෑ. මේ ප්‍රසිද්ධිය හඹා ගෙන යාම තුළ මේ අයට එතනත් තියෙන්නේ උපක්ලේශක් මේ අය හොයන්නේ ප්‍රසිද්ධිය, කීර්තිය මේ අය තවත් සොයන්නේ "ඡන්දං ජනේති" කියන එක ඒ කියන්නේ තමන් ක්ලේශයන්ට අහුවෙල ඡන්දයක් පස්සේ දුවන්නේ ඒ කියන්නේ ආයතන පිනවීම් කොටසක්ම තමයි ඔය කරන්නේ. ඒ ධර්මයම උපක්ලේශයක් කරගෙන ඇත්තටම ඒ අය දන්නේ නෑ ඒ අය මේ ධම්ම උද්ධච්චය කියල. ඒ අය ඒකම කියනව, අනිත් අයටත් උද්ධච්චයට යන්න එපා කියල. නමුත් ඒ අය ධර්ම උද්ධච්චයකමයි. ඉතින් මේව අරහතුන් වහන්සේලා කියාගන්න අරහතුන් කියන්නේම කෙනෙක් ඇයි අරහතුන් නෑ මේවයේ. ධර්මය තුළ අරහතුන් නෑ, ඒක අපි නැවත නැවතත් කියනවා මීට කලිනුත් කියල තියෙනව. අරහතුන්ලා නැති බව මේකේ කෙනෙක් පුද්ලයෙක් නෑ. අරහතුන් කියන්නේ සත්ව පුද්ගල කතාව මේක ඇත්තටම ආර්යන් කියන්නේ කෙනෙකුට නෙමෙයි මේ බුදුන් වහන්සේ විග්‍රහ කරනව මේ ආර්යන් කියා වචනය ඉද භික්ඛවේ භික්ඛු මේ ශාසනයේ භාවිතා කරන්නේ සත්ව පුද්ගල දිට්ඨියෙන් ගිලිහුණු තැනයි ආර්යභාවය. ආර්යන් වහන්සේලා දෙන්නෙක් නෑ කීව්වේ අන්න ඒ නිසයි රහතන් වහන්සේලා නම් මේ ධම්මදින්න රහත් වෙලා දේශනා කලත් ඇත්තටම කිව්වොත් එහෙම අපි දන්නව අනුරුද්ධ රහතන් වහන්සේ දේශනා කලා, එතකොට සැරියුත් හිමියෝ දේශනා කලා එකම ධර්මයයි කියවෙන්නේ ඒ ධර්මය තුළ සත්ව පුද්ගල දිට්ඨියක් තියෙන්න බෑ. කෙනෙක් නෑ ඒ ආර්ය භූමියයි ඒ ආර්යන් වහන්සේලා දෙන්නෙක් නෑ කිව්වේ ඒ නිසයි. ඇත්තටම ආර්යන් වහන්සේට, ආර්යන් වහන්සේ කෙනෙක්

නෑ සත්වයෙක් පුද්ගලයෙක් නෑ. එතන කෙනෙක් නෑ ඒක අපිට හම්බවෙනව. ග්‍රන්ථ ධූරයෙන් අපට දකින්න ලැබෙනව කේවට්ට පුත්‍ර සාතිය භික්ෂුවට **"විඤ්ඤාණං අනිදස්සනං"** කියන දේශනාව තුළ තියෙන විඤ්ඤාණයක් නෑ කියල අද මේ අරහතුන් කියන අයට තියෙන විඤ්ඤාණයත් ශක්තියක් වෙල බලගැන්විල, එහෙම දෙයක් නෑ. විඤ්ඤාණය කියල දෙයක් නෑ, විඤ්ඤාණය කියන්නේ එතන දැනෙන දෙයක් විතරයි එතන දැනෙන දේ අපි කියනවනේ සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය. ඒ වගේ පට්ටිත්තිත විඤ්ඤාණය, අප්පට්ටිත්තිත විඤ්ඤාණය, අනිදස්සණ විඤ්ඤාණය ඔය ඔක්කෝම විඤ්ඤාණ විඤ්ඤාණ කියන්නේ එතන එතන දැනෙන ස්වභාවයට විතරයි විඤ්ඤාණය කියල දෙයක් කොහෙවත් නෑ. ඒක තමයි ඇත්ත කථාව ඒක විදර්ශනා ධූරයටයි අහු වෙන්නේ නමුත් ග්‍රන්ථධුරයට මේක නිකං තවත් එක දැණුමක් විතරයි. ඉතින් තවත් එක දැණුමක් කරගෙන අරහත්වයක් ගැන කතා කරනව නම් ඒ අරහත්වය නැති වුණ තැන තමයි ඒ අය අරහත්වයට පත්වෙන්නේ කියන එක අපි කියනව.

අරහත්වය ගැන කතා කරන එක නවත්වපු දවසට ඒ අය අරහත්වයට පත් වෙනව. නැතුව නම් එතන එහෙම දෙයක් නෑ. ඔබ රැවටෙනව පමණයි. ඉතින් දකින්න අපට කවුරු හරි පල ගැන කියන්න ගියොත් අපි කියනව අපට පලයක් තියෙනව නම් ඒ පලය නැති වුන දවසට, අන්න එදාට අපි පලයට පත් වෙනව. අපි කවදාවත් පල ගැන කතා නොකරන්න හේතුව මුලු සමාජයම හරියට නිකං දේවල් වගේ අල්ලගෙන ඉන්නේ පල ටික අපි නම් පල ටික

ඔක්කොම පැත්තකට දාලා ධර්මය මෙන්න මෙකයි, දුකින් මිදෙන මග මේකයි, දුකින් මිදෙන්නයි ලෝක සත්‍වයාට සසර දුකින් මිදෙන්න සත්‍යාවබෝධයට ඒ නිර්මලව ශ්‍රී සද්ධර්මය හරියටම ප්‍රායෝගිකව අත්දකින ආකාරය, ඔබට ඒ පැහැදිලි කරන ආකාරය තුළ ඔබ සාන්දිට්ඨික වෙල ඔබේ ප්‍රත්‍යක්ෂතාවයට පත් වුණොත් පමණයි ඔය කියන කිසි තැනක ප්‍රත්‍යක්ෂාතාවයක් නෑ. ඒව අපිටත් පැහැදිලි කරනව ගොඩක් අය, ඇත්තටම එතන ප්‍රත්‍යක්ෂ වීමක් සිද්ධ වෙන්නේ නෑ. සමාජය පිරිසිදු වෙන්න ඕන හැබැයි බොහෝ අය කරන විගඩම් වලට වැඩිය රැවිටිලි වලට වැඩිය යමක් ප්‍රකාශ කරනව නම් අපි ඒක අගය කරනව. යන්තම් හරි අඩු ගානේ උත්සාහයක් කරන එක වරදක් නෙවෙයි. බාහිය තාපස තුමා කියන්නේ බොරුවට රහත් කියපු කෙනෙක් නේ එතකොට බාහිය තාපස තුමාට ඕන වෙනවනේ අත්තටම ර හත් වෙන්න ඒක නිසා නේ දාරුචීරිය වීදියට එන්නේ ඔය දර කෝටු ටික ඇඳගත්ත නිසානේ එහෙම හිතන්නේ එතකොට ඊට පස්සේ ඇත්තටම රහත් භාවයට පත් වන ආකාරය දැන ගන්න නේ බුදුන්වහන්සේගෙන් ප්‍රශ්න කරන්නේ, මුණ ගැසෙන්නේ එතකොට ඒ වගේ ඇත්තටත් බොරුවටත් රහත් කියන අයනේ ඔක්කොම ඔතන ඉන්නේ, රගපාන අය නේ ඒ ගොල්ලන්ට මේ දර්ශනය නෑ. මේ දර්ශනයට පත්වෙලා නෑ, මේ අනිමිත්ත සමාධියක් නෑ, මේ අනිමිත්ත සමාධියට උක්ලේශවන ඒව පැහැදිලි කරන්න හැකියාවකුත් නෑ. ඒක උපක්ලේශයක් කියල දන්නෙත් නෑ, ඒ අය ඉන්නේ උපක්ලේශවල කියලයි ඒ අය දන්නෙත් නෑ, තව ඉස්සරහට මේක උපක්ලේශ සූත්‍රය විතරක් නෙමෙයි ඉස්සරහට තව ගාම්භීරව ඔබට දේශනා අහන්න ලැබෙයි ඒ දේශනාවල ඔබට දැනෙයි සම්පූර්ණයෙන්ම මේ ස්වභාවය මීටත් වඩා

හොදට පිරිසිදු වෙලා ඔබට අයන්න ලැබෙයි. එතකොට ඔබට පුදුමාකාර අවබෝධයක් ඇති වේවි ඇත්තටම සැබෑම රහතන් වහන්සේලා සැබෑම මගඵලලාභීන් සැබෑම කෙලෙස් සංසිදවපු ස්වභාවක් මතු වන අය බොහොම නිරහංකාරව නිහඬව ඔබට හමුවේවි. ඒක ඔවුන් කවුරුත් කතා කරන්නේ නැති බව අපිත් දන්නව. මොකද එතන කෙනෙක් නෑ. කෙනෙක් නැති වුණාට පස්සේ මම මලා කියලා වැඩක් තියෙනවද? කාටවත් ඒක කවුරුත් කියන්න තරම් මෝඩද? දැන් ඉන්න අය ඒ අඥාණ මෝඩ අය ඒ අය දන්නේ නෑ රහත් කියන්නේ මොකක්ද කියල. ඉතින් ඒ කියන වචන වලින්ම ඔබට කවදාහරි අරහත්වය සාක්ෂාත් වේවි.

මේක පෙර දැක්මක් විදියට ඔබට මේ වචන ටික හේතු වේවි එතකොට බුදුන්වහන්සේ මෙතන කියන්නේ දවල් රෑ දෙකම තියෙන සමාධිමත් අවස්ථාවක් තමයි විදර්ශනා සමාධිය අරහත්ව සමාධිය අපි නිතරම පැහැදිලි කලා අවසානයේ දී ඒ වචන වලින්ම ඔබට මේ සූත්‍රය තුළ දකින්න ලැබේවි තව ඉස්සරහට පැහැදිලි කරගෙන යනකොට එක වචනයක පවා විශාල අවබොධයක් ඇති වේවි ඔබට. මෙහෙම පැහැදිලි කරන කොට එතකොට රූපය දකීනම් අන්න "ඕභාසය" අහිමි වන බව "ඕභාසයට" පත්වන විට රූපය අහිමි වන බව එතකොට මේක මූලික අවස්ථාව තමයි මේ අනිමිත්ත සමාධියට පත්වෙන එක අපි අත්දැකීමෙන් ඔබට දෙන පණිවිඩයත් ඔබට ප්‍රත්‍යක්ෂකාවය තුළයි මේ පැහැදිලි කරන්නේ අපට මේක විදර්ශනා ධූරයෙන් විතරයි හමු වෙන්නේ ග්‍රන්ථ ධූරයෙන් මේක දකින්න හැකියාවක් නෑ. මේ වචන පොතේ ලිව්වට පටිච්චසමුප්පාදය වරද්ද ගත්ත වගේ තමයි. ඔබ දන්නව රේණුකානේ චන්දවිමල හාමුදුරුවන්ගේ පොතේ

පටිච්චසමුප්පාද විවරණය. අපට කියන්න පොතක් නැති නිසා අපි ඒ පොත තුළින් ඇත්තට ඒ පොත පරිහරණය කලාට කමක් නෑ අපි එපා කියන්නේ නෑ. නමුත් අපි කියන්නේ ඒකේ සත්‍ය දකින්න, ඒකේ අඩුපාඩු තියෙනව අපි ඒක හදාගමු අපි උන්වහන්සේලාටත් කියනව සත්‍ය ධර්මය හොඳින් අවබෝධ කරගෙන අඩුපාඩු හදාගෙන ඒ දේවල් කරන්න. මොකද සමාජයේ ඇත්තටම සත්‍යට එන්න ඕන. මොකද බෞද්ධයෝ අසරණයි. බෞද්ධයින්ට නිවන් මග අහිමි වෙලා තියෙන්නේ එක එක දෘෂ්ඨීවල හිරවීම නිසයි. ඒ හැම දේකින්ම නිවන් මග අහිමිවෙලා තියෙන්නේ එක එක දෘෂ්ඨීවල හිරවීම නිසයි ඒ හැම දේකින්ම මිදුණ තැන නිර්මල ශ්‍රී සද්ධර්මය අවධි වෙනව එතකොට මෙන්න මෙතන මේ බාහිර දෙයක් නැති බව දකිනකෙනාට සිතෙත් දෙයක් නැති බව දකිනකෙනාට මිදුණු අවස්ථාව තමයි අනිමිත්ත සමාධි අවස්ථාව තමයි. ඒ රූප දර්ශනයෙන් මිදෙන අවසථාව තමයි මේ දර්ශනයට පත්වෙන අවස්ථාව කියන්නේ එතකොට තමයි විදර්ශනය, දර්ශනයෙන් මිදෙන එකයි විදර්ශනය කියල කියන්නේ සාමාන්‍යයෙන් දර්ශනය තමයි දර්ශනය ඒකෙන් මිදෙන එකයි විදර්ශනාය කියල කියන්නේ සාමාන්‍යයෙන් දර්ශනය තමයි දර්ශනය ඒකෙන් මිදෙන දර්ශනය තමයි විදර්ශනය ඒ නිසයි ඒ වචනය අපි දකින්නේ ධර්මය තුළින් එතකොට රූපය දකිම් නම් එතකුදු "ඕභසය" නොදකිම් අනුරුද්ධයෙනි, මට තෙල සිත්විය මුලු රැයද, මුලු දවාලද, මුලු රාත්‍රියද "ඕභාසය" දනිම්ද ඒ රූපයේ එය නොදනිම්ද ඒ නිසා ඒ රූපය දකිම්ද "ඕභාසය" නොදකිම්ද ඊට හේතු කවරේද? ඊට හේතු හොයනව බුදුන්වහන්සේ, ඒ කියන්නේ දැන් රූපය පේනව සාමාන්‍යයෙන් වෙනද විදියටම පේනව පේනකොට "ඕභසය" නෑ, ඒ කියන්නේ අනිමිත්ත සමාධිය

නෑ. ඊට පස්සේ ආයේ අනිමිත්ත සමාධිය මතු වෙනව එතකොට හැම දේම පේනව පේන්නේ නැතිව නෙමෙයි මේ සතර ඉරියව්වෙමනේ දවල් රෑ දෙකේම එතකොට රූපය පේනකොට සමාධිය නෑ, සමාධිය තියෙන කොට හැම දේකින්ම මිදුණ අර අපි කියන්නේ නිතරම සමාධි ඒක මතු වෙනව හැබැයි ඒක දකින කොට මේක නෑ.

එතකොට මේකට හේතුව බලනව ඊට පස්සේ බුදුන්වහන්සේ මේ සම්බෝධියට පෙර ලබපු අත්දැකීම්නේ මේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේට පැහැදිලි කරන්නේ, අනුරුද්ධ ස්වාමීන් වහන්සේට මේ "ඕභාසය" නැති නිසානේ අනිමිත්ත සමාධියට පිහිටල නැති නිසානේ එතකොට ඒක තිරස්තිතිව පවතින්නේ නෑ කියල කිව්වනේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ඒ නිසානේ මේ බුදුන්වහන්සේ හේතු පැහැදිලි කරන එකක්නේ මේ දිගටම සිද්ධ වෙන්නෙ. අනිමිත්ත සමාධියයි මේ කතා කරන්නේ මේ විදර්ශනා සමාධිය ගැනයි කතා කරන්නේ, එසමයේ රූපය දකිම්ද "ඕභාසය" නොදකී ඊට හේතු කවරේද? ප්‍රත්‍ය කවරේද අනුරුද්ධයෙනි.

මට මෙසේ සිත් විය මුලු රෑයද, මුලු දවාලද, මුලු දවල් රෑ දෙකෙහිමද මෙසේ මම රූපයේ නිමිති මෙනෙහි නොකොට රූපය මෙනෙහි කරන්නේ නෑ දැන් රූපාරම්මණය එනවනේ ඒක දැන් මෙනෙහෙි නොකොට "ඕභාස" නිමිති මෙනෙහි කරම්ද එතකොට 'ඕභාස" නිමිති කියන්නේ හැම මෙහොතේම මිදුණු ස්වභාවයට සිහිය පවත්වනව. එසමයෙහි "ඕභාසයය" දනිමි. හැම දේකින්ම මිදුණු ස්වභාවයට අවධි වෙනව හැබැයි ඔබ දැන් මේක කරන්න ගිහිල්ල ඔබ කරන්නේ යථාභූත ඥාණයේ අර සත්‍ය දැකල මිදෙන ඒ තුළින් නෙමෙයි නම් මේක එන්නෙ දැනුමක් විදියටයි සිතුවිල්ලක් විදියටයි. ඒ

කියන්නේ ඒත් අවධියක් ඇති වෙන්නේ නෑ කියන එකයි. ඒක අවධියක් ඇති වුණා වගේ සිතුවිල්ල තුළ විඥ්ඥාණ මායාව තුළ අර ඔබට විඥ්ඥාණ මායාවෙන් මවල දෙය නිකන් වුණා වගේ මෝහනයක්, ඒක සත්‍ය නොවේ, යථාභූත ඥාණය තුළ දෙයක් නැති බවට බාහිරින් මිදෙන ස්වභාවයකට අවධි වීම තුළයි මෙය සිදුවන්නේ එතකොට ඒ සිතෙත් එවැනි ස්වභාවයක් එක පැත්තකින් මිදුණු තැනයි ඒ අවධිමත් ස්වභාවය මතුවන්නේ ඒක අපි ඔබට මනාසේ ඔබටත් ඒක අත්දකින්න ලැබෙයි ඒ තමයි සත්‍ය කාරණාව. ඒ එසේයි එතකොට "ඕභාසය" දනී රූප නොදකිමි. යම් කලෙක මම 'ඕභාස නිමිති මෙනෙහි නොකර රූප නිමිති මෙනෙහි කරම්ද රූපය දකිමි. ඒක තමයි මූලික අවස්ථාව.

තව ගැඹුරු අවස්ථාවක් තියෙනව අනුරුද්ධයෙනි, මම අප්‍රමාදව අනාපාන වීර්ය ඇතිව ඒ ප්‍රහීනාත්ම වසනුයෙමි මුලු රෑයද, මුලු දවාලද, මුලු දවල් රෑ දෙකහිද පරින්නවූ කර්මස්ථායේ "ඕභාසයත්" දැන ගතිමි. මෙන්න මේ ඉතාමත් වැදගත් කාරණාවක් බුදුන්වහන්සේ දේශනා කරනව මෙතනදී. බුදුන්වහන්සේ ගන්නව "**පරිනිත්ත**" කියන වචනය අපට හම්බවෙනව "**පරින්නාභය අප්පනාභය පරන්න සූත්‍රය**" අපරින්න සූත්‍රය ඒ කියන්නේ මේ යන්තම් මතුවන එකක් ඉතා හොඳින් මතුවන එකක් "**පරන්න අප්පමානබ**" කියන එක එතකොට ඒ මතුවෙන්නේ මොකක්ද? දැන් මෙතනදී බුදුන්වහන්සේ කියන්නේ අනාපාන වීර්යය ඇතිව ඒ කියන්නේ මෙතනදී අර කෙලෙස් තවන වීර්යය වැර ඇතිව, ඒ කියන්නේ ආතාපින වීර්ය **අතාපි පහීයන්ති විහරන්තෝ පරිත්තථං මේව ඕභාසං සංජානාමි** අන්න එතන තමයි එතකොට අප්‍රමත්ථව ඒ කියන්නේ දිගින් දිගටම හොඳින්

අධ්‍යානය කරන කොට හොඳින් මේක මෙනෙහි කරන කොට නැවත නැවත, නැවත නැවත පුහුණු කරන වන විට ඒ කියන්නේ එන අරමුණේ සත්‍ය දකින විට බාහිර දෙයක් නැති බව එතකොට රූපාරම්මණයෙන් මිදෙන විට ඒ රූප සංඥාවෙන් මිදෙන කොට ඔන්න බාහිර තියෙන වෙනද විදියටම පේන එක ඇත්තටම අගයක් නැතිව යනව. මෙතන සිද්ධ වෙන්නේ ප්‍රායෝගිකව වටිනාකමක් නැති වෙනව, ඡන්දරාගය දුරු වෙන එකම තමයි ඒ කියන්නේ කෙලෙස් සංසිදෙන එකම තමයි. ඒ කියන්නේ බාහිර දෙයක් නැති බව තමන්ට දැනෙන්න ගන්න කොට විතක්ක අඩුවෙනව. එතකොට ඒවට බැස ගන්නේ නෑ. එතකොට ප්‍රීතිසුඛ කියන ස්වභාව එනව ඒවත් එතකොට සංසිදිල යනව. එතකොට ඇත්තටම මේ අර ලෞකික ධ්‍යාන ස්වභාවය මිදි මිදී යනව ඔබට අත්දකින්න ලැබෙනව. වැඩිය කතා කරන එක ඒවට එච්චර දෙතිස් කතා ඒව එච්චර ඒව එන්නේ නෑ, ඒවට ඇලෙන්නේ නෑ, ඒව නිතර අර සංජානාති කියන තැනට එනව දැන ගැනීමක් විතරක් වෙනව. ඒවට යන්නේ නෑ රිංගන්නේ නෑ "සබ්බේ ධම්මා නාලං අභිනිවේසා" සිතිවිලිවලින් මිදීමක් දැනෙනව එතකොට දකින දේවලුත් ඇහෙන දේවලුත් පේන දේ හැම දේකින්ම මිදුණු ස්වභාවයක් මතු වෙනව. අන්න ඒ ස්වභාවය තුළ එනව "ඕභාසය" කියන එක සමාධිමය ස්වභාවය ඒ හැම දේකින්ම මිදුණු අවධි ස්වභාවය එනව අන්න එතනයි එතකොට දවල් රෑ දෙකේම වෙනද විදියටම පේනව වුණාට "ඕභාසයත්" මතුවෙනව කියන එක. ඒකයි වෙනද විදියටම පේනව දැනෙනව ඒ හැම දේකින්ම මිදුණු අවධිමත් ස්වභාවයක් මතු වෙනව. අන්න එයයි අනිමිත්ත සමාධිය එයයි මේ කතා කරන "ඕභාසය" කියල කියන්නේ එයයි විදර්ශනාව දර්ශනයෙන් මිදුණු දැක්මක් ඇති වෙනව අවධියක් තමයි

**ඇති වන්නේ ඒ අවධිමත් ස්වභාවය ලුණු වගේ දැනෙනව ඒකත් ඔබ අත්දකින්න ඕනි. එයයි අනිමිත්ත සමාධිය. මෙතන තමයි මේ පෙන්වන්නේ දවල් රෑ දෙකේම එතකොට මේක දකින්නත් ලැබෙනව එතකොට අනුරුද්ධයෙනි, මම අප්‍රමාදව ආතාපිත වීර්යය ඇතිව වසනුයේ මුලු රැයද එතකොට මුලු දවල් රෑ දේකෙහිම ද එතකොට පරිත්ත වූ කර්මස්ථානයේ "ඕභාසය" දැනගනී. එතකොට පරිත්ත වූ කර්මස්ථානයේ කිව්වේ කර්මස්ථානය වෙනමම බුදුන්වහන්සේ දේශනා කරන්නෙ නෑ. ඇත්තටම මේක කර්මස්ථානයක් බවට පත් වෙනව. මේ හැම දේශනයක්ම නිවන් මග විවර වෙන කොට ඒ පුහුණු වන ආකාරය ඒ සත්‍ය ධර්මය දකින ආකාරය කර්මස්ථානයක් බවට පත්වෙනව එතකොට පරිත්තක වූ කර්මස්ථානය "ඕභාසය" දැකගතිමි කියන වචනය ඒ නිසාම වැදගත් ඒ නිසාම පරිත්තවූ කර්මස්ථානයේ රූපයද දකිමි.**

ඒ කියන්නේ අරමුණේ සත්‍ය දකින තැන බාහිර දෙයක් නෑ සිතෙත් දෙයක් නෑ කියල දැකල මිදෙන තැන ඒකනෙ සත්‍ය දැන් මුල් අවස්ථාවනේ ඉන්ද්‍රිය ධර්ම අවස්ථාවනේ මේක, මෙනෙහි වන අවස්ථාවනේ එතකොට මනසිකාර සවිතක්ක, සවිචාර කියන තැන එතකොට එතන බාහිර දෙයක් හම්බ වෙන්නේ නෑ එතකොට අරමුණ මිදෙනව එතකොට වෙනද විදියටම පේනව මොනවත් නැති වෙලා නෑ ඒ වුණාට මිදිල ඉන්නව. අන්න ඒ ස්වභාවය තුළ තියෙන සමාධිමත් ස්වභාවය අවධිමත් ස්වභාවයක් මතුවෙනව කිසිම දේකට වටිනාමක් දැනෙන්නේ නෑ. අවධිමත් ස්වභාවයක් මතුවෙනව එයයි මේ අපි කතා කරන අනිමිත්ත සමාධිය. මොහොතට අවධිය එයයි, විදර්ශනාව එයයි, දර්ශනයට පත්වෙනව කියල කියන්නේ එයයි. දර්ශන සමාපත්තිය කියල අපි කිව්ව එයයි

දර්ශන විශුද්ධිය එයයි ඔබ දකින්න ඕනි. ඒ හැම වචනයක්ම තියෙන්නේ මේ එකම කාරණාවයි ඒ මේ සමාධියයි නිමත්තක් කියන්නේ දෙයක් වගේ දැනෙන එකයි. දෙයක් වගේ නොදැනෙන ස්වභාවයයි අනිමිත්ත සමාධිය කියන්නේ එතකොට එතන හොඳින් දකින්න ලැබෙන තැනක් එතන අප්‍රමාණ කර්මස්ථානයේ දැන් මෙතනදී අප්‍රමාණ පරිත්තවූ කර්මස්ථානයේ රූපයද දකිමි අප්‍රමාණ කර්මස්ථානයේ "ඕභාසය" දැන ගතිමි. අප්‍රමාණ කර්මස්ථානයේ පරිත්ත සුභය, අපමාණ සුභය කිව්වේ එතකොට ඒක තවත් හොඳින් ප්‍රකට වෙන තැන අප්‍රමාණකර්මස්ථානයේ රූපය දකිමි එතකොට අනුරුද්ධයෙනි, මට තෙල සිත් විය මුලු රැයද, මුලු දවාලද, මුලු දවල් රෑ දෙකේමද පරිත්ත "ඕභාසය" හඳුනමි. පරිත්ත රූපය දකිමි අප්‍රමාණව වාසය කරමි අප්‍රමාණව රූපය දකිමි. ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍ය කවරේදැයි අනුරුද්ධයෙනි, මට තෙල සිත් විය යම් කලෙක පරිත්ත කර්ම පරිකර්මෝ "ඕභාස" වේද එසමයේ මට පරිපනෝ දිවැස්වේ අන්න දිවැස් පහළ වෙනව.

මේ දිවැස කියල කියන්නෙ මොකක්ද ඒ කියන්නේ අපි ඉන්ද්‍රිය ධර්ම වලින් මේක කිව්ව ඉර්ධි වලින් ඉර්ධිපාද සූත්‍රවලටත් මේක කිව්ව. මේ දිවැස කියන්නේ දෙයක් නැති බව දැන් බාහිර දෙයක් නැති බව දකිනව යථාභූත ඥාණයෙන් සත්‍ය දකිනව බාහිරයේ දෙයක් හම්බ වෙන්නේ නෑ සිතෙත් දෙයක් හම්බ වෙන්නේ නෑ දැන් මෙතන මිදීමක් තියෙනව සාමාන්‍ය විදියටම පේනව, පේන්නේ නැති වෙන්නේ නෑ හැබැයි ඒකේ අගයක් නැති බව, දෙයක් නැති බව, පේනව දැනෙනව සිහියට හසු වෙනව විඥ්ඥාණ මායාවට නෙමෙයි ඒක ඥාණයට හසු වෙනව කිව්වේ සිහියට හසු වෙනව

කිව්වේ දෙයක් නැති බව ඤාණයටයි හසුවන්නේ හැබැයි ඒක නොදැනෙන ස්වභාවයට එනව අනිමිත්ත සමාධියට, ඒකයි අපි කියන්නේ අඤ්ඤාණ අපි එතන අඤ්ඤාණ නෙවෙයි එතන කියන්නේ අන්ඤ්න්ද්‍රිය කියල. ඒ කියන්නේ ඥාණ අඤ්ඤා බවට පත් වෙනව අඤ්ඤා කියන්නේ නිවනට එතකොට නිවන කියන්නේ අනිමිත්ත සමාධියයි. එතකොට අනිමිත්ත සමාධිය කියන්නේ මෙතන රාග, ද්වේශ, මෝහ කෙලෙස් සංසිදෙන ස්වභාවයටයි නිවන මතුවන ස්වභාවය තීරණය වන්නේ ඒකයි මේකේ වටිනාකමක් දැනෙනකම් රූප බැස ගන්න එකක් සිද්ධ වෙනව හැබැයි අවධිය මතු වෙනව නැති වෙනව වෙන්න පුලුවන් හැබැයි ඒක හොදටම ප්‍රකට වෙන්නේ රාග, ද්වේශ, මෝහ කෙලෙස් සංසිදෙන ස්වභාවය මතයි. රාග, ද්වේශ, මෝහ කෙලෙස් සම්පූර්ණයෙන් සංසිදෙනතාක් කල් අර අවධිය මතු වෙන්නේ නෑ. ඒ අනිමිත්ත සමාධිය හැබැයි රාග, ද්වේශ, මෝහ සංසිදෙන්නේ මේක මේ අනාගාමී භූමියේ අපි කිව්වට අරහත්වය කරා යන ගමනේදී මෙන්න මේ උපක්ලේශ සූත්‍රය ඉතාම වැදගත් වෙනව. හැබැයි සෝතාපන්න අවස්ථාවේදී අවධියක් යන්තම් හෝ මතුවෙනව හැබැයි සෝතාපන්න අවස්ථාවේදී අවධියක් යන්තම් හෝ මතුවෙල නැති වන ස්වභාවයක් තියෙනව. නමුත් ඒක පවතින්නේ නෑ එතකොට මේව අපිට දිගටම සෝතාපන්න වෙලා සෑහෙන කාලයක් එහෙමත් නෙවෙයි එතන "උග්ගටිතඤ්ඤ විපටිතඤ්ඤ නෙයිය පදපරම කියන කොට උග්ගටිතඤ්ඤ විපටිතඤ්ඤ සෝතාපන්න අනාගාමී" ඒ මෙහොතේම එකම ස්වභාවයක් ඇතුලෙම අරහත්වයට පත් වෙන්නත් පුලුවන් ඒ කියන්නේ අවබෝධයට, අභ්‍යන්තරයටයි ඒක දැනෙන්නේ මිදෙන බව

ඒ අවබෝධ ඤාණයටයි දැනෙන්නේ ඒ අවබෝධ ඤාණය තුළයි මිදීම තියෙන්නේ.

එහෙම නැතිව මේක වෙනම ස්වභාවයක් නොවෙයි මේක විදර්ශනා භාවනාවක් මේක විදසුන් නුවණට හසු වෙනව මෙතන එන ස්වභාවය තමයි දිවැස් ස්වභාවය. දිවැස කියල කියන්නේ කුමක්ද? මෙලොව එලොව කියන කොටත් **අපි කිව්ව මෙලොව කියන්නේ ලෝකය බැස ගත්ත,** පොත් මේස ඉර හද මෙලොව. **එලොව කියන්නේ මේ ආයතන වලින් දෙයක් කියල ගන්නෙ නැති** මේස, පොත්, ඇඳන් කියන ඒ දේවල්වලින් මිදුණ ස්වභාවය එලොව. එතකොට මේ අරමුණින් මිදීම තුළත් එලොව තියෙන්නේ එතකොට මේ එලොව මොකක්ද? පොත්, මේස, ඇඳන් අපි කතා කරන සම්මුති ප්‍රඥප්ති තියෙන්නේ මේස, ඇඳ මේව ශබ්ද වර්ණ වලින් එකතු කර ගත්ත ලෝකයක් තියෙනව කියල ආයතන වලින් ගත්තනේ සළායතන ලෝකයක් ඒ මෙලොව. ඒකෙන් මිදුණු ගමන් අන්න එලොව ඒ සළායතන ලෝකයෙන් මිදුණ තැන අන්න එලොව එතකොට අපි නාම රූප දෙයක් කියල ගත්ත, නාම රූප වලින් මිදීම තුළයි මෙලොව එලොව එතකොට පරලොව එතකොට මේ මොහොතේ එන අරමුණ දෙයක් කියල ගත්තොත් මෙලොව හැබැයි එතන දෙයක් නැති බව දැක්කොත් එලොව පරලොව එතකොට දැන් මෙලොවත් මිදිල එලොවත් මිදිල දෙලොවම සමව වාසය කරනව කිව්වේ අවබෝධය තුළ වෙනද විදියටම ජේනව හැබැයි මිදිල එතකොට මෙලොවත් මිදිල එතකොට එලොවත් මිදිල එතකොට "ඕභාසය" තුළ එනව මොකක්ද අනිමිත්ත සමාධිය දර්ශනයට පත් වෙනව එතකොට එලොවත් මිදිල අන්න සමව වාසය කරනව හරි සුන්දර කතාවක් තියෙන්නේ

නේද? ඒ කියන්නේ නෙලුම් පතේ දියබිඳ නොඇලී නොග ැටී වාසය කරන්නා සේ රහතන් වහන්සේගේ ස්වභාවයත් මෙලොවත් මිදිල එලොවත් මිදිල දෙලොවම සමව වාසය කරනව එතකොට මේ අවබෝධය ප්‍රත්‍යක්ෂයක් ඔබට මේ හෙලි කරන්නේ මේ අපි මේ එල ගැන කිසිදෙයක් කතා කරන්නේ නෑ. අපි කතා කරන්නේ ධර්මය ඔබට මේක පඤිවිඩය දෙන්න ඕන නිසා. මේක ග්‍රන්ථ ධූරයෙන් ගන්න බෑ මේක විදර්ශනා ධූරය අත් දැකීමෙන් ඔබට දකින්න ලැබෙනව මේ අත්දැකීම් හෙලි කලේ නැතිනම් ඔබට කවදවත් මේක ගන්න බෑ. ඒ නිසා මෙය බොහොම නිහඬවම නිහතමානීව මේ අත් දැකීම ඔබට ඉදිරිපත් කරන්නේ එතකොට අපි දන්නව මේක මේ කතාව වෙන්නේ මොකක්ද අපිට හොදට සක්සුදක්සේ පෙන්වල දෙන්න පුලුවන් එවිට ප්‍රත්‍යක්ෂතාවය තුළ අපට දකින දේත් කියනව එච්චරයි. එහෙම නැතුව අපට වෙන කිසිම අදහසක් නෑ.

අපි දන්නව මේක මෙන්න මෙහෙම වෙනව මෙහෙමයි වෙන්නේ ප්‍රායෝගික අත්දැකීම් තියෙනව අපේ ප්‍රත්‍යක්ෂතාවය තුළ දකින දේ කියනව හෙලිකරනව ඒක ඔබට බාරයි. ඔබ ඒ තුළ මාර්ගය තුළ දකින්න උත්සාහ කලොත් ඔබට ඒක අත්දකින්න ලැබෙන නිසයි එහෙම හෙලි කරන්න හේතුව එතකොට ඔබ අමාරුවෙ වැටෙන්නේ නෑ. ඔබ දන්නව මොකක්ද වෙන්නේ කියල කවුරුන් හෝ එය හෙලි කල යුතු වෙනව ඒක හෙලි කරනකම් කිසි කෙනෙකුට ඒක විවර කර ගන්න බෑ. හැමෝම කොහේ හරි හිර වෙලා ඉන්නව. සමහර අය නිමිතිගත සමාධියෙ හිර වෙලා ඉන්නව සති නිමිත්ත වඩනව කියල. එතන නිවන් මග නෙවෙයි එතනත් අපට උපකාර වෙනව අපි ඒක නෑ කියන්නේ නෑ. ඒක නෙමෙයි

අනිමිත්ත සමාධිය මෙතන විදර්ශනා සමාධියයි බුදුන් වහන්සේ ලෝකයට හෙලිකරන්නේ සති නිමිත්ත වඩන එක ඇවිල්ල පස්වග මහණුන් කරපු ලෞකික සමාධි නමුත් ඒක නෙවෙයි, ඒක භාවිතා කරල විදර්ශනා සමාධියක් උපදින්නේ කෙසේද? කොහොමද ඒක වෙන්නේ සත්‍ය දකිනකොට අවබෝධයෙන් මිදෙන්නෙ "**සංචිත්තේන නිබ්බිදාය**" අවබෝධ ඤාණය තුළයි මේ කියන දිවැසත් පහළ වෙන්නේ දිවැසින් දකිනව කීමම ලෙඩක් ඒ අයට වැටහෙනව එතකොට සිතුවිලි නෙවෙයි කියල වැටහෙනවා සිතුවිලිවල වෙනස් ස්වභාවයක් මේක දැනෙනව කියල ඤාණයට හසු වෙනව. කියන කොට සිහියට අවධි වෙනව කියන කොට මේ සිතුවිලිවලට හිමිකාරයෙක් නෑ කියන කොට මෙතන කෙනෙක් පුද්ගලයෙක් හම්බ වෙන්නේ නෑ කියන කොට සියල්ලෙන් මිදුණු ස්වභාවයක් සිතුවිලිවලට හිමිකාරයෙක් නෑ. ඒකයි කතාව.

වෙනද විදියටම කනව කටට වතුර දානව බඩට යනව එළියට යනව කවුද බිව්වේ බීපු කෙනෙක් නෑ අර දෙයක් කියල දැක්කොත් කෙනෙක් ඉන්නව දෙයක් නැත්නම් කෙනෙක් නෑ, මේක චිත්තයක්ම තමයි, සිතිවිල්ලක්ම තමයි. මම කියල කියන්නේ මම කියල කෙනෙකුත් නෑ සක්කාය දෘෂ්ටිය කියල කියන කොට ඇත්තටම දෙයක් කියල ගත්තොත් අර ස්කන්ධකාය කියල තියෙනව කියල ගත්තොත් දෙයක් එහෙම වුණොත් තමයි මම ඉන්නේ දෘෂ්ටියෙ "**ඒතං මම ඒසෝ හමස්මිං ඒසෝ මේ අත්තාති**" මම මගේ ආත්මය කියල එතකොට මම මගේ මගේ ආත්මය කියල දෙයක් හම්බ වෙන්නේ නෑ දෙයක් කෙනෙක් නැතිනම් මෙතන දෙයක් කියල හම්බ වෙන්නේ නැතිනම් දෙයක් තිබ්බොත් මාත් ඉන්නව පොත තිබ්බොත් පොතෙන් තොර මමෙක් නෑ

කිව්වේ අන්න ඒ නිසයි. එතකොට ඔබට දිගටම අහන්න ලැබෙන්නේ නිර්මලව ඒ සත්‍ය ධර්මය ඔබ ඒකට අවධි කරන්න තමයි මෙච්චර කටයුතු කරන්නේ අපි මේ වීර්යය කරන්නේ උත්සාහ කරන්නේ ඒක ඔබගේම භාග්‍යයි සිද්ධ වෙන්නේ අප විසින් ඒ යායුතු මාවත ලිපිනය පෙන්වා දෙනව පමණයි කල්‍යාණ මිත්‍රය පණිවිඩේ කියනව පමණයි යායුතු වන්නේ ඔබමයි. එතකොට දවල් රෑ දෙකම කෙනෙක් පුද්ගලයෙක් නැති නිමිත්තෙන් මිදුණු ස්වභාවය තුළ මේ අනිමිත්ත සමාධිය හමුවෙනව. එතකොට දෙයක් හමුනොවන තැනයි මේ එක එක වචන භාවිතා කරනව ස්වභාවය ඔබට ඉස්මතු කර ගන්න පහසුව සඳහා එතකොට ඊට හේතු කවරේද ඊට ප්‍රත්‍ය කවරේද අනුරුද්ධයෙනි. එතකොට "**පරිත්ත අප්පමාවාභය**" ඒකත් දන්නව මේ ස්වභාවය ප්‍රකට වන ස්වභාවය "**අප්පමාන**" ස්වභාවය "**පරිත්තා පරිකර්ණ** "**ඕභාසය**" සමයේ මට "**පරිත්තවූ දිවස්වේ පරිතෝ දිවැසින් පරිත්තා** "**ඕභාසය හඳුනම් පරිත්ත**" දිවැසින් මෙතන දිවැස කියන වචනය අපි මේ වෙනකම්ම භාවිතා කල වචනය ඤාණය ඤාණ අඤ්ඤාණ කියන තැට එනව ඤාණන් නෙවෙයි ඤාණ අභිබවා යනව. ඤාණය කියන්නේ සිහියත් එක්ක එන එක මෙතන එහෙම දේකුත් නෙවෙයි මෙතන දිවැස් ස්වභාවයක් ඒ කියන්නේ මෙතන ඥාණ කියන තැනිනුත් එනව අපි දන්නව ප්‍රඥාව කිව්වේ, අපි දන්නව මෙක "**විඤ්ඤාණං භාවේ තබ්බං විඤ්ඤාණං පරිඤ්ඤායියං**" මහා ප්‍රඥාව කියන්නේ විඤ්ඤාණ මායාව සත්‍ය දකින එක එතකොට ඒක දැනෙන්නේ ඥාණයට. ඤාණස්ස අධිගමාය කියල අපි කිව්වනේ "**නිබ්බානස්ස සච්ච කිරියාය**" කියල යායුතු මාවත ලිපිනය පෙන්නුව එතකොට අපි පෙන්නුව මෙක ඤාණයටයි හසුවෙන්නේ කියල සිහියට අවධි වෙන්නේ කියල පෙන්නුව හැබැයි මේකේ අවසානය

මොකද වෙන්නේ මේ අනිමිත්ත සමාධියට එනකොට සිහියට ඤාණයට හසු වෙනව නේ දැන් මෙහෙම දෙයක් නැති බවට හසුවෙනවනේ සිහියට දැන් මෙතන අවසානයේදි සිහියට එහෙම දේකුත් නෑ කියල එහෙම දෙයක්වත් හම්බ වෙන්නේ නෑ ඒකයි මේක දිවැසට හසු වෙනව කියන්නේ ඒක ඥාණය ඇත්තටම ඤාණ අඤ්ඤා අඤ්ඤී කියල කියන්නේ අඤ්ඤා කියනව අඤ්ඤා කියන්නේ නිවන ඤාණ අඤ්ඤා කියන්නේ එවැනි කිසිම දෙයක් මුකුත් එහෙම දැනෙන ස්වභාවයක් මුකුත්ම කියන්න බැරි සිහියක් කියල එහෙමටත් ගන්න බැරි ස්වභාවයක් මේක අත්දකින්න ඕනි ලුණු වගේ. **මේ තමයි වටිනාම තැන** මේ ස්වභාවය තුළ උපක්ලේශ කියන කොට ඔබට අපි ඉස්සරහට පැහැදිලි කරන්නම් සියුම් උපක්ලේශ සියල්ලම දෙයක් වගේ දැනෙන ස්වභාවය තියෙනව මේ උපක්ලේශ පවතිනව අපේ මේ **"ලහුතා, මුදිතා, කම්‍යනතා"** කියල අපි කතා කරන **නිෂ්මන්තක රූප අයෂ්මන්තක රූප** කියන කොට ඔබ දන්නව එතකොට අධිෂ්මන්ත රූප කියන කොට ඔබ දන්නව එතකොට **වචී කම්මන්තා කාය කම්මන්තා කියන කොටත් ඔබ දන්නව එතකොට වචනය පවා රූප බවට, වචී කම්‍යනතා රූප කාය සම්‍යනතා රූප** එතකොට මොනවද මේ කියන්නේ ශබ්දයක පවා හිනාවෙන ශබ්දය නම්වූ තැනේ හිනාව එහෙම නැතිනම් ඒ ඉරියව් වල හිනාව පවා එතකොට අර මුණෙන් හිනාවෙන ස්වභාවය පවා ෂේක 75 ගැන කතා කරනවනේ පැවිදි ප්‍රව්‍රජ්ජාව තුළ අද ඒව හරියට බලන්නේ නැති නිසා තේරෙන්නේ නැති වෙයි ගොඩක් අයට. නමුත් ෂෙක 75 තියෙන්නේ නිවනට අනුගතව ඒ කියන්නේ ඔය කනකොට ආහාර වළදනකොට ඇවිදින කොට සක්මන් කරන කොට ඒ හැම තැනම ඒ උපක්ලේශයි පෙන්නුම් කරන්නේ ඒ උපක්ලේශය පෙන්නුම් කරන ආකාර

තියෙනව. ඒ එ උපක්ලේශ තියෙනව කියන්නෙම අවධිය නෑ කියන එකයි හැබැයි අවධිය මතු වෙනකොට ඒ ස්වභාවය තුළ අර ස්වභාවවල ලොකු වෙනසකුත් පත්වෙනව ඒ කියන්නේ ශ්‍රාසවීය ස්වභාවය දිට්ඨආසව, කාමාසව, භවාසව අපි දන්නවනේ කාමසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසව ඒ ආශ්‍රව පරිවර්තනයකට ලක් වෙනව ඇත්තටම මෙතන තව ලොකු පැහැදිලි කිරීමක් කරන්න තියෙනව කාරණා ඉතින් ඔබට මේ ඔක්කොම ඉස්මතු වෙලා එද්දි ඔබට තේරෙයි මොනවද උපක්ලේශ කොහොමද උපක්ලේශවලින් මිදෙන්නේ ඇත්තටම මේ ඉතාම වැදගත් මේ දේශනාව අති දුර්ලභයි කවුරුත් දේශනා කරන්නේ නැති ඒව කව්රුවත් නොකියන ඒව මේ තුළ ඔබට ග්‍රන්ථධූරය තුළ නොලියවුණ ඒ විදර්ශනා ධූරය මතු කරල දෙන එක තමයි අපගේ පරම යුතුකම වගකීම වෙන්නේ ඉතින් අපගේ හුස්ම කොයි මොහොතක හෝ යයි ඊට කලින් ඔබ මේ එක මොහොතක් හරි අසා තිබ්බොත් ඔබට මේක දැණුමට හරි එක දවසක් හරි හෙට උපදින දරුවෙකුට හරි දායාදයක් වෙයි.

ඇත්තටම සැබෑම සියලු කෙලෙස් නසන්න මෙන්න මෙයයි ඉවහල් වෙන්නේ කියල ඔබට මෙය අනිවාර්යෙන්ම ප්‍රත්‍යක්‍ෂතාවයට හැකි වේවි. ඉතින් ඒ වෙනුවෙන් තමයි මේ ඉදිරිපත් කිරීම් කරන්නේ එතකොට බුදුන්වහන්සේ මේ දිවැස කියල දිවැසින් දකින තැන එන්නේ මෙතනයි. ඒ දිවැස එන්නේ මෙන්න මෙතනයි ඔබ හිතනව වගේ මේ ලෞකික භූමිය වගේ අමුතු කතාවක් නොවේ මෙතන මේ සියල්ලෙන් මිදුණු ස්වභාවයයි දිවැස කියන්නේ ඒ දිවැසින් දකිනව කියන්නේ ඒකයි. එතකොට මෙම **පරිත්තෝ** දිවැසින් **පරින්තෙර** ඕභාසය හඳුනමි. **පරින්ත** රූපය දකිමි **පරිත්ත** **රූපය** සාමාන්‍යයෙන් දකිනව ආරම්මණය සාමාන්‍ය විදියට

දකිනව එතකොට ඒ දකින එකට අදාළ ඉන් මිදුණු අවධියක් මතු වෙනව ඒ දිවැසටයි හසුවන්නේ දිවැස කියන්නේ ඒ අවධිය මතුවීමයි වෙන මුකුත් සිහියක් එතනදී අර ඥාණ කියන පැත්තෙන්වත් කතා කරන්න බැරි ස්වභාවයක් අප්‍රමාණ වූ දිවැසින් අප්‍රමාණ වූ "ඕභාසය" හඳුනමි අප්‍රමාණ වූ රූපය දකිමි.

අන්න දැන් සාමන්‍ය විදියට දකිනව, සාමාන්‍ය විදියට ඇහෙනව, සාමාන්‍ය විදියට දැනෙනව, වෙනද විදියටම හිටියත් ඒ හැම දේකින්ම මිදුණු අවධියක් මතු වෙනව ඒ අවධිමත් ස්වභාවය තමයි අනිමිත්ත සමාධිය තුළ ඒ මොහොතට අවධිය කියන්නේ අනිමිත්ත සමාධිය කියන්නේ සියල්ලෙන්ම මිදුණු ස්වභාවයයි ඒ අත්දැකීමම දිවැසයි ඒ දිවැසට හසුවන කාරුණාවයි. එතකොට ඥාණ අභිබවා ගිය අඥ්ඥා කියන තැනට දැන් අපි ඇවිල්ල ඉන්නව එතකොට මෙච්චර අපි දිගට පැහැදිලි කලේ ඥාණ කියන මට්ටමේ සිහියට හසුවෙනව කියන තැන එතන ඔබ අහන්න එපා අත්දැකිමක් ලැබෙන තාක් කල් ඔබට ඒක අත්දකිනතාක් කල් කියන්න ක්‍රමයක් නෑ දිවැසට හසු වෙනව කියන්නේ ඒ සිහිය නෙවෙයි ඒ ඔබගේ පරිවර්තනයයි මේ තමයි අන්තිමටම මේ මොහොතේ මේ දේශනය තුළ අපි පැහැදිලි කලා මේ අවසානෙට අපි මෙතනින් නවතමු.

නමුත් මේක සම්පූර්ණයෙන්ම ඔබට තවත් මේ උපක්ලේශ අපට පැහැදිලි කරන්න තියෙනව ඒක සමහර විට මේ ග්‍රන්ථධූරය අභිබවා යන පැහැදිලි කිරීම් ඉතාම වටිනව මේ පැහැදිලි කිරීම් සමාජයට අවධි වෙලා නෑ. සති නිමත්ත වඩල සති සමාධියත් උපක්ලේශයක් වෙනව. විදර්ශනා සමාධි සදහා කියන එකත් එතකොට ඒක අවශ්‍යයි වැදගත් කමක්

තියෙනව නැත්තේ නෑ හිත විසිරෙන්නේ නැතිව තිබුණොත් ඒකාග්‍රතාවය අර මෙතනදී සවිතක්ක සවිචාර මනසිකාර සත්‍ය දකින්නේ යථාභූත ඥාණය වැදගත් වෙනව. හැබැයි ඒකත් අපට අතහරින්න තියෙනව කියන එකයි මේකේ තේරුම ඒ කියන්නේ සති සමාධිය නෙවෙයි නිවන කියන එක විදර්ශණා සමාධිය. එහෙනම් ඒ විදර්ශනා සමාධියටයි මේ ඔබ අවධි කරන්න අපගේ අභිප්‍රාය ඉතින් හොඳයි එහෙම නම් අපගේ යුතුකම අපගේ වගකීම වෙන්නේ සත්‍ය යමක් අත්දකිනව නම් එය අපි දැක්කා දැක්කා කියන එක නෙවෙයි ඒ කොහොමද කෙසේද වෙන්නේ කියන එක එක ආකාරයට ඔබට මග පෙන්වල ඔබ ඒ තුළ ගමන් කරල ඔබ සසර දුකින් මිදෙනව නම් විතරයි. මෙය වැදගත් වෙන්නේ අපගේ එල ඒව මේව කිසිවක් වැදගත් නෑ. මොකද එය එසේය එහෙනම් වැදගත් වෙන්නේ ඔබට ඔබ සියලු දුකින් මිදෙන එකයි. ඔබට මල් තිය තිය වැඳ වැඳ යන ප්ලාස්ටික් රූපයක් තිබ්බට වැඩක් නෑ. ඔබ සසර දුකින් මිදෙන එකයි වැදගත් වෙන්නේ. ඉතින් අපි රූපයක් හොයල රූපයක් හදාගෙන කෙනෙක් හොයාගෙන කෙනෙක් හදාගෙන නිකං නලුවෙක් හදලා වැඩක් නෑ. අපිට ඕන මාර්ගය අපිට ඕන මාර්ගය විවර කරගෙන සසර දුකින් මිදෙන්නයි. එහෙනම් ඔබ පුද්ගල සරණ යාමෙන් එලක් නෑ කිව්වේ ඒකයි. බුදුන්වහන්සේ පුද්ගල සරණ යාම නොකලෙත් ඔන්න ඔය නිසයි. එතනත් උපක්ලේශයක් සිද්ධවෙනව කෙලෙස්මයි කියෙන්නේ ඔය කොතනක බැලුවත් ඔබ ඉන්නේ කෙලේසයකයි ඒ සියලු කෙලෙස් සංසිදෙන්න ඔබ ඒ සංසිදෙන නිර්මල පිවිතුරු මාර්ගය හදුනාගත යුතුයි. ඒ වෙනුවෙන් තමයි මේ සියල්ල ඉදිරිපත් කරන්නේ ඔබට මෙය නිවනට උපනිස්ශ්‍රය වෙන්න එය හේතු වේවි. හැමෝම ඒ නිවන් මග විවර කර ගන්න

මේ යුගයේ මහා පහන් ආලොකයක් බවට මේ බුද්ධෝත්පාද නාලිකාව පත්වේවි. මේ සැබෑම බුද්ධ ස්වභාවයට අවධිවන ආකාරයයි, මෙයයි ඔබ අත්දකින්නේ. ටිකෙන් ටික ඔබ එය අත්දකින බව අපි දන්නව ඔබ ඒ කරා පැමිණෙන බව දන්නව. ඉතින් ඔබට අපි බොහොම පිං ඔබ හොදයි එයයි විය යුත්තේ සාධු සාධු කියල කියනව. ඒකයි වෙන්න ඕනි මහණෙනි එයයි විය යුත්තේ සාධු සාධු මහණෙනි එයයි විය යුත්තේ කියල බුදුන්වහන්සේ දේශනා කරනව. එහෙනම් ඔබ මේ මග පැමිණෙන්න ඔබ ඔය සියලු කටයුතු කරන එක ගැටලුවක් නොවේ. ඔබ මේ ධර්මය දන්නේ නැති කමයි ගැටලුව වෙලා තියෙන්නේ ඔබ ඒ ධර්මය හොඳින් හඳුනාගෙන හොඳින් ශ්‍රවණය කරන්න ඔබට එය යම් මොහොතක් පැමිණෙවි සියලු දුකින් මිදෙන්න හේතු වේවි. ඔබ සසර දුකේ නැවත වැටෙන්නේ නෑ කියන සම්බෝධි පරායනය වෙනව. මේ බුද්ධොත්පාද නාලිකාවේ හැම වචනයක්ම නියත සම්බෝධි පරායනය කරාම ගෙන යන වචනයක්මයි. හැමෝටම යහපතක් වේවා. තෙරුවන් සරණයි.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය

ගිණුම් අංක : 106161005988

බැංකුව : සම්පත් බැංකුව / ශාඛාව : බත්තරමුල්ල

ගිණුම් අංක : 100800597511

බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව / ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඤාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend, volume 1
12. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
13. ආර්ය කමටහන්
14. ලොවම දෙදරයි
15. සූත්‍ර දේශනා - 01